संस्कृतभाषा

සංස්කෘත භාෂාව

05

පස්වැනි ශ්‍රේණිය

මූලික පිරිවෙන

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ප්‍රථම මුද්‍රණය - 2017
දෙවැනි මුද්‍රණය - 2018
තෙවන මුද්‍රණය - 2019

සියලු හිමිකම් ඇවිරිණි.

ISBN 978-955-25-0463-1

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
නො. 44, උඩහමුල්ල දුම්රියපළ පාර, ගංගොඩවිල, නුගේගොඩ
දරන ස්ථානයේ පිහිටි,
නියෝ ග්‍රැෆික්ස් (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත්කරන ලදි.

ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා

ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා

අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා

පිළිගනු මැන අප භක්ති පූජා

නමෝ නමෝ මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

ඔබ වේ අප විද්‍යා ඔබ ම ය අප සත්‍යා

ඔබ වේ අප ශක්ති අප හද තුළ භක්ති

ඔබ අප ආලෝකේ අපගේ අනුප්‍රාණේ

ඔබ අප ජීවන වේ අප මුක්තිය ඔබ වේ

නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා

ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා

එක මවකගෙ දරු කැල බැවිනා

යමු යමු වී නොපමා

ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය

පිරිවෙන් මගින් ගිහි පැවිදි දෙපක්ෂයට ම භාෂා, ආගමික හා සාරධර්ම අධ්‍යාපනය ලබා දීම චිරාත් කාලයක සිට පැවත ආ බැවින්, පිරිවෙන යනු ශ්‍රී ලාංකික අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය බවට පත් විය. එය දේශීය ගිහි පැවිදි ශිෂ්‍ය පරම්පරාව පමණක් නොව විදේශීය විද්‍යාර්ථීන් ද ඥානනය කළ විශ්වවිද්‍යාලයක් බඳු ස්ථානයක් විය. එක් එක් යුගයේ අවශ්‍යතා අනුව සකස් වූ විෂයමාලාවක් පිරිවෙන් අධ්‍යාපනය මඟින් සිසුන් වෙත ප්‍රදානය කරනු ලැබිණි. එබැවින් ම එවැනි අධ්‍යාපන මධ්‍යස්ථාන විශ්ව සම්භාවනාවට පත් විය.

විදේශීය ආක්‍රමණ හමුවේ - විශේෂයෙන් ම පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ආක්‍රමණ හමුවේ - පිරිවෙන් අධ්‍යාපනය ගුණාත්මක වශයෙන් හීන වී ගිය බව සැබෑ ය. එහෙත් 1753 දී ශ්‍රී ලංකාවේ මහණ උපසම්පදාව යළි පිහිටුවීමට ක්‍රියාකළ අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ කැපවීම මත පිරිවෙන නැමැති අධ්‍යාපන ආයතනය ශීඝ්‍ර දියුණුවකට පත් ව දෙස් විදෙස් කීර්තියට පත්වීම අප ලැබූ ජයග්‍රහණයකි.

අනෙකුත් අධ්‍යාපන ක්ෂේත්‍රවලට මෙන් ම පිරිවෙන් අධ්‍යාපනයට ද නිදහස් අධ්‍යාපන සංකල්පය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම අර්ථවත් කිරීම අපගේ පරම අපේක්ෂාවයි. පිරිවෙන් පෙළපොත් නොමිලයේ සැපයීමෙන් රජය ඉහළ වැයක් දරුව ද එමගින් සමස්ත ජනතාවගේ විනය, සදාචාරය හා යහපැවැත්ම පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව වෙතින් ඉටු වනු ඇතැයි උදක් ම අපේක්ෂා ඇති ව මෙම පොත ඔබ අතට පත් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකන අතර මෙම පොත පරිහරණය කිරීමෙන් ගිහි පැවිදි දෙපාර්ශ්වයට ම අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නැණ ගුණ දියුණු වේවායි ද පතමි.



අකිල විරාජ් කාරියවසම්

අධ්‍යාපන අමාත්‍ය

පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය

සම්භාව්‍ය අධ්‍යාපනයේ සුවිශේෂී සලකුණ පිරිවෙන් අධ්‍යාපනයයි. ථෙරවාදී සම්ප්‍රදාය කේන්ද්‍ර කරගත් විෂයමාලාව, පුළුල් විෂය ක්ෂේත්‍ර කරා ව්‍යාප්තව ඇත. ලාංකේය සමාජීය අවශ්‍යතා ඉටුකරනු වස් පිරිවෙන් අධ්‍යාපනය ද නව මාන ඔස්සේ සමාජය ආකර්ෂණය කරගෙන සිටියි. පිරිවෙන් අධ්‍යාපනය මඟින් ඉටු කළ යුත්තේ සමාජ අවශ්‍යතා ය. සමාජ අවශ්‍යතා වෙනස් වන විට පිරිවෙන ද, විෂයමාලාව ද, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම හා ඇගයීම් ඇතුළු පිරිවෙනේ සමස්ත ක්‍රියාවලිය ද අනන්‍යතාව සුරැකෙන අයුරින් වෙනස් විය යුතු ය. එය සමාජයට සම්ප්‍රේෂණය විය යුතු ය. පිරිවෙන් අධ්‍යාපනයෙහි ශාසනික සම්ප්‍රදායන් රැකගනිමින් සසුනේ චිරස්ථිතිය සඳහා ඇවැසි පදනම ගොඩනැගිය යුතු ය.

වර්තමාන ගෝලීය ප්‍රවණතා හමුවේ හුදකලා වූ තැනක පිරිවෙන තිබිය යුතු නැත. විශ්වීය පුරවැසියකු නිර්මාණය කිරීමේ කාර්යයෙන් බැහැරවීමට පිරිවෙන් අධ්‍යාපනයට ද නොහැකි ය. එසේ විය යුතු ද නැත. සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදාය රැකගනිමින්, පිරිවෙන් අධ්‍යාපනය යාවත්කාලීන කිරීම උදෙසා නව ඉගෙනුම් ක්‍රියාකාරකම්, ක්‍රම ශිල්ප හා තාක්ෂණික ක්‍රමවේද උපයෝගී කරගත යුතු අතර ඒවායින් බැහැර වීම සිදු නොවිය යුතු ය.

නිපුණතා පාදක විෂයමාලා ප්‍රතිසංස්කරණය අනුව මෙම පෙළ පොත ද සම්පාදනය කර ඇත. පිරිපුන් සමාජයක් ගොඩනැගීම සඳහා ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමවේද මඟින් නූතන ලෝකයේ ශීඝ්‍ර ලෙස ප්‍රසාරණය වන දැනුම යාවත්කාලීන කිරීමට උනන්දු විය යුතු ය. හුදෙක් ම අධ්‍යාපනය යනු ආර්ථික සංවර්ධනය සඳහා ම සීමා වූවක් නොවේ. එය දැනුම් ආර්ථිකයක් පදනම් කරගත් සංකල්ප ඔස්සේ ගමන් කරන ආධ්‍යාත්මික සංවර්ධනයෙන් සතුටු වන පුරවැසියකු නිර්මාණය කිරීමට ද ඉවහල් කොට ගත යුතු ය.

ශිෂ්‍ය මිතුරු ඉගෙනුම් ක්‍රියාවලිය අනුව සකස් කර ඇති මෙම පෙළ පොත ඔබට මාර්ගෝපදේශයකි. එය යළි භාවිත කළ හැකි අයුරින් පරිශීලනය කිරීම ඔබගේ යුතුකමක් මෙන් ම වගකීමකි.

විජිත වෙලගෙදර
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

පෙරවදන

ශ්‍රී ලංකාවේ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා බුද්ධිමත් ගුණවත් භික්ෂු භික්ෂුණී පරපුරක් මෙන් ම ධර්මානුධර්ම පටිපන්න උවසු උවැසියන් පිරිසක් ද සිටිය යුතු ය. ඒ සඳහා මැනවින් අධ්‍යාපනය ලබා ශික්ෂණය විය යුතු ය. ශික්ෂිත පුරවැසියා ලෝකයට සම්පතකි. පිරිවෙන් අධ්‍යාපනයෙන් ලබන දැනුම පමණක් නොව භාවනා ක්‍රම පුහුණු වීම ආදියෙන් ලබන මානසික සංවර්ධනය, මිනිස් ජීවිතයේ ලැබිය හැකි ලෞකික හා ලෝකෝත්තර සියලු පුරුෂාර්ථ සාධනය කිරීමෙහිලා පිටිවහලකි.

ත්‍රිවිධ ශාසනයේ ගැඹුර හා එහි අනෙක්විධ විටිනාකම් පිළිබඳ ලබන අවබෝධය අතිශය වැදගත් වේ. අප හමුවේ ඇති අනාගත අභියෝග සාර්ථකව ජයග්‍රහණය කරනු වස් ඒ සඳහා අවැසි දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කරගත යුතු ය. ලෝකයේ විශිෂ්ටතම දාර්ශනික වූත් ඓතිහාසික වූත් ජීවන රටාවක හිමිකම අපට ඇත. පිරිපුන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙන් අධ්‍යාපනයේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාර්යක්ෂමව ඵලදායී අයුරින් කටයුතු කළ යුතු ය. විශ්වීය පුරවැසියකු ලෙස ඔබගේ උත්සාහය, කැපවීම හා අධිෂ්ඨානශීලීව කටයුතු කිරීම, තිරසර සංවර්ධනයට ද රුකුලකි.

මෙම පොත සම්පාදනය කිරීම සඳහා කටයුතු කළ ලේඛක හා සංස්කාරක මණ්ඩලයේ සියලු දෙනාටත් පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාව හිමිවේ.

ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක,
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය, බත්තරමුල්ල.
2019.04.10

නියාමනය හා අධීක්ෂණය :-

ඩබ්ලිව්.එම්. ජයන්ත වික්‍රමනායක	- අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

මෙහෙයවීම :-

විජිත වෙලගෙදර	- අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) අධ්‍යාපන අමාත්‍යාංශය
ඩබ්ලිව්.ඒ. නිර්මලා පියසීලි	- අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

උපදේශකත්වය :-

පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි	- මහාචාර්ය සංස්කෘත අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය

සම්බන්ධීකරණය :-

පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි	- සංස්කෘත භාෂා විෂය උපදේශක (පිරිවෙන්) අධ්‍යාපන අමාත්‍යාංශය
ඩී.එම්.ජේ. පුෂ්පකුමාර	- නියෝජ්‍ය කොමසාරිස් (පාලන) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ප්‍රදීප් ඉඳුනිල් පියරත්න	- සහකාර කොමසාරිස් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සංස්කරණය :-

කේ.බී. ජයවර්ධන	- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සංස්කෘත අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

ලේඛක මණ්ඩලය :-

පූජ්‍ය බෝදාවල පියභාරති හිමි (සභාපති)	- හිටපු සහකාර කථිකාචාර්ය සංස්කෘත අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
පූජ්‍ය බණ්ඩාරවෙල සාරද හිමි	- පරිවේණාධිපති ගම්/විද්‍යාශේඛර මහ පිරිවෙණ බැණ්ඩියමුල්ල, ගම්පහ
පූජ්‍ය අබේසේකරගම විජිත හිමි	- පරිවේණාධිපති ගා/ශ්‍රී රේවත විද්‍යායතන පිරිවෙණ කුඹල්වැල්ල, ගාල්ල
ඩබ්. ලසන්ත කුමාර	- පරිවේණාචාර්ය ගම්/පද්මාවතී මහ පිරිවෙණ කෑරගල, හේනේගම

පූජ්‍ය උඩවෙල රේවත හිමි (ගරු සහභාගීත්වය)	- කථිකාචාර්ය සංස්කෘත අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි (ගරු සහභාගීත්වය)	- සංස්කෘත භාෂා විෂය උපදේශක (පිරිවෙන්) අධ්‍යාපන අමාත්‍යාංශය
පූජ්‍ය රූපහ ඤාණරතන හිමි (ගරු සහභාගීත්වය)	- පරිවේණාචාර්ය ගම්/සාසනවර්ධන මූලික පිරිවෙණ මීරිගම
පූජ්‍ය මල්අස්නේ තිලකවංශ හිමි (ගරු සහභාගීත්වය)	- පරිවේණාචාර්ය ගම්/ශ්‍රී සුමංගල මහ පිරිවෙණ වලලියද්ද, එල්ලක්කලන
ඩී.ජී. සුනිල් (ගරු සහභාගීත්වය)	- පරිවේණාචාර්ය ගා/ශ්‍රී විජයානන්ද පිරිවෙණ හබරකඩ

සෝදුපත් කියවීම :-

කේ.බී. ජයවර්ධන	- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සංස්කෘත අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

පිටු නිර්මාණය සහ පිට කවරය :-

ක්‍රිෂ්නි සමුද්ධිකා නවරත්නගේ	- පරිගණක අංශය අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පරිගණකගත කිරීම :-

පූජ්‍ය බෝදාවල පියභාරති හිමි	- හිටපු සහකාර කථිකාචාර්ය සංස්කෘත අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
පූජ්‍ය උඩවෙල රේවත හිමි	- කථිකාචාර්ය සංස්කෘත අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි	- සංස්කෘත භාෂා විෂය උපදේශක (පිරිවෙන්) අධ්‍යාපන අමාත්‍යාංශය
පූජ්‍ය නෙල්ලිවල සිරිනන්ද හිමි	- පරිවේණාචාර්ය ගම්/ශ්‍රී සුදර්ශන ධර්මායතන මූලික පිරිවෙණ තිඹිරිගම, කිරිඳිවැල
ක්‍රිෂ්නි සමුද්ධිකා නවරත්නගේ	- පරිගණක අංශය අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

विषयानुक्रमणिका।

०१.	अमृतवाणी संस्कृतभाषा। (वर्णोच्चारणविधिः।)	01
०२.	विद्या धर्मेण शोभते। (कारकपरिचयः। ०१)	11
०३.	ऋते ज्ञानात् न मुक्तिः। (कारकपरिचयः। ०२)	29
०४.	सर्वे भवन्तु सुखिनः। (क्रियापदपरिचयः। ०१)	50
०५.	रात्रिर्गमिष्यति भविष्यति सुप्रभातम्। (क्रियापदपरिचयः। ०२)	61
०६.	उदारचरितानां तु वसुधैव कुटुम्बकम्। (सन्धिपरिचयः। ०१)	72
०७.	यत्ने कृते यदि न सिध्यति कोऽत्र दोषः। (सन्धिपरिचयः। ०२)	77
०८.	प्रारब्धमुत्तमजना न परित्यजन्ति। (समासपरिचयः।)	87
०९.	जननी जन्मभूमिश्च स्वर्गादपि गरीयसी। (तद्धितपरिचयः। ०१)	95
१०.	चक्रवत् परिवर्तन्ते दुःखानि च सुखानि च। (तद्धितपरिचयः। ०२)	106
११.	गच्छन् पिपीलिको याति योजनानां शतान्यपि। (कृदन्तपरिचयः।)	113
१२.	गतः कालो न चायाति। (कृदन्तपरिचयः ०२)	125

१३.	वयं मिलित्वा वाक्यानि रचयामः । (वाक्यनिर्माणपरिचयः । ०१)	137
१४.	तत्र कोऽपि सन्देहो नास्ति । (वाक्यनिर्माणपरिचयः । ०२)	151
१५.	सस्नेहं निमन्त्रयामि । (रचनापरिचयः । ०१)	155
१६.	अनभ्यासे विषं विद्या । (रचनापरिचयः । ०२)	164
१७.	कवयः किं न पश्यन्ति । (साहित्यज्ञानम् ।)	173

०१
प्रथमः पाठः।

अमृतवाणी संस्कृतभाषा।

(මිහිරි වදන් ඇති සංස්කෘත භාෂාව)

वर्णोच्चारणविधिः।

සංස්කෘත භාෂාව භාරතයේ දැනට පවතින පුරාණතම ව්‍යවහාරික භාෂාවකි. විධිමත් ව සකස්කරගත් භාෂාවක් වන බැවින් ඊට ''**සංස්කෘත**'' යන නම භාවිත කෙරේ. ''**දෛවීභාෂා**''යන අපර නාමයෙන් ද හඳුන්වනු ලබන මෙම භාෂාව **ශුද්ධ භාෂාවක්, සාංස්කෘතික භාෂාවක්, ධාර්මික භාෂාවක්, ඓතිහාසික භාෂාවක්, සාහිත්‍යයික භාෂාවක්, වෛඥානික භාෂාවක්, ප්‍රභාවොත්පාදක භාෂාවක් හා විශ්වභාෂාවක්** හැටියට සුප්‍රසිද්ධ ය. සංස්කෘත භාෂාව ලියා දැක්වීම සඳහා භාවිත කරන්නේ **දේවනාගරී අක්‍ෂරමාලාව යි.** අක්ෂරමාලාව යනු **දෘශ්‍ය සංකේතාවලියකි.** කථා කිරීමේ දී මුවින් නිකුත් වන ශබ්ද ලියා දක්වන දෘෂ්ටිගෝචර සංකේත, **අක්‍ෂර** හෙවත් **අකුරු** නමින් හැඳින්වේ.

සංස්කෘත භාෂාවේ සියලු අක්‍ෂර හතළිස් නවය (49) කි. එම අක්‍ෂරමාලාව **ස්වර** හා **ව්‍යඤ්ජන** වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. ස්වර දාහතර (14) කි. ව්‍යඤ්ජන තිස්පහ (35) කි. පහතින් දැක්වෙන්නේ ඔබ මීට පෙර උගත් සංස්කෘත වර්ණමාලාවේ බෙදීම් ඇතුළත් සටහන් කිහිපයකි.

ස්වර 14

වෙනත් අක්‍ෂරයක උපකාරයක් නොමැති ව තනි ව උසුරුවනු ලබන අකුරු **ස්වරාක්‍ෂර** නම් වේ.

<table>
<tr><td>ස්වර 14</td><td>अ</td><td>आ</td><td>इ</td><td>ई</td><td>उ</td><td>ऊ</td><td>ऋ</td><td>ॠ</td><td>ऌ</td><td>ॡ</td><td>ए</td><td>ऐ</td><td>ओ</td><td>औ</td></tr>
<tr><td>හ්‍රස්ව 05</td><td>अ</td><td>इ</td><td>उ</td><td>ऋ</td><td>ऌ</td><td colspan="9"></td></tr>
<tr><td>දීර්ඝ 09</td><td>आ</td><td>ई</td><td>ऊ</td><td>ॠ</td><td>ॡ</td><td>ए</td><td>ऐ</td><td>ओ</td><td>औ</td><td colspan="5"></td></tr>
<tr><td>ප්ලුත</td><td colspan="14">මාත්‍රා තුනක උච්චාරණ කාලයක් ගත වන්නා වූ හඬ ප්ලුත නම් වේ. ගායනය, හැඬීම, දුර සිටින අයෙකුට අඬ ගැසීම හා විචාරය ආදි අවස්ථාවල දී අකුරු ප්ලුත ව කියවේ. වචන අවසානයේ ඇදී කියවීම ප්ලුත ස්වභාවය යි. ප්ලුතය ලියා දැක්වීමට නොහැකි ය.</td></tr>
<tr><td>සන්ධ්‍යක්‍ෂර 04</td><td>ए</td><td>ऐ</td><td>ओ</td><td>औ</td><td colspan="10"></td></tr>
<tr><td>නාමින් / අනාමින්</td><td colspan="14">අක්‍ෂරමාලාවේ अ, आ දෙක අනාමින් වන අතර අනෙක් සියලු ම ස්වර නාමින් නම් වේ.</td></tr>
<tr><td>සමාන / සවර්ණ</td><td colspan="14">अ इ उ ऋ ऌ යන අකුරු පහ ලිවීමේ භේද වශයෙන් හා උච්චාරණ කාල වශයෙන් සමාන බැවින් සමාන / සවර්ණ නම් වේ.</td></tr>
</table>

ව්‍යඤ්ජන 35

ස්වරාක්ෂරයන්ගේ උපකාරයක් නොමැති ව තනි ව උච්චාරණය කළ නොහැකි වර්ණ සමූහය **ව්‍යඤ්ජන** නම් වේ.
(ස්වර සංයුක්ත ව්‍යඤ්ජන)

कवर्ग	क	ख	ग	घ	ङ
चवर्ग	च	छ	ज	झ	ञ
टवर्ग	ट	ठ	ड	ढ	ण
तवर्ग	त	थ	द	ध	न
पवर्ग	प	फ	ब	भ	म
अन्तःस्थ	य	व	र	ल	
ऊष्मन्	श	ष	स	ह	
अनुस्वार	अं				
विसर्ग	अः				

स्वराः		व्यञ्जनानि									
		अघोषशब्दाः		घोषशब्दाः							अघोषशब्दाः
		वर्गाक्षराः									
ह्रस्वस्वर	दीर्घस्वर	अल्पप्राण	महाप्राण	अल्पप्राण	महाप्राण	वर्गान्त्य नासिक्य	अन्तःस्थ अर्धस्वर	ऊष्माक्षर	अनुस्वार	विसर्ग	ऊष्माक्षर
अ	आ	क	ख	ग	घ	ङ	य	ह	अँ	अः	श
इ	ई	च	छ	ज	झ	ञ	व				ष
उ	ऊ	ट	ठ	ड	ढ	ण	र				स
ऋ	ॠ	त	थ	द	ध	न	ल				
ऌ	ॡ	प	फ	ब	भ	म					
गुण	ए										
वृद्धि	ऐ										
गुण	ओ										
वृद्धि	औ										

ස්වර පරිණාම වගුව

සංස්කෘත භාෂාවේ ස්වරාක්ෂරයන්ගේ වර්ධන අවස්ථා පහත වගුවේ දැක්වේ. මෙම ස්වර පරිණාම වීම පිළිබඳ දැනුම සන්ධි කාර්යයේ දී වැදගත් වේ.

ह्रस्व	दीर्घ	गुण	वृद्धि	व्यस्थ	अर्धस्वर
अ	आ	×	आ	×	×
इ	ई	ए	ऐ [अय्] →	आय् →	य्
उ	ऊ	ओ	औ [अव्] →	आव् →	व्
ऋ	ॠ	अर्	आर् →	→	र्
ऌ	ॡ	अल्	आल् →	→	ल्

උච්චාරණ අවයව පද්ධතිය අනුව අක්ෂරයක හඬ නිපදවීම සඳහා ප්‍රධාන අවයව පහක් අතිශයින් ම උපකාරී වේ. මෙම ස්ථාන අක්ෂරෝත්පත්තිස්ථාන යනුවෙන් හඳුන්වයි.



१. कण्ठः

२. तालुः

३. मूर्धा

४. दन्ताः

५. ओष्ठौ

६. नासिका

कण्ठ्य	කණ්ඨය හෙවත් ගෙළ ඇසුරු කරගෙන උපදින ශබ්ද
तालव्य	තල්ල ඇසුරු කරගෙන උපදින ශබ්ද
मूर्धन्य	උඩුතල්ල ඇසුරු කරගෙන උපදින ශබ්ද
दन्त्य	දත් ඇසුරු කරගෙන උපදින ශබ්ද
ओष्ठ्य	දෙතොල් ඇසුරු කරගෙන උපදින ශබ්ද
नासिक्य	නාසය ඇසුරු කරගෙන උපදින ශබ්ද
कण्ठतालव्य	ගෙළ හා තල්ල ඇසුරු කරගෙන උපදින ශබ්ද
कण्ठौष्ठ्य	ගෙළ හා තොල් ඇසුරු කරගෙන උපදින ශබ්ද
दन्तौष्ठ्य	දත් හා දෙතොල් ඇසුරු කරගෙන උපදින ශබ්ද
अनुनासिका	නාසය ඇසුරු කොටගෙන උපදින ශබ්ද

සූත්‍රානුසාරයෙන් අක්ෂරෝත්පත්තිස්ථාන හදාරමු.

एकजाक्षर	अकुहविसर्जनीयानां कण्ठः	अ, आ, क, ख, ग, घ, ङ, ह, ः කණ්ඨජ අකුරු වේ.
	इचुयशानां तालु	इ, ई, च, छ, ज, झ, ञ, य, श තාලුජ අකුරු වේ.
	ऋटुरषाणां मूर्धा	ऋ, ॠ, ट, ठ, ड, ढ, ण, र, ष මූර්ධජ අකුරු නම් වේ.
	ऌतुलसानां दन्ताः	ऌ, ॡ, त, थ, द, ध, न, ल, स දන්තජ අකුරු වේ.
	उपूपध्मानीयानामोष्ठौ	उ, ऊ, प, फ, ब, भ, म ඕෂ්ඨජ අකුරු වේ.
द्विजाक्षर	एदैतोः कण्ठतालुः	ए ,ऐ කණ්ඨතාලුජ අකුරු වේ.
	ओदौतोः कण्ठौष्ठम्	ओ,औ කණ්ඨෞෂ්ඨජ අකුරු වේ.
	वकारस्य दन्तौष्ठम्	व දන්තෞෂ්ඨජ වේ.
	ङञणनमानां नासिका	ङ, ञ, ण, न, म යන අකුරු නාසික්‍ය වේ.
	जिह्वामूलीय - उपध्मानीय	ක, ඛ, දෙකට පෙරටුව සිටි ≍ ලකුණ ජිහ්වාමූලීය (≍ ක, ≍ ඛ,) හා ප, ඵ දෙකට මුලින් සිටි ≍ ලකුණ උපධ්මානීය (≍ ප, ≍ ඵ) නමින් හැඳින්වේ.

අප මෙතෙක් ඉගෙනගත් සංස්කෘත අක්ෂරමාලාවේ සියලු බෙදීම් පහත දක්වෙන පරිදි වගුගත කළ හැකි ය.

	स्वराः		व्यञ्जनानि									
			अघोषशब्दाः		घोषशब्दाः							अघोषशब्दाः
			वर्गाक्षराः									
	घोष											
	ह्रस्वस्वर	दीर्घस्वर	अल्पप्राण	महाप्राण	अल्पप्राण	महाप्राण	अल्पप्राण नासिक्य वर्गान्त	अन्तःस्थ अर्धस्वर	ऊष्मन्	अनुस्वार	विसर्ग	ऊष्मन्
कण्ठज	अ	आ	क	ख	ग	घ	ङ		ह	अँ	अ(ः)	
तालुज	इ	ई	च	छ	ज	झ	ञ	य				श
मूर्धज	उ	ऊ	ट	ठ	ड	ढ	ण	र				ष
दन्तज	ऋ	ॠ	त	थ	द	ध	न	ल				स
ओष्ठज	ऌ	ॡ	प	फ	ब	भ	म					
कण्ठतालु	ए											
		ऐ										
कण्ठौष्ठज		ओ										
		औ										
दन्तौष्ठज								व				

හලන්ත

क ක සිට **ह** හ දක්වා ඇති වර්ණ රාශිය ස්වරයක ආධාරයෙන් තොර ව උච්චාරණය කළ නොහැකි ය. ඉහත ඇත්තේ ස්වර සංයුක්ත ව්‍යඤ්ජන වර්ණ යි. ඒවායේ ශුද්ධ ස්වභාවය මෙපරිදි ය.

क् ख् ग् घ् ङ् - च् छ् ज् झ् ञ् - ट् ठ् ड् ढ् ण् - त् थ् द् ध् न्
प् फ् ब् भ् म् - य् र् ल् व् - श् ष् स् ह्

මෙම අක්ෂර සිංහල භාෂාවේ හැඳින්වෙන්නේ ''හල්'' අකුරු නමිනි. හල් කිරීමේ ලකුණ දේවනාගරීවල යෙදෙන්නේ අකුරුවලට යටිනි. ස්වර හා සංයෝග නොවූ මෙම ව්‍යඤ්ජන හලන්ත හෙවත් හල් අකුරු නමින් හැඳින්වේ.

01. ඔබ ඉහත ඉගෙන ගත් සංස්කෘත අක්ෂරමාලාව පහත වගුවට අනුව සකසන්න.

स्वराः					
ह्रस्वाः	दीर्घाः	गुणाः	वृद्धयः	नामिनः	सन्ध्यक्षराणि

02. ඔබ ඉහත ඉගෙන ගත් සංස්කෘත අක්ෂරමාලාව පහත වගුවට අනුව සකසන්න.

व्यञ्जनानि					
अल्पप्राणाः	महाप्राणाः	नासिक्याः	अन्तःस्थाः	ऊष्मन्	सन्ध्यक्षराणि

03. පහත භාජනයේ ඇති අක්ෂරවලින් ඝෝෂාක්ෂර හා අඝෝෂාක්ෂර වෙන්කර වෙන වෙන ම ලියා දක්වන්න.





අභ්‍යාසය 1.2

01. පහත අක්ෂර අතුරින් වර්ගාක්ෂර වෙන් කර ලියන්න.

ञ ओ य थ अ इ ऐ ग ऊ ऋ ई घ ङ श ब
ठ ख ह औ उ आ छ ऌ ए प त ट ळ र
द ड ज ढ ध भ न म च ॡ ष ण फ स क
व झ अँ अः

අභ්‍යාසය 1.3

01. පහත සඳහන් ඡේදය සිංහල අක්ෂර භාවිත කොට නිවැරදි ව ලියන්න.

अनृतभाषिणो मेषपालस्य ।

आसीदेकस्मिन् ग्रामे कश्चिन्मेषपालः। स कदाचित् सुदूरमनयत् स्वयूथम्। बहवो वृक्षास्तत्रासन् निबिडा च तेषां छाया। रविकिरणा अपि क्वचित् क्वचिदेव प्रवेशमलभन्त तस्मिन्स्थाने। मध्याह्नेऽपि सुशीतलं तत्स्थलम्। विपुलानि तृणपर्णानि निर्मलाश्च बहवो निर्झरा आसन् स्थाने स्थाने। तत्र कस्यचित्तरोर्मूले विश्रान्तिसुखमनुभवतस्तस्य यूनो मनसि समुत्पन्नः सहसैवैष विचारः। निर्जनमेतद्वनम्। यदि कश्चिदन्यपशुरत्रापतेत् तर्हि किं करिष्यामि। असहायोऽहमेतैर्मेषैः सह तस्य भक्ष्यमवश्यं भविष्यामि। परीक्षे तावद्यदि कोऽपि मानुषोऽत्र समीपे तिष्ठति न वेति। एवं सम्प्रधार्य भो भो वृक इहायातो वृक इहायात इत्युच्चैराक्रोशत् स युवा। एतच्छ्रुत्वा समीपस्थाः क्षेत्रपालाः शस्त्राण्यादाय तत्र प्राप्ताः सत्वरं साहाय्यार्थं तान् दृष्ट्वाप्रीतमनाः स मेषपालोऽवदत्। नात्र वृकः परं समीपे जनानां निवासो विद्यते न वेति ज्ञातुमेवाहं तथाऽक्रोशमिति। एतद्वचनं निशम्य यथागतं निवृत्तास्ते कृषीवलाः अन्येद्युस्तथैव विनोदार्थं स आक्रोशत्। पुनरपि शस्त्रपाणीन् जनानागतान् दृष्ट्वाऽसौ पर्यहसद् वृको नास्तीति चावदत्। इत्थं बहुवारं वञ्चितास्ते प्रातिवेशिकास्तेन मिथ्यावादिना।

अथैकस्मिन् दिने परमार्थत एकः तत्रायातः केचिद् वृका मेषाणां गन्धेनाकृष्टाः। तान्दृष्ट्वा भीतिग्रस्तः स युवा “वृका आयाता वृका आगता” इत्याक्रोशत्। यथापूर्वमुच्चैः समाह्वयच्च प्रातिवेश्यान्। परं तत्राद्य न यामो यतः स दुर्मतिरस्मान् वञ्चयति परिहसति चेति तैर्प्रातिवेशिकैर्मिथो निश्चितम्। अथ साहाय्यार्थमनागतेषु जनेषु वृकैर्भक्षिता बहवो मेषाः। स पालकोऽपि किञ्चित् पीडितः। एवमनृतभाषिणस्तस्य प्राप्तो दण्डः।

नासत्यवादिनः पुण्यं न सख्यं न यशो भुवि।
दृश्यते नापि कल्याणं कालकूटमिवाशन्तः॥

(अभिनवापाठावली)

අභ්‍යාසය 1.4

01. ඉහත සඳහන් කළ උත්පත්ති ස්ථානයන්ට අනුව පන්තියේ කණ්ඩායම් වශයෙන් ශබ්ද නගා අක්ෂරෝච්චාරණය කරන්න.

02. සංස්කෘත අක්ෂරමාලාව ආශ්‍රයෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

कण्ठजाः	
तालुजाः	
मूर्धजाः	
दन्तजाः	
ओष्ठजाः	
नासिक्याः	
कण्ठतालुजौ	
कण्ठौष्ठजौ	
दन्तौष्ठजः	

අභ්‍යාසය 1.5

01. පහත සඳහන් ප්‍රකාශනවල හිස්තැන්වලට සුදුසු පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. **म, क, थ, अ, ऌ, ग, ट, ह, द** යන අක්ෂරවලින් .... යන අක්ෂර කණ්ඨජ අක්ෂර වන අතර .... යන අක්ෂර දන්තජ අක්ෂර වේ.

ii. **ए , ऐ** .... අක්ෂර වන අතර **व** .... අක්ෂරයක් වේ.

iii. **ङ, ञ, ण, न, म** යන අක්ෂර .... අක්ෂර ලෙස හැඳින්වේ.

iv. දිවේ මුල කොටස උගුර දෙසට ළං වීමෙන් උපදින ශබ්ද.................... අක්ෂර ලෙස හැඳින්වේ.

v. ඕෂ්ඨජ අක්ෂර යනු .... උපදින අක්ෂර වේ.

vi. එක් ස්ථානයකින් උපදින අකුරු....................නමින් හඳුන්වන අතර ද්විජ අක්ෂර යනු .... උපදින අක්ෂර යි.

vii. වර්ගයන්ගේ පළමුවන දෙවන හා ශ, ෂ, ස යන අකුරු .... වන අතර මහත් වූ ශබ්දයකින් උච්චාරණය වන අකුරු .... නමින් හැඳින්වේ.

viii. ස්වර ස්වභාවයත්, ව්‍යඤ්ජන ස්වභාවයත් ඇති අකුරු .... නමින් හඳුන්වන අතර ඒවා .... යන අකුරු යි.

ix. වර්ගාන්ත අකුරු .... නමින් ද හඳුන්වයි.

x. වර්ගයන්ගේ පළමු අක්ෂර පහ .... නමින් ද හැඳින්වේ.

අභ්‍යාසය 1.6

01. පහත දක්වා ඇති සංස්කෘත අක්ෂරමාලාව උත්පත්ති ස්ථාන අනුව වර්ග කර ඉදිරියෙන් දක්වා ඇති කොටු තුළ ලියන්න.



अकालमेघवद्वित्तमकस्मादेति याति च।

ධනය අකල් වැස්සක් මෙනි. අහම්බෙන් මෙන් ලැබෙයි. එසේ ම නැතිවී යයි.

अक्षौभ्यतौ वमयतां महत्वस्य हि लक्षणम्।

නොකැලඹීම හා නොතැවීම උතුම් බවෙහි ලක්ෂණය යි.

अङ्कमारुह्यसुप्तं हि हत्वा किं नाम पौरुषम्।

උකුලේ නිදන්නා නසා කවර වීරත්වයක් ද?

०२
द्वितीयः पाठः ।

विद्या धर्मेण शोभते ।

(ඉගෙනුම දහමින් බැබළේ)

कारकपरिचयः । ०१

වාක්‍යයක භාවිත වන නාම හා ක්‍රියාවන් අතර සම්බන්ධය දැක්වීම කාරක නම් වේ. කිසියම් නාමයක් ආඛ්‍යාතය සමග කිසිදු සබඳතාවක් නොමැති නම් එහි කාරක ස්වභාවයක් නොමැත. **ක්‍රියා නිෂ්පත්තියට හේතුවීම, ක්‍රියාසිද්ධියට අතිශයින් උපකාරීවීම** යන අර්ථලාභය කාරක තුළ පවතී. **(ක්‍රියාසිද්ධ්‍යුපකාරකං කාරකම්)**

සංස්කෘත භාෂාවේ විභක්ති හතක් ඇත. සම්බෝධන (ආලපන) උපවිභක්තියකි. නාමයන් විවිධ අර්ථවලට බෙදීම එමගින් සිදු වේ. එබඳු ප්‍රත්‍ය විසිඑකකි. කාරක හා පවතින සම්බන්ධය පෙන්වීම සඳහා මෙම විභක්ති යොදා ගැනේ. ඉන් ප්‍රථමාවේ ම භේදයක් වන සම්බෝධන (ආලපන) හා ෂෂ්ඨී විභක්ති කාරක ගණයට නොගැනේ. ඒවායින් ක්‍රියාවකට උපකාරයක් නොලැබෙන බැවිනි. සෙසු විභක්ති හයට අදාළ කාරක හයකි.

1. කර්තෘ (ක්‍රියාව සිදුකිරීම් වශයෙන් සම්බන්ධ වේ)
2. කර්ම (ක්‍රියාර්ථයට යටත්වීම් වශයෙන් සම්බන්ධ වේ)
3. කරණ (ක්‍රියාවට සහාය වීම වශයෙන් සම්බන්ධ වේ)
4. සම්ප්‍රදාන (ක්‍රියාවේ ඵලය ලැබීම් වශයෙන් සම්බන්ධ වේ)
5. අපදාන (ක්‍රියාර්ථයට සීමාවීම් වශයෙන් සම්බන්ධ වේ)
6. අධිකරණ (සුදුසු පරිදි කර්තෘ හා කර්මයන් දැරීම් වශයෙන් සම්බන්ධ වේ)

ඇතැම් අවස්ථාවන්හි දී කාරකය වාක්‍යයක් ඇතුළත නාමයක විභක්තිය කුමක් විය යුතුදැයි යන්න පවා තීරණය කරයි.

උදාහරණ :-





■ පහත නිදර්ශන සාවධාන ව අධ්‍යයනය කරන්න.

- ශිෂ්‍යයා සැප කැමති වෙයි. छात्रः सुखम् इच्छति । (උක්තය ලෙස)
- ගුරුවරයා පොතක් කියවයි. आचार्यः पुस्तकं पठति । (කර්මය ලෙස)
- ශිෂ්‍යයා විසින් පොත හදාරනු ලැබේ. छात्रेण पुस्तकः पठ्यते । (කර්තෘ ලෙස)
- ගුරුවරයා ශිෂ්‍යයා නිසා සතුටු වෙයි. शिक्षकः छात्रेण तुष्यति । (කරණ ලෙස)
- ගුරුවරයා ශිෂ්‍යයාට තෑග්ගක් දෙයි. अध्यापकः छात्राय वितरणं ददाति । (සම්ප්‍රදාන ලෙස)
- නොදන්නාකම ශිෂ්‍යයාගෙන් බැහැරවෙයි. मूढत्वं छात्रात् बहिर्गच्छति । (අපාදාන ලෙස)
- ගුරුවරයා ශිෂ්‍යයා කෙරෙහි සෙනෙහස දක්වයි. गुरुः छात्रे स्निह्यति । (ආධාර ලෙස)

01. ප්‍රථමා විභක්තිය (කර්තෘකාරකය)

1. ලිඞ්ගාර්ථයෙහි ප්‍රථමාව යෙදේ.
2. උක්තාර්ථයෙහි ප්‍රථමාව යෙදේ.
3. සම්බෝධනයෙහි ප්‍රථමාව යෙදේ.

1. කර්ම හා කර්තෘ ආදි වෙනත් අවස්ථාවකට පත් නොවූ ශබ්ද ප්‍රකෘතීන් මෙහි ලිඞ්ගාර්ථ නම් වේ. ඒවා ප්‍රකාශ කළ යුතු කල්හි ප්‍රථමාවෙන් යොදනු ලැබේ.

नर - नरः

वनिता / ज्ञानम् / तटः / तटी / तटम् / कुलम् / एकः / द्वौ / बहवः

2. අවසාන ක්‍රියාවෙන් උක්ත වන නාමය ප්‍රථමා විභක්තිය ගනී. කර්තෘකාරක වාක්‍යයක කර්තෘ ද, කර්මකාරක වාක්‍යයක කර්මය ද ප්‍රථමා විභක්තියෙන් සිටී.

- उपासकः बुद्धं वन्दति। (උපාසකයා බුදුන් වඳියි)
- उपासकेन बुद्धः वन्द्यते। (උපාසකයා විසින් බුදුරජ වඳිනු ලැබේ)

3. ආමන්ත්‍රණයෙහි ද ප්‍රථමාව යෙදේ.

- गच्छ गच्छसि चेत् कान्त पन्थानः सन्तु ते शिवाः।
  (සොඳුර, ඉදින් ඔබ යන්නේනම් යන්න, ඔබේ ගමන්මග යහපත් වේවා!)
- हे देव, मां रक्ष। (පින්වත් දෙවිය, මා රකින්න)

අභ්‍යාසය 2.1

- नरः विदेशं गच्छति। (මිනිසා විදේශයට යයි)
- भूपालः सिंहासने तिष्ठति। (රජතුමා සිංහාසනයෙහි සිටියි)
- हे शिष्य, पुस्तकं पठ। (පින්වත් ශිෂ්‍යය, පොත පාඩම් කරන්න)
- धेनुः क्षीरं वितरति। (දෙන කිරි දෙයි)
- हे कन्ये, कूपं गच्छ। (පින්වත් කන්‍යාව, ළිඳට යව)

01. ඉහත සඳහන් වාක්‍යයන්හි ඇති උක්ත පද වෙන වෙන ම ලියා දක්වන්න.
02. ඉහත සඳහන් වාක්‍යවල ආලපන විභක්ති පද වෙන වෙන ම ලියා දක්වන්න.
03. ඉහත සඳහන් වාක්‍යවල පුරුෂලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග, නපුංසකලිඞ්ග වචන (ප්‍රථමා විභක්ති පද) වෙන වෙන ම වගුගත කරන්න.

පුරුෂලිඞ්ග	ස්ත්‍රීලිඞ්ග	නපුංසකලිඞ්ග

4. අව්‍යයන් හා යෙදීමේ දී ද ප්‍රථමාව වේ.

- महासेनो नाम राजा बभूव। (මහාසේන නම් රජකෙනෙක් සිටියේලු)

5. මාතෘකා, නාම පුවරු, ග්‍රන්ථනාම, කෝෂ ග්‍රන්ථ පද ආදිය ද ප්‍රථමාවෙන් ලියනු ලැබේ.

- श्री लङ्काद्वीपः।
- पुस्तकालयम्।
- महाकविकालिदासः।
- सर्वज्ञः सुगतो बुद्धो धर्मराजस्तथागतः।
- भदन्ताश्वघोषप्रणीतबुद्धचरितमहाकाव्यम्।

02. ද්විතීයා විභක්තිය (කර්මකාරකය)

1. කර්මාර්ථය

ද්විතීයා විභක්තිය කර්මාර්ථයෙහි යෙදේ. 'කර්මය' යනු කර්තෘගේ ක්‍රියාවට යටත්වන, ක්‍රියාවෙන් අතිශයින් ම අපේක්ෂා කරන පදය යි. කර්තෘකාරක වාක්‍යයක අනුක්ත කර්ම පදය ද්විතීයාවෙන් යෙදේ.

कर्तुरीप्सिततमं कर्म යනු සාරස්වත විග්‍රහය යි.

- पुरुषः वस्त्रं क्षालयति। (පුරුෂයා වස්ත්‍රය සෝදයි)
- वानरौ फले खादतः। (වඳුරෝ දෙදෙනා ගෙඩි දෙක කත්)
- मातरः दारकान् लालयति। (මව්වරු දරුවන් නළවති)

අභ්‍යාසය 2.2

01. පහත සඳහන් වගුවේ හිස්තැන් පුරවන්න.

ශබ්දමූලය	ද්විතීයා විභක්තිය		
	ඒකවචන	ද්විවචන	බහුවචන
मृग	मृगं	मृगौ	मृगान्
आहार		आहारे	आहाराणि
बुद्ध	बुद्धं	बुद्धौ	
दुग्ध	दुग्धं		दुग्धानि
श्वेतवस्त्र	श्वेतवस्त्रं		

2. අකථිත කර්මය

අකථිත කර්මය ද්විතීයාවෙන් සිටී. ද්විකර්මක ධාතු යෝගයෙහි ප්‍රධාන හා අප්‍රධාන වශයෙන් කර්ම පද දෙකක් පවතී. ඉන් අප්‍රධාන කර්මය අකථිත කර්මය යි.

- दरिद्रः प्रभुं धनं याचते। [प्रभुं - අප්‍රධාන කර්මය] (දිළින්දා ප්‍රභුවරයාගෙන් ධනය ඉල්ලයි)
- गां दोग्धि पयः। [गां - අප්‍රධාන කර්මය] (ගොපල්ලා දෙනගෙන් කිරි දොවයි)

ද්විකර්මක ධාතු දහසය

ධාතුව	ලට් ඒකවචන රූපය	අර්ථය
√ दुह्	दोग्धि	දොවයි
√ याच्	याचति	ඉල්ලයි
√ पच्	पचति	පිසයි
√ दण्ड्	दण्डयति	දඬුවම් කරයි
√ रुध्	रुणद्धि	ආවරණය කරයි
√ प्रछ्	पृच्छति	විමසයි
√ चि	चिनोति	රැස්කරයි
√ ब्रू	ब्रवीति	කියයි
√ शास्	शास्ति	අනුශාසනා කරයි
√ जि	जयति	දිනයි
√ मथ्	मथ्नाति	ඇලෙයි
√ मुष्	मुष्णाति	සොරකම් කරයි
√ नी	नयति	ගෙනයයි
√ हृ	हरति	ගෙනයයි
√ कृष्	कर्षति	සීසායි
√ वह्	वहति	උසුලයි

අභ්‍යාසය 2.3

- गोपालः गां क्षीरं दोग्धि। (ගොපල්ලා ගවයාගෙන් කිරි දොවයි)
- याचकः धनिकम् आहारं याचति। (යාචකයා ධනවතාගෙන් ආහාර ඉල්ලයි)
- गुरुः शिष्यं प्रत्युत्तरं पृच्छति। (ගුරුවරයා ශිෂ්‍යයාගෙන් පිළිතුරු විමසයි)
- सर्वज्ञः श्रावकान् धर्मं शास्ति। (බුදුරජ ශ්‍රාවකයන්ට දහම් අනුශාසනා කරයි)
- चोरः धनिकं भाण्डानि मुष्णाति । (සොරා ධනවතාගෙන් භාණ්ඩ සොරකම් කරයි)
- मालाकारः वृक्षं पुष्पाणि चिनोति। (මල්කරුවා ගසින් මල් කඩා රැස්කරයි)
- पिता पुत्रं गृहं नयति। (පියා පුත්‍රයා ගෙදර ගෙනයයි)

01. ඉහත වාක්‍යයන්හි ඇතුළත් ප්‍රධාන හා අප්‍රධාන කර්මපද වෙන වෙන ම ලියා දක්වන්න.

02. ද්විතීයා විභක්තියෙන් පද දෙකක් යෙදී ඇත්තේ කවර හේතූන් නිසා ද?

03. පහත වාක්‍යවල හිස්තැන්වලට සුදුසු වචන වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(वहति / अहं / अमात्यः / धनलाभं / वृक्षम् / स्वक्षेत्रं
गजः / धान्यानि / अजयत् / द्विसहस्रं / सहस्रं)

०१. मार्गारक्षकः सारथिम् .... मूल्यं दण्डयति।
०२. .... सेवकं वृक्षम् अवरुणद्धि।
०३. श्रामणेरः........................... आम्रफलं अवचिनोति।
०४. .... मित्रं सदुपदेशं ब्रवीमि।
०५. रामः रावणं सीतां...........................
०६. शत्रुः........................... जनहृदयान् मथ्नाति।
०७. वणिक्पुत्रः स्वगृहं........................... मूल्यानि नयति।
०८. कृषीवलः........................... बीजानि हरति।
०९. .... स्वशावकान् वनं नयति।
१०. अश्वः स्वस्कन्धं कुमारं...........................
११. सूदः...........................यागुं पचति।

3. අත්‍යන්ත සංයෝගය

යම් කාලයක හෝ ප්‍රදේශයක කඩවීමකින් තොර ව, ක්‍රියාවත් සමග නිතර සබඳතාව පවතින (අත්‍යන්ත සංයෝගී) කාලවාචී සහ මාර්ගවාචී ශබ්ද ද ද්විතීයා විභක්තියෙන් යෙදේ.

- **मासं** नृत्यं अधीते। [කාලවාචී] (මසක් මුළුල්ලේ නැටුම් හදාරයි)
- **क्रोशं** कुटिला नदी। [මාර්ගවාචී] (හඬ ඇසෙන දුරින් නදිය වක්‍ර ය)

අභ්‍යාසය 2.4

०१. तथागतः षड्वर्षं पूर्वारामे अवसत्।
०२. भोजः पञ्चाशत् पञ्चवर्षं राज्यमकरोत्।
०३. मासं व्याकरणं अधीते।
०४. बोधिसत्त्वः षड्वर्षं दुष्करक्रियायां अयुञ्जत्।
०५. विष्णुशर्मः षण्मासं पञ्चतन्त्रम् अकथयत्।

01. ඉහත වාක්‍යයන්හි ඇති ද්විතීයා විභක්තිපද ලියා දක්වන්න.

02. එම වචනවල අර්ථ ලියා දක්වන්න.

03. වරහන තුළින් සුදුසු පද තෝරාගෙන පහත වාක්‍ය සම්පූර්ණ කරන්න.

(द्विवर्षं / अवसत् / स्वसेवां / भोजराजः / त्रिंशद्वर्षं)

०१. आचार्यः पञ्चविंशतिवर्षं .... अकरोत्।
०२. लङ्कायां .... त्रस्तोपद्रवोऽभवत्।
०३. यतीन्द्रस्थविरः त्रैमासं विहारे एव .... ।
०४. सोमसारः .... द्वितीयकक्ष्यायां अपठत्।
०५. .... पञ्चाशत् पञ्चवर्षं गौडदेशाधिपतिः अभवत्।

4. උපසර්ග යෝගය

ඇතැම් උපසර්ග සමග ද ද්විතීයා විභක්තිය යෙදේ.

- सः बुद्धं प्रति भक्तः। (ඔහු බුදුන් කෙරෙහි භක්තිමත් වූයේ)
- लुब्दकः वृक्षं प्रति / परि / अनु सञ्चरति। (වැද්දා ගසක් පාසා ඇවිදියි)

අභ්‍යාසය 2.5

०१. विहारं अभि वृक्षछायां वर्तते।
०२. आलवकः बुद्धं परि भक्तः अभवत्।
०३. कसीभारद्वाजः बुद्धं प्रति आह।
०४. कृष्णः राधां अनु जीवितम्।
०५. चित्तं चित्तं प्रति क्षमा भवतु।

01. ඉහත වාක්‍යවල ඇති ද්විතීයා විභක්ති පද ලියා දක්වන්න.

02. එම වාක්‍යවල ඇති උපසර්ග ලියා දක්වන්න.

03. ඉහත වාක්‍ය සිංහලයට නගන්න.

5. නිපාත යෝගය

» अभितः (ඉදිරිපස) » परितः (හාත්පස)
» उभयतः (දෙපස) » सर्वतः (සෑම පස ම)
» निकषा (අසල) » समया (අසල)
» विना (හැර / නැති ව) » अन्तरेण (හැර)
» यावत् (යම්තාක්) » धिक् (නින්දා වේවා!)
» हा (අහෝ)

යන නිපාත යෝගයෙහි ද්විතීයා විභක්තිය වේ.

- राजानं अभितः मन्त्रिणः। (රජු ඉදිරිපස මන්ත්‍රීවරු වෙති)
- ग्रामं निकषा वनम्। (ගම අසල වනය යි)
- धिक् धनहीनं जीवितम्। (ධනහීන ජීවිතයට නින්දා වේවා!)
- आहारं विना कथं जीवति ? (ආහාර නොමැති ව කෙසේ ජීවත් වෙයි ද?)

අභ්‍යාසය 2.6

०१. अभितो विहारं उपासकः तिष्ठति।
०२. परितः संघावासं सोमसारः तिष्ठति।
०३. सर्वतः श्रीलङ्काद्वीपं महोदधिः भवति।
०४. उभयतो पथम् अटविं विद्यते।
०५. समया धेनुं वत्सः तिष्ठति।

01. ඉහත වාක්‍යවල ඇති ද්විතීයා විභක්ති පද ලියා දක්වන්න.

02. එම වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

03. වරහන තුළින් සුදුසු පද තෝරා පහත වාක්‍යයන්හි හිස්තැන් පුරවන්න.

(अधार्मिकम् / गुरुम् / धर्मम् / अङ्गनम् / मूर्खम्)

०१. निकषा .... उपासकः सम्मुखः।
०२. हा .... ।
०३. सः धिक् .... इति अवदत्।
०४. .... अन्तरेण कुतः शान्तिः।
०५. .... विना नास्ति पिता च माता।

6. ප්‍රයෝජ්‍ය ක්‍රියා අර්ථයෙහි

ප්‍රයෝජ්‍ය ක්‍රියා සමග ද ද්විතීයා විභක්තිය යෙදේ.

- गुरुः छात्रान् पाठयति । (ගුරුවරයා ශිෂ්‍යයා ලවා පාඩම් හදාරවයි)

අභ්‍යාසය 2.7

०१. जनाधिपतिः अमात्यं देशान्तरं प्रेषयति ।
०२. वैद्यः शिष्यं शयनम् आसयति ।
०३. माता पुत्रं क्षीरान्नं भोजयति ।
०४. गुत्तिलः मूषिलं वीणावादनम् अवेदयत् ।
०५. अङ्गुलिमालः नरान् परलोकम् अप्रेषयत् ।

01. ඉහත වාක්‍යවල ඇති ද්විතීයා විභක්ති පද ලියන්න.

02. මේ වාක්‍යයන්හි ඇති ප්‍රයෝජ්‍ය ක්‍රියාපද ලියා දක්වන්න.

03. ප්‍රයෝජ්‍යාර්ථවත් වාක්‍ය 05ක් තනන්න.

04. පහත සඳහන් ක්‍රියාපදවලට සුදුසු ප්‍රයෝජ්‍ය ක්‍රියා වරහන තුළින් තෝරා ලියන්න.

०१.	करोति	
०२.	वाचयति	
०३.	पठति	
०४.	लिखति	
०५.	वन्दति	

(कारयति / वन्दयति / लेखयति / वाचयति / पाठयति)

7. ක්‍රියා විශේෂණ සමග

ක්‍රියා විශේෂණය ද්විතීයා විභක්තිය ඇසුරු කරයි. ක්‍රියා විශේෂණ නපුංසකලිඞ්ග ද ඒකවචන ද වේ.

- मधुरं गायति बालिका । (ළදූරිය මිහිරි ලෙස ගයයි)
- शीघ्रं धावति युवकः । (තරුණයා වේගයෙන් දුවයි)
- मुनिः सुखं जीवति । (මුනිවරයා සැපසේ ජීවත් වෙයි)

සාරාංශය

ද්විතීයා විභක්තිය
1. කර්මාර්ථයෙහි ද,
2. ද්විකර්මක ධාතූන් සමග ද,
3. අත්‍යන්ත සංයෝගයෙහි ද,
4. උපසර්ග යෝගයෙහි ද,
5. නිපාත යෝගයෙහි ද,
6. ප්‍රයෝජ්‍ය ක්‍රියා යෝගයෙහි ද,
7. ක්‍රියාවිශේෂණ සමග ද යෙදේ.

03. තෘතීයා විභක්තිය (කරණාර්ථයෙහි)

01. කරණකාරකයෙහි

ක්‍රියා සම්පාදනයෙහි දී කර්තෘහට අතිශයින් අනුග්‍රහ දක්වනුයේ කරණය යි. එය තෘතීයා විභක්තිය ඇසුරු කරයි.

- छात्रः **रथेन** पाठालयम् गच्छति । (ශිෂ්‍යයා රථයෙන් පාසලට යයි)
- सा **लेखन्या** अक्षराणि लिखति । (ඇය පෑනෙන් අකුරු ලියයි)

- शकटं **चक्राभ्यां** याति । (කරත්තය රෝද දෙකෙන් යයි)
- अहं **चक्षुभ्यां** पश्यामि । (මම දෑසින් බලමි)

- नराः **गगनयानैः** देशान्तरं गच्छन्ति । (මිනිස්සු අහස් යානාවලින් විදේශයට යති)
- सैनिकाः **असिभिः** अरीन् प्रहरन्ति । (භටයෝ කඩුවලින් සතුරන්ට පහර දෙති)

අභ්‍යාසය 2.8

०१. अहं हस्तेन पत्रं लिखामि ।
०२. पथिकाः पादैः अनुराधपुरं गच्छन्ति ।
०३. ग्लानः औषधैः जीवति ।
०४. उडुपेन सागरम् तितीर्षुः अस्मि ।
०५. शुकाः धान्यैः शावकान् पोषयन्ति ।

01. ඉහත වාක්‍යවල ඇති තෘතීයා විභක්ති පද ලියන්න.

02. එම වචනවල අර්ථ ලියා දක්වන්න.

03. පහත දැක්වෙන තෘතීයා විභක්ති ඒකවචන පදවල ද්විවචන හා බහුවචන රූප ලියන්න.

ඒකවචන	ද්විවචන	බහුවචන
चक्षुषा		
कर्णेन		
मुखेन		
दन्तेन		
अङ्गुल्या		

02. අනුක්ත කර්තෘ යෙදීමේ දී

අනුක්ත කර්තෘ තෘතීයා විභක්තියෙන් යෙදේ. කර්මකාරක වාක්‍යයක කර්තෘ අනුක්ත වන අතර කර්මය උක්ත වේ.

- व्याधेन मृगः हन्यते । (වැද්දා විසින් මුවා මැරේ)
- विष्णुशर्मेण पञ्चतन्त्रं कृतम् । (විෂ්ණුශර්මන් විසින් පඤ්චතන්ත්‍රය කරන ලදි)
- छात्रेण गुरुः नम्यते । (ශිෂ්‍යයා විසින් ගුරුවරයා වඳිනු ලැබේ)

අභ්‍යාසය 2.9

०१. तेन ते पृष्टाः ।
०२. त्वया किम् अभिहितम् ।
०३. मया अधुना सत्यं ज्ञातम् ।
०४. अनेन दुरात्मना मे दारको भक्षितः ।
०५. नापितेन सर्वः क्षपणकवृत्तान्तं तेषां निवेदितः ।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. එම වාක්‍යයන්හි ඇති තෘතීයා විභක්ති පද තෝරා ඒවායෙහි අර්ථ ද ලියන්න.

03. පහත සඳහන් ප්‍රථමා විභක්ති පද තෘතීයා විභක්තියටත් තෘතීයා විභක්ති පද ප්‍රථමා විභක්තියටත් හරවා ලියන්න.

ප්‍රථමා	තෘතීයා
दासः	
कपिः	
नरः	
लता	
फलं	
बुद्धः	
मुनिः	
धेनुः	
गङ्गा	
माता	

තෘතීයා	ප්‍රථමා
सेवकेन	
भूपतिना	
मार्जारेण	
कृषीवलेन	
अरिणा	
मूषिकेन	
पुष्पेण	
श्रावकेन	
पित्रा	
जिह्वया	

03. සහාදි යෝගයෙහි

सह, समं, सार्धं, सदृशः, साकं යන නිපාත යෝගයෙහි තෘතීයා විභක්තිය වේ.

- शिशुः बिडालेन सह क्रीडति। (ශිෂ්‍යයා පූසා සමග ක්‍රීඩා කරයි)
- केनाऽपि सार्धं कलहं न कुर्यात्। (කිසිවකු සමග කලහ නොකළ යුතු ය)

අභ්‍යාසය 2.10

०१. अहं गुरुणा सार्धं ग्रामं गच्छामि।
०२. वराहः शावकैः सह वनगुम्बं प्रविशति।
०३. त्वया सदृशा कश्चित् नास्ति।
०४. नास्ति तृष्णासमं तोयम्।
०५. पिता पुत्रेण साकम् आपणं गच्छति।

01. ඉහත වාක්‍යවල නිපාත පද සමග යෙදී ඇති තෘතීයා විභක්ති පද උපුටා දක්වන්න.

02. ඉහත වාක්‍යවල අර්ථ ලියන්න.

03. පහත සඳහන් වාක්‍යවලට යෝග්‍ය නිපාත පද සමග යෙදී ඇති තෘතීයා විභක්ති පද වරහන තුළින් තෝරා ලියන්න.

०१. राजा .... विदेशं गच्छति ।
०२. बुद्धः .... वाराणशिं गच्छति ।
०३. मे .... देवः नास्ति ।
०४. लोके .... कश्चित् नास्ति ।
०५. भवन्तः .... क्रीडन्तु ।

(गुरुणा समं / अस्माभिः साकं / अमात्यैः सह / बुद्धेन सदृशः / श्रावकैः सार्धं)

04. අඞ්ගවිකාරාර්ථයෙහි

ශාරීරික විකෘතිතා දැක්වීමෙහි ද තෘතීයා විභක්තිය භාවිත වේ.

- सः **पृष्टेन** कुब्जः । (කුබ්ජඃ) (ඔහු කොන්දෙන් කුදු ය)
- सः **शरीरेण** विकृतिः । (ඔහු සිරුරෙන් වෙනස් ය)

අභ්‍යාසය 2.11

०१. सः चक्षुभ्याम् अन्धः ।
०२. सः पादेन खञ्जः ।
०३. सः हस्तेन कुणिः ।
०४. सः कर्णाभ्यां बधिरः ।
०५. सः वचसा मूकः ।

(**अन्ध** - අන්ධ / **खञ्ज** - කොර / **कुणि** - වකුටු / **बधिर** - බිහිරි / **मूक** - ගොළු)

01. ඉහත වාක්‍යවල ඇති තෘතීයා විභක්ති පද ලියන්න.

02. ඉහත වාක්‍යවල අර්ථ ලියා දක්වන්න.

03. වරහන තුළ ඇති වචන සුදුසු සේ යොදා පහත වාක්‍ය සම්පූර්ණ කරන්න.

०१. ते शिष्याः चक्षुभिः .... ।
०२. ते नराः सर्वदा कर्णैः .... ।
०३. ते वृषभाः उत्पत्यै .... ।
०४. ते गायकाः सदैव पादैः .... ।
०५. ते बालिकाः नित्यं वचसा .... ।

(अन्धाः / मूकाः / खञ्जाः / बधिराः / कुणिः)

05. හේත්වර්ථයෙහි

හේතු අර්ථයෙහි ද තෘතීයාව භාවිත වේ.

- विद्यया विन्दते धनम्। (විද්‍යාවෙන් ධනය ලැබේ)
- सः यत्नेन सफलो भवति। (ඔහු උත්සාහයෙන් සාර්ථක වෙයි)

අභ්‍යාසය 2.12

०१. सत्येन कीर्तिं प्राप्णोति।
०२. यत्नेन जयं लभते।
०३. दानेन सुखं लभते।
०४. दीपेन आलोकं भवति।
०५. द्रोहेन नरकं याति।

01. ඉහත වාක්‍යවල ඇති තෘතීයා විභක්ති පද ලියා දක්වන්න.

02. එම වාක්‍යවල අර්ථ ලියා දක්වන්න.

03. පහත වගුවෙහි නිදර්ශන වරනැඟීම් අනුව වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(धर्माभ्याम् / बीजात् / उडुपैः / अगधेन / सत्याभ्याम्)

सत्येन		सत्यैः
	अगधाभ्याम्	अगधैः
उडुपेन	उडुपाभ्याम्	
धर्मेण		धर्मैः
	बीजाभ्याम्	बीजैः

06. ස්වභාවාදි යෝගයෙහි

ස්වභාවයෙන්, බොහෝ සෙයින්, ගෝත්‍රයෙන්, නමින් ආදි අර්ථ ඇති ශබ්ද කරණාර්ථයෙහි තෘතීයා විභක්තිය ගනී.

- प्रकृत्या चारुः। (ස්වභාවයෙන් ම සිත්කලු ය)
- प्रायेण अलसः। (බොහෝ සෙයින් කම්මැලි ය)
- गोत्रेण गौतमः। (ගෝත්‍රයෙන් ගෞතම වෙයි)
- नाम्ना रावणः। (නමින් රාවණ වෙයි)

07. ඉත්ථම්භාවාර්ථයෙහි

ඉත්ථම්භාව (කිසියම් වෙනසකට පැමිණීමේ) අර්ථයෙහි තෘතීයා විභක්තිය යෙදේ.

- गुरुः शिष्यः पुत्रेण पश्यति। (ගුරුවරයා ශිෂ්‍යයා පුතකු ලෙස දකියි)
- यतिः संसारम् असारेण पश्यति। (භික්ෂුව සසර නිසරු ලෙස දකියි)

සාරාංශය

තෘතීයා විභක්තිය

01. කරණාර්ථයෙහි ද,
02. අනුක්ත කර්තෘ කාරකයෙහි ද,
03. සහාදි යෝගයෙහි ද,
04. අඞ්ගවිකාරාර්ථයෙහි ද,
05. හේත්වර්ථයෙහි ද,
06. ස්වභාවාදි යෝගයෙහි ද,
07. ඉත්ථම්භාවාර්ථයෙහි ද යෙදේ.

04. චතුර්ථී විභක්තිය (සම්ප්‍රදාන කාරකය)

01. යමෙක් යමකුට යම් දෙයක් දෙනු ලැබේ ද, එම දීම පිළිගනු ලබන්නා සම්ප්‍රදාන යයි කියනු ලැබේ. (යස්මෛ දීයතෙ ස සම්ප්‍රදානම්)
සම්ප්‍රදාන අර්ථයෙහි චතුර්ථී විභක්තිය යෙදේ.

- माता पुत्राय क्षीरं ददाति। (මව පුතුට කිරි දෙයි)
- पुरुषः मोक्षाय यतते। (පුරුෂයා මෝක්ෂය පිණිස උත්සාහ කරයි)
- धनिकः दरिद्राय धनं ददाति। (ධනවතා දිළින්දාට ධනය දෙයි)
- माता तापसाय भिक्षां यच्छति। (මව තවුසාට ආහාර පිළිගන්වයි)
- छात्रः उपाध्याय पुस्तकं वितरति। (ශිෂ්‍යයා ගුරුවරයාට පොතක් දෙයි)

අභ්‍යාසය 2.13

०१. याचकाय आहारं ददाति।
०२. नृपः सेवकेभ्यः त्यागानि ददाति।
०३. वृक्षाय जलं ददाति।
०४. उपासकः भिक्षवे आहारं ददाति।
०५. कृषीवलः धेनवे औषधं ददाति।

01. ඉහත වාක්‍යවල ඇති චතුර්ථී විභක්ති පද ලියා දක්වන්න.

02. එම වාක්‍යවල අර්ථ ලියා දක්වන්න.

03. පහත වගුවේ චතුර්ථී විභක්ති පදවලට නියමිත ද්විවචන හා බහුවචන ලියන්න.

		द्विवचन	बहुवचन
१.	मुनये		
२.	देवाय		
३.	साधवे		
४.	वनितायै		
५.	नद्यै		

02. **नमः , स्वस्ति , स्वधा , अलम् , स्वाहा , वषट्** යන නිපාතයන් හා **हित** ශබ්දය සමග යෙදෙන්නේ ද චතුර්ථී විභක්තිය යි.

- मातृ-पितृभ्यां नमः । (මව්පියන්ට නමස්කාර වේවා!)
- प्रजाभ्यः स्वस्ति । (ප්‍රජාවට සෙත්වේවා!)
- गुरवे स्वधा । (ගුරුවරයාට පූජා වේවා!)
- सर्वज्ञाय स्वाहा । (සර්වඥයන් වහන්සේට පූජා වේවා!)
- यतये वषट् । (භික්ෂුවට පූජා වේවා!)
- अलम् अङ्गुलिमालः मात्रे । (අංගුලිමාල මවට මැනවි)
- आहाराय हितम् । (ආහාරයට සුදුසු යි)

අභ්‍යාසය 2.14

०१. नमः समन्तभद्राय ।

०२. स्वस्ति ते होतु सर्वदा ।

०३. अलं सीता रामाय ।

०४. इन्द्राय स्वाहा ।

०५. देवाय स्वधा ।

01. ඉහත සඳහන් වාක්‍යවල ඇති චතුර්ථී විභක්ති පද වෙන්කර දක්වන්න.
02. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
03. පහත ඇති වාක්‍යවලට සුදුසු වචන වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

०१. .... पित्रे ।
०२. .... बोधिवृक्षाय चीवरम् ।
०३. रोगाय .... औषधम् ।
०४. कृष्णे देवी ....उपाध्याय ।
०५. अलं वनिताय .... ।

(वषट् / हितम् / नमः / अलम् / स्वस्ति)

03. **රුචි කිරීම, කැමති වීම** අර්ථය ඇති ධාතුන්ගෙන් සෑදුන ක්‍රියා ඇති වාක්‍යයක එම සන්තෝෂය ලබන්නා චතුර්ථී විභක්තියෙන් යෙදේ.

- गुरुः शिष्याय तुष्यति । (ගුරුවරයා ශිෂ්‍යයාට සතුටු වෙයි.)
- बालकेभ्यः रोचते मोदकानि । (ළමයින්ට රසකැවිලි ප්‍රියවෙයි.)

04. ක්‍රෝධ, ද්‍රෝහ, ඊර්ෂ්‍යාදියට ලක්වන්නා ද චතුර්ථී විභක්තියෙන් යෙදේ.

- अमित्राय क्रुध्यति । (අමිත්‍රයාට කිපෙයි.)
- कवये असूयति । (පණ්ඩිතයාට ඊර්ෂ්‍යා කරයි.)
- समर्थाय ईर्ष्यति । (දක්ෂයාට ඊර්ෂ්‍යා කරයි.)
- अरिभ्यः द्रुह्यति । (සතුරන්ට ද්‍රෝහ කරයි.)

අභ්‍යාසය 2.15

०१. ग्लानाय औषधं रोचते ।
०२. पुण्यवन्तेभ्यः उपदेशं हितम् ।
०३. दुर्वाशाऋषिः शकुन्तलायै शपते ।
०४. देवदत्तः बुद्धाय ईर्ष्यति ।
०५. मूर्वः पुण्यवन्तेभ्यः क्रुध्यति ।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. ඉහත සඳහන් වාක්‍යවල ඇති චතුර්ථී විභක්ති පද ලියන්න.

03. පහත දී ඇති වාක්‍යවල හිස්තැනට සුදුසු රෝචනාර්ථ, ද්‍රෝහාර්ථ වරහන තුළ ඇති වචනවලින් තෝරා හිස්තැන් පුරවන්න.

०१. श्रमणाय सत्यं.................. ।
०२. धनिकाय कृपणः.................. ।
०३. यौवनाय वृद्धः.................. ।
०४. परमेश्वरः मकरध्वजाय .... ।
०५. सत्यवादिः वञ्चकाय .... ।

(द्रुह्यति / रोचते / ईर्ष्यति / क्रुध्यति / शपते)

05. ක්‍රියාව යම් ප්‍රයෝජනයක් උදෙසා පවතී ද එම ප්‍රයෝජන දැක්වෙන පදය (තාදර්ථ්‍යයෙහි) චතුර්ථී විභක්තිය ඇසුරු කරයි.

- निर्वाणाय धर्मं धत्ते । (නිවන් පිණිස ධර්මය දරයි)
- संयमाय ज्ञानं धत्ते । (හික්මීම පිණිස නුවණ දරයි)

අභ්‍යාසය 2.16

०१. मम प्रयत्नं राज्याभ्युदयाय ।
०२. बुद्धः मोक्षाय धर्मं अदेशयत् ।
०३. संयमाय श्रुतं धत्ते ।
०४. प्रजायै गृहमेधिनाम् ।
०५. सत्याय मितभाषिणाम् ।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. ඉහත සඳහන් වාක්‍යවල ඇති චතුර්ථී විභක්ති පද තෝරන්න.

03. පහත වාක්‍යවල හිස්තැන්වලට සුදුසු වචන වරහන තුළින් තෝරා ලියන්න.

०१. .... श्रुतं धत्ते।
०२. .... फलन्ति वृक्षाः।
०३. .... सम्भृतर्चानाम्।
०४. .... सद्धर्मं भवति।
०५. .... पापं वर्तते।

(विनाशाय / मोक्षाय / त्यागाय / परोपकाराय / संयमाय)

06. ණය හිමි පුද්ගලයා ද පැවසෙනුයේ චතුර්ථී විභක්තියෙනි.

- कृष्णाय सहस्रं धारयति राधा। (රාධා ක්‍රිෂ්ණාට දහසක් ණයයි)

07. ක්‍රියාවේ අර්ථය යමකුගේ ඵලය පිණිස පවතී ද එකී ඵලය ලබන්නා චතුර්ථී විභක්තියෙන් කියැවේ.

- माता जीवति पुत्राय। (මව පුතු පිණිස ජීවත් වෙයි)
- गुरुः छात्राय श्राम्यति। (ගුරුවරයා ශිෂ්‍යයාට වෙහෙසෙයි)

අභ්‍යාසය 2.17

01. පහත පද්‍යයන්ගෙන් අර්ථවත් වාක්‍ය නිර්මාණය කරන්න. ඒවායෙහි තේරුම් ද ලියන්න.

दरिद्रेभ्यो धनं देहि ज्ञानायाऽव्ययनं कुरु।
नमः श्रीरघुनाथाय स्वस्ति तुभ्यं महीपते॥

स्वाहाऽग्नये स्वधा पित्रे रोगिणे हितमौषधम्।
शिशवे रोचते क्रीडा नृपः क्रुध्यति दस्यवे॥

परोपकाराय फलन्ति वृक्षाः परोपकाराय वहन्ति नद्यः।
परोपकाराय दुहन्ति गावः परोपकारार्थमिदं शरीरम्॥

සාරාංශය

චතුර්ථී විභක්තිය

01. සම්ප්‍රදාන අර්ථයෙහි ද,
02. ආශීර්වාද, ගෞරවාදිය ලබන්නා ද,
03. රුචිකිරීම් අර්ථයෙහි ද,
04. ක්‍රෝධයට, ද්‍රෝහාදියට ලක්වන්නා ද,
05. තාදර්ථ්‍යයෙහි ද,
06. ණය හිමි පුද්ගලයා පැවසීමේ දී ද යෙදේ.

दुर्जनः परिहर्तव्यो विद्ययाऽलङ्कृतोऽपि सन्।

දුදනා ශාස්ත්‍රඥානයෙන් බැබළුණේ නමුත් දුරුකළ යුතු ය.

दोषग्राही गुणत्यागी पल्लोलीव हि दुर्जनः।

දුර්ජනයා පෙනේරය මෙන් ගුණ හැර වැරදි දේ පමණක් ගනියි.

नाल्पीयान्बहु सुकृतं हिनस्ति दोषः।

කරන ලද බොහෝ පින් අල්ප වූ වැරදි යටපත් කරයි.

०३
तृतीयः पाठः।

ऋते ज्ञानात् न मुक्तिः।

(ඥානයෙන් තොර විමුක්තියක් නැත)

कारकपरिचयः। ०२

05. පඤ්චමී විභක්තිය (අපාදාන කාරකය)

යමකින්, යමකු කෙරෙන් යම් දෙයක් හෝ යමෙක් ඉවත් වනු ලැබේ ද එම ඉවත්වීමේ සීමාව අපාදාන නම් වේ. එය යෙදෙන්නේ පඤ්චමී විභක්තියෙනි.

අභ්‍යාසය 3.1

०१. कृषिकः क्षेत्रात् आगच्छति।
०२. पर्वतात् सञ्चारकः पतति।
०३. अर्चकः मन्दिरात् निर्गच्छति।
०४. शरीरात् स्वेदं पतति।
०५. मुखात् दन्तं पतति।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
02. ඉහත සඳහන් වාක්‍යවල ඇති පඤ්චමී විභක්ති පද ලියන්න.
03. පහත දැක්වෙන ප්‍රථමා විභක්ති පදවලට අදාළ පඤ්චමී විභක්ති වචන වරහන තුළින් තෝරා ලියන්න.

ප්‍රථමා	පඤ්චමී
नरः	
शिष्यौ	
वृक्षः	
हस्ताः	
धेनुः	

(शिष्याभ्याम् / नरात् / वृक्षात् / धेनोः / हस्तेभ्यः)

01. पर , इतर , आरात् , विना , ऋते , प्रत्यक् , प्राग्

ආදි කාල වාචී හා දිශා වාචී ශබ්ද යෝගයෙහි පඤ්චමී විභක්තිය යෙදේ.

- इतः परम्। (මෙතැන් සිට)
- इतरो क्षेत्रात् वनम्। (කෙතින් වනය අන්‍ය වූවකි.)
- आरात् वनात् कूपम्। (වනයෙන් ඈත/ළඟ ළිඳයි.)
- धर्मात् विना शान्तिः नास्ति। (ධර්මයෙන් තොර සැනසීමක් නැත.)
- ऋते ज्ञानात् न मुक्तिः। (ඥානයෙන් තොර විමුක්තියක් නැත.)
- प्रत्यक् मन्दिरात् पर्वतः। (මන්දිරයට බටහිරින් පර්වතය ඇත.)
- दानशालायाः प्राग् सङ्घावासः। (දානශාලාවට පෙරදිගින් සංඝාවාසය ඇත.)

අභ්‍යාසය 3.2

०१. आरात् वनात् विहारम् अस्ति।

०२. अन्यः प्रासादात् चैत्यम्।

०३. इतरो ग्रामात् नगरं।

०४. पूर्वो नगरात् आरोग्यशाला।

०५. प्राक् त्वत् अहं तिष्ठामि।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. මෙම වාක්‍යවල ඇති පඤ්චමී විභක්ති පද ලියා දක්වන්න.

02. ප්‍රභවාර්ථයෙහි පඤ්චමී විභක්තිය ගනී.

- प्रभवति नदी जलमूलात्। (ජලමූලයෙන් නදිය හටගනියි.)
- बीजात् अङ्कुरः जायते। (බීජයෙන් පැලය හටගනියි.)

අභ්‍යාසය 3.3

०१. लोभात् क्रोधः प्रभवति ।

०२. मोहात् पापं जनयति ।।

०३. उद्योगात् जयं लभते ।

०४. विनयात् पात्रतां याति ।

०५. धनात् धर्मं च सुखं च लभते ।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. මෙහි සඳහන් පඤ්චමී විභක්ති පද ලියන්න.

03. පහත සඳහන් වචන යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

०१. पापात् ....

०२. पुण्यात् ....

०३. ज्ञानात् ....

०४. कृपणात् ....

०५. स्नेहात् ....

03. මර්‍යාදා (සීමා), අභිවිධි (ව්‍යාප්ති) අර්ථයන්හි යෙදෙන आ ශබ්දය සමග පඤ්චමී විභක්තිය භාවිත වේ.

- आ निर्वाणात् बुद्धं भज । (නිවන තෙක් බුදුන් ඇසුරු කරන්න.)
- आ वनात् सा रुरोद । (වනය තෙක් ඇය හැඬුවා ය.)

අභ්‍යාසය 3.4

०१. आजन्मनः कुतः सुखम् ।

०२. आसमुद्रात् उर्वी भवति ।

०३. आमरणात् दुःखमेव विन्दति ।

०४. आवनात् देवः अवर्षत् ।

०५. आवृद्धत्वात् यौवनत्वं भजति ।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. මෙහි ඇති පඤ්චමී විභක්ති පද ලියා දක්වන්න.

03. පහත වාක්‍යවලට සුදුසු පඤ්චමී විභක්ති පද වරහන තුළින් තෝරා ලියන්න.

०१. ....वनं वर्तते ।

०२. .... बालकालः भवति ।

०३. .... पूर्वाह्णं भवति ।

०४. .... प्राकारः अस्ति ।

०५. ....पथं वर्तते ।

(आसमुद्रात् / आपथः / आसायाह्नात् / आयौवनात् / आग्रामात्)

04. යමකින්, යමකුගෙන් බියක්, තැතිගැනීමක් ඇති වේ නම් එසේ බියට හේතුවන්නා පඤ්චමී විභක්තියෙන් තැබේ.

- चोराद् बिभेति बालकः ।   (ළමයා සොරාගෙන් බියවෙයි.)

අභ්‍යාසය 3.5

०१. मार्जारात् मूषिकः त्रस्यति ।

०२. कालात् जन्तवः बिभेति ।

०३. सर्पात् भेकः भायति ।

०४. दारकः गजात् अभायत् ।

०५. पिङ्गलकः सञ्जीवकस्य शद्बात् अत्रस्यत् ।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. එම වාක්‍යවල ඇති පඤ්චමී විභක්ති වචන ලියන්න.

03. පහත වාක්‍යවල ඇති හිස්තැනට සුදුසු වචනය වරහන තුළින් තෝරා ලියන්න.

०१. ....सज्जनाः भायन्ति ।

०२. .... धनिकः भायिष्यति ।

०३. .... चोरः त्रस्यति ।

०४. .... शिष्यः अभायत् ।

०५. .... गोमायु श्रुगालः अभायत् ।

(आरक्षकात् / असज्जनेभ्यः / चोरात् / आचार्यात् / दुन्दुभेः)

04. පහත වාක්‍යවල හිස්තැන් පුරවන්න.

1. යමකින් යමක් ඉවත්වේ ද එහි පූර්ව සම්බන්ධය පැවති පුද්ගලයා හෝ වස්තුව අදාළ වන වචනය .... විභක්තිය ගනී.
2. ඇතැම් අව්‍යපද සමගත් දිශාවාචී ශබ්ද සමගත් යෙදෙන පද .... විභක්තිය ගනී.
3. යමකින් යමක් උපදී නම් පෙර සම්බන්ධ පැවති පදය .... විභක්තිය ගනී.
4. සීමාර්ථය ප්‍රකාශ කරන ආ ප්‍රත්‍යය සහිත වචන ද .... විභක්තිය ගනී.
5. යමකින් බිය සන්ත්‍රාස ගෙන දේ නම් ඊට මූලික වන වචන .... විභක්තිය ගනී.

සාරාංශය

පඤ්චමී විභක්තිය

1. අපාදානාර්ථයෙහි ද,
2. කාලවාචී හා දිශාවාචී ශබ්දයෝගයෙහි ද,
3. ප්‍රභවාර්ථයෙහි ද,
4. සීමාර්ථයෙහි ද,
5. බියවීම් අර්ථයෙහි ද යෙදේ.

06. ෂෂ්ඨී විභක්තිය

01. විශේෂ්‍ය විශේෂණ වශයෙන් සිටි පද දෙකක සංයෝගයෙන් අයිතිය හෙවත් සම්බන්ධය (ස්වාම්‍යර්ථය) ප්‍රකට කෙරෙන්නේ ෂෂ්ඨී විභක්තියෙනි.

- चन्द्रस्य किरणः रमणीयः। (සඳුගේ කිරණ සිත්කලු ය.)
- रावणस्य पत्नी मन्दोदरी इति। (රාවණාගේ බිරිඳ මන්දෝදරී ය.)

අභ්‍යාසය 3.6

०१. राहुलस्य पुस्तकमिदम्।
०२. वीरस्य औदार्यम् उत्तमम्।
०३. सिरिपालस्य गृहं महन्तम्।
०४. भूपतेः सेना गच्छति।
०५. तस्य भार्या सुतम् असूत।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
02. එම වාක්‍යවල ඇති ෂෂ්ඨී විභක්ති පද වෙන වෙන ම ලියන්න.
03. මෙහි ඇති ෂෂ්ඨී විභක්ති පදවල අර්ථයන්හි ඇති පොදු ලක්ෂණය කුමක් ද?

02. ජාති, ගුණ, ක්‍රියා, ද්‍රව්‍ය වාචක සමූහයකින් එකක් වෙන්කර ගැනීමක දී (නිර්ධාරණාර්ථයෙහි) සමූහය අදාළ වන වචනය ෂෂ්ඨී විභක්තිය වේ.

- व्याकरणग्रन्थानाम् अष्टाध्यायी श्रेष्ठा।
  (ව්‍යාකරණ ග්‍රන්ථයන් අතරින් අෂ්ටාධ්‍යායී ශ්‍රේෂ්ඨ ය.)
- श्रेष्ठः शक्रः देवानाम्।
  (දෙවියන් අතරින් ශක්‍රයා ශ්‍රේෂ්ඨ ය.)

අභ්‍යාසය 3.7

०१. तयोः एकस्य हस्तात् मूल्यम् अपतत् ।

०२. तेषाम् एकः मूर्वः ।

०३. तेषाम् एकः अन्धः ।

०४. तेषां त्रयः शास्त्रपारङ्गताः ।

०५. कवीनां कालिदासः प्रमुखः ।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. මෙහි ඇති ෂෂ්ඨී විභක්ති පද වෙන වෙන ම ලියන්න.

03. පහත වාක්‍යවලට සුදුසු වචන තෝරා හිස්තැන් පුරවන්න.

०१. ....भिक्षूणां प्रमुखः शारिपुत्रस्थविरः ।

०२. .... रम्यं नाटकं शकुन्तला ।

०३. .... प्रमुखः ज्योतिपालः ।

०४. .... प्रधानः स्वर्णमाली चैत्यम् ।

०५. .... कसीभारद्वाजः प्रधानः ।

(कृषीवलानां / धर्मकथिकानां / चैत्यानां / नाटकानां / गायकानां)

03. අකමැත්ත, අනාදරය ප්‍රකාශ කිරීමේදී ද ඊට බඳුන්වන්නා ෂෂ්ඨී විභක්තියෙන් වේ.

- मातापित्रोः रुदतोः सः वनम् अगच्छत् ।   (මවුපියන් හඬද්දී ඔහු වනයට ගියේ ය.)

අභ්‍යාසය 3.8

०१. पृथग्जनानां भिक्षूणां रुदतां सम्यग्सम्बुद्धः परिनिर्वाणमगच्छत्।

०२. आचार्यस्य वारितस्य शिष्यः गृहं गतः।

०३. कुमारदासस्य अनिच्छन्तस्य कालिदासः दिवं गतः।

०४. दारकस्य दुःखितस्य माता पञ्चत्वं गता।

०५. मातापित्रोः निवारितयोः पुत्रः विदेशं गतः।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. ඉහත වාක්‍යවල ඇති ෂෂ්ඨී විභක්ති පද වෙන වෙන ම ලියන්න.

03. පහත වාක්‍යවලට සුදුසු ෂෂ්ඨී විභක්ති පද වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

०१. ....अप्रसादस्य श्रामणेरः अधावत्।

०२. .... निवारितस्य दमनकः पिङ्गलक समीपम् अगच्छत्।

०३. .... अप्रसन्नास्याः रावणः अपाहरत्।

०४. .... अनिच्छन्तस्य अवीचिं गतः।

०५. .... रुदतः सिद्धार्थः अभिनिष्क्रमत्।

(करटकस्य / गुरोः / देवदत्तस्य / सीतायाः / यशोधरायाः)

04. दूर, अन्तिक, निकट, हेतु යන ශබ්ද සමග යෙදෙන නාමය ෂෂ්ඨී විභක්තිය ගනී.

- ग्रामस्य दूरम्। (ගමට දුරින්)
- नगरस्य अन्तिकम्। (නගරය කෙළවර)
- कूपस्य निकटम्। (ළිඳ ළඟ)
- धनस्य हेतोः। (ධනය හේතුවෙන්)

අභ්‍යාසය 3.9

०१. नगरस्य दूरात् वनम् अस्ति ।

०२. ग्रामस्य अन्तिके वापिम् अस्ति ।

०३. विहारस्य निकटं गृहम् अस्ति ।

०४. औषधस्य हेतोः जीवति ।

०५. आहारस्य हेतोः भिक्षति ।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. ඉහත වාක්‍යයන්හි ඇති ෂෂ්ඨී විභක්ති පද වෙන වෙන ම ලියන්න.

03. පහත වාක්‍යවලට සුදුසු වචනවල අංක නිවැරදි ව ගළපා වාක්‍ය සකසන්න.

१.	गृहस्य .... महावृक्षम् अस्ति ।	१	समन्तकूटपर्वतस्य
२.	परिवेणस्य .... पाठालयम् अस्ति ।	२	ग्लानस्य
३.	कोलम्बनगरस्य.................अनुराधपुरनगरम् अस्ति ।	३	समीपे
४.	अविद्या .... संस्काराः भवन्ति ।	४	निकटम्
५.	कूपस्य .... कृष्णसर्पः तिष्ठति ।	५	दूरात्
६.	.... दूरात् कल्याणिपुरं भवति ।	६	हेतोः
७.	.... निकटं वैद्यः तिष्ठति ।	७	अन्तिके
८	.... हेतोः नामरूपं भवति ।	८	विज्ञानस्य

05. තව්‍ය, අනීය ප්‍රත්‍යාන්ත ශබ්දයන්ගේ යෝගයෙහි ෂෂ්ඨී විභක්ති වේ.

- धनं कस्य देयम् । (ධනය කවරෙකුට දිය යුතු ද?)
- इदं मम करणीयम् । (මෙය මාගේ කටයුත්තකි.)

අභ්‍යාසය 3.10

०१. अस्माकं कर्तव्यानि कार्याणि ।

०२. शिष्यानां पठितव्यं पुस्तकम् ।

०३. कृषीवलस्य कर्तव्यं क्षेत्रम् ।

०४. सर्वस्य गमणीयं लोकम् ।

०५. शिष्यानां वाचनीयं पाठानि ।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
02. ඉහත වාක්‍යවල ඇති ෂෂ්ඨී විභක්ති පද ලියා දක්වන්න.
03. පහත වාක්‍යවලට සුදුසු ෂෂ්ඨී විභක්ති පද යොදා හිස්තැන් පුරවන්න.

०१. ....जितइन्द्रियाणि ।

०२. .... कृतकृत्यानि ।

०३. .... ऊढभारम् ।

०४. .... म्लानमाला ।

०५. .... भग्नभारम् ।

(वृषभस्य / वृक्षस्य / सञ्जीवकस्य / बुद्धस्य / अरहन्तस्य)

06. අධිපති, ඊශ්වර, ස්වාමී යන ශබ්දයන් හා යෙදෙන නාම පදය ෂෂ්ඨී විභක්තිය ගනී.

- शिष्यानां नायकः सिद्धार्थः ।   (සිසුන්ගේ නායකයා සිද්ධාර්ථ ය.)

අභ්‍යාසය 3.11

०१. धर्मस्य स्वामी भगवान् बुद्धः।

०२. नराणाम् अधिपतिः नरेन्द्रः।

०३. कवीनाम् ईश्वरः कवीन्द्रः।

०४. गजानां स्वामी गजनायकः।

०५. व्यापारस्य अधिपतिः व्यापारिकः।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. ඉහත වාක්‍යවල ඇති ෂෂ්ඨී විභක්ති පද ලියා දක්වන්න.

03. එම වචන ෂෂ්ඨී විභක්තියෙන් ලිවීමට විශේෂ හේතුව කුමක් ද?

04. පහත වාක්‍යවලට සුදුසු ෂෂ්ඨී විභක්ති පද වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

०१. ....अधिपतिः जनाधिपः।

०२. देवानां.................. शक्रः।

०३. .... स्वामी सार्थवाहकः।

०४. गोः स्वामी ....

०५. ....ईश्वरः कुवेरः।

(गवेन्द्रः / सारथीनाम् / जनानाम् / नायकः / असुराणाम्)

සාරාංශය

ෂෂ්ඨී විභක්තිය

1. ස්වාම්‍යර්ථයෙහි ද,
2. නිර්ධාරණාර්ථයෙහි ද,
3. අනාදරාර්ථයෙහි ද,
4. **दूर** , **अन्तिक** , **निकट** , **हेतु** යන ශබ්ද සමග ද,
5. තව්‍ය අනීය ප්‍රත්‍යාන්ත යෝගයෙහි ද,
6. අධිපති අර්ථයෙහි ද යෙදේ.

07. සප්තමී විභක්තිය (අධිකරණ කාරකය)

01. ක්‍රියාවට ආධාර වනුයේ අධිකරණය යි. ක්‍රියාව යමක් මත රඳා පවතී ද එම පදය (ආධාර්ථයෙහි) සප්තමී විභක්තියේ යෙදේ.

- विहगाः नीडे वसन्ति । (කුරුල්ලෝ කැදැල්ලේ වාසය කරති.)
- बुद्धः हृदि वसति । (බුදුරජාණන් වහන්සේ හදවතෙහි වාසය කරයි.)

අභ්‍යාසය 3.12

०१. वानराः वृक्षेषु निवसन्ति ।

०२. अम्बरे विहगाः चलन्ति ।

०३. मधु तिष्ठति जिह्वाग्रे ।

०४. हृदि हलाहलं विषं भवति ।

०५. राजा सिंहासने तिष्ठति ।

01. ඉහත වාක්‍යයන් සිංහලට පරිවර්තනය කරන්න.
02. එම වාක්‍යවල ඇති සප්තමී විභක්ති පද වෙන වෙන ම ලියා අර්ථ දක්වන්න.
03. පහත වාක්‍යවල හිස්තැන්වලට සුදුසු වචන වරහන තුළින් තෝරා ලියන්න.

०१. .... बुद्धः तिष्ठति ।

०२. .... भिक्षवः वसन्ति ।

०३. .... कृषीवलाः बीजानि वपन्ति ।

०४. .... उपासकाः तिष्ठन्ति ।

०५. .... पञ्च अङ्गुल्यानि भवन्ति ।

(विहाराङ्गने / क्षेत्रे / विहारे / परिवेणे / हस्ते)

02. සමූහයකින් එකක් තෝරාගැනීමේ දී සමූහාර්ථ පදය (නිර්ධාරණාර්ථයෙහි) සප්තමී විභක්තිය භාවිත වේ.

- पादपेषु वटः वनस्पतिः। (ගස් අතුරින් නුග ගස වනස්පතිය යි.)

අභ්‍යාසය 3.13

०१. आर्यश्रावकेषु मौद्गल्यायनस्थविरः ऋद्धिप्रातिहार्ये अग्रः भवति।

०२. सर्वभाषाषु संस्कृतभाषा अतिश्रेष्ठभाषा भवति।

०३. काव्येषु नाटकं रम्यं भवति।

०४. नाटकेषु शकुन्तला मनोज्ञं भवति।

०५. अध्यापनेषु पारिवेणिकाध्यापनं विषिष्ठाध्यापनं भवति।

01. ඉහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
02. ඉහත සඳහන් වාක්‍යවල සප්තමී විභක්ති පද උපුටා දක්වන්න.
03. පහත සඳහන් වචනවලින් වාක්‍යවල හිස්තැනට සුදුසු වචන වරහන තුළින් තෝරා ලියන්න.

१. सर्व .... विद्या उत्तमं द्रव्यं भवति।
२. .... सोमानन्दभिक्षुः संस्कृतभाषाकथने पाठवः ।
३. सर्व .... गजः कायेन अतिस्थूलः जन्तुः।
४. .... कालिदास महाकविः अद्वितीयः।
५. .... गुत्तिलः सुप्रकटः आचार्यः।

(आचार्येषु / मृगेषु / छात्रेषु / द्रव्येषु / कवीषु)

03. අකැමැත්තක්, අප්‍රසාදයක් හැඟවෙද්දී ඊට ලක් වන්නා (අනාදරාර්ථයෙහි) සප්තමී විභක්තිය වේ.

- प्रहरति चोरः धनिके विलपति। (ධනවතා වැළපෙද්දී සොරා පහර දෙයි.)

අභ්‍යාසය 3.14

०१. देवेषु रुदत्सु कौलिकः वृक्षमछिन्दत्।

०२. मातरि रुदति दारकः विदेशं गतः।

०३. पृथग्जनभिक्षुषु रुदत्सु बुद्धः परिनिर्वाणम् अगमत्।

०४. मयि अनिच्छन्ते आचार्यः विहारात् अगमत्।

०५. प्रेमवते वारिते प्रेमवतीं विषम् अपिबत्।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. ඉහත වාක්‍යවල ඇති සප්තමී විභක්ති පද ලියා දක්වන්න.

03. පහත සඳහන් පද යොදාගනිමින් නිවැරදි වාක්‍ය සකසන්න.

०१. कृतेऽपि / पुत्रः / अकुर्वत् / सुरापानं / पितरि / दोषारोपणं

०२. अघातयत् / निवारयति / अजातशत्रुकुमारः / पित्रं / मातरि

०३. बुद्धं / अन्वगच्छत् / नन्दः / अनिच्छति / सुन्दर्याम्

०४. सहस्रबुद्धिः / एकबुद्धेः / उपदिशति / न प्रतिगृह्णाति

०५. अवर्षत् / कृषीवलेषु / देवः / अनिच्छन्तेषु

04. කාලාර්ථයක් හැඟවෙන කල්හි ප්‍රසිද්ධ ක්‍රියාවත්, ඉන් කියැවෙන නාමයත් (භාවාර්ථයෙහි) සප්තමී විභක්තිය ගනී.

- उदयति सूर्ये लिखामि गीतम्। (හිරු උදාවන කල්හි ගීයක් ලියමි.)

අභ්‍යාසය 3.15

०१. अथ तस्यायां गतायां ब्राह्मणोऽपि गृहात् निर्गतः।
०२. तेषु गतेषु मण्डूकः आह।
०३. वेश्मनि सर्वतः दह्यमाने सः शयीत।
०४. यत्ने कृते यदि न सिध्यति कोत्र दोषः।
०५. मृत्यौ पाशहस्ते तिष्ठति प्रमाद्यात् शोच्यः।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
02. මෙහි ඇති සප්තමී විභක්ති පද උපුටා දක්වන්න.
03. පහත වාක්‍යවල හිස්තැන්වලට සුදුසු පද වරහන තුළින් තෝරා ලියන්න.

०१. गुरौ .... शिष्यः बहिर्गतः।
०२. मातरि .... पुत्रः गृहात् निर्गतः।
०३. बुद्धे परिनिर्वाणं .... पृथिवि कम्पनम् अभवत्।
०४. अस्मासु .... वानरः आगतः।
०५. नन्दे .... सुन्दरी अरुदत्।

(उपदिशति / सुप्तेषु / मृते / गते / गच्छति)

05. කර්මය සමග යෙදී ඇති නිමිත්ත පැවසෙන නාමය ද (නිමිත්තාර්ථයෙහි) සප්තමී විභක්තිය ගනී.

- छिनत्ति वृक्षं दारुषु। (දර පිණිස ගස කපයි.)

අභ්‍යාසය 3.16

०१. सूदाः काष्ठेषु वृक्षं छिन्दति।
०२. चोराः दन्तयोः हस्तिं घ्नन्ति।
०३. व्याधः विषाणेषु मृगान् नश्यति।
०४. अङ्गुलिमालः अङ्गुल्येषु नरान् मारितवान्।
०५. कर्मकराः रत्नेषु भूमिं खनन्ति।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. මෙම වාක්‍යවල ඇති සප්තමී විභක්ති පද ලියා ඒ වචනවල අර්ථය දක්වන්න.

03. පහත වාක්‍යවල හිස්තැන්වලට සුදුසු වචන වරහන තුළින් තෝරා ලියන්න.

०१. श्रामणेरः.................. श्वेतवस्त्रं रञ्जयति।

०२. सर्वे सत्वाः.................. आहारम् अनुभवन्ति।

०३. किरातः.................. व्याघ्रं हन्ति।

०४. कृषीवलाः..................बीजानि वपन्ति ।

०५. नराः.................. वनानि विनश्यन्ति।

(चर्मणि / जीवितेषु / काष्ठेषु / चीवरेषु / धान्येषु)

උපකාරක පද

काष्ठ - දර

घ्नन्ति - නසති

रञ्जयति - වර්ණගන්වයි/පාටකරයි

किरात - වැද්දා

विषाणेषु - අං පිණිස

06. ස්වාමී, ඊශ්වර, අධිපති ආදි ශබ්දයන් හා යෙදෙන නාමය ස්වාම්‍යර්ථයෙහි සප්තමී විභක්ති ගනී.

- कवीषु श्रेष्ठः अश्वघोषः। (කවියන් අතර ශ්‍රේෂ්ඨයා අශ්වඝෝෂ යි.)

අභ්‍යාසය 3.17

०१. उपमासु कालिदासः प्रमुखः भवति।

०२. अर्थगौरवे भारवी प्रधानः भवति।

०३. उपदेशे विष्णुशर्मः निपुणः भवति।

०४. तर्कने नीतिज्ञः चतुरः भवति।

०५. धर्मे स्वामी तथागतः भवति।

०६. धनेषु ईश्वरः कुवेरः भवति।

०७. शब्दानुप्रासे अश्वघोषयतीन्द्रः कुशलः भवति।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න. සප්තමී විභක්ති පද තෝරන්න.

02. පහත වාක්‍යවල හිස්තැන්වලට සුදුසු වචන වරහන තුළින් තෝරා ලියන්න.

०१. ....स्वामी गोपालः भवति।
०२. .... अधिपतिः राजा भवति।
०३. .... निपुणः रावणः भवति।
०४. .... स्वामी पिङ्गलकः भवति।
०५. .... ईश्वरः चन्द्रः भवति।

(वने / रात्रौ / युद्धे / गोषु / नरेषु)

සාරාංශය

සප්තමී විභක්තිය

01. ආධාරාර්ථයෙහි ද,
02. නිර්ධාරණාර්ථයෙහි ද,
03. අනාදරාර්ථයෙහි ද,
04. භාවාර්ථයෙහි ද,
05. නිමිත්තාර්ථයෙහි ද,
06. ස්වාම්‍යර්ථයෙහි ද යෙදේ.

नासमीक्ष्य परं स्थानं पूर्वमायतनं त्यजेत्।

වෙනත් තැනක් නොසොයා මුල් තැන අත් නොහළ යුතු ය.

नास्ति व्यसनिनानांकिञ्चिद्धुवि पर्याप्तये धनम्।

ධනය ම සොයන අයට සෑහීම සඳහා පොළවේ ධනයක් නැත.

निसर्गः स हि धीराणां यदापद्यधिकं दृढम्।

විපතේ දී වඩා ශක්තිමත් වීම ධෛර්යවන්තයන්ගේ සහජ ගුණයකි.

०४

चतुर्थः पाठः।

सर्वे भवन्तु सुखिनः।

(සියල්ලෝ සැප ඇත්තෝ වෙත්වා!)

क्रियापदपरिचयः। ०१



1.	लट्	-	වර්තමාන කාලයෙහි වේ.
2.	लिट्	-	පරෝක්ෂභූත අතීත කාලයෙහි වේ.
3.	लुट्	-	අනද්‍යතන භවිෂ්‍ය අනාගත කාලයෙහි ය.
4.	लृट्	-	සාමාන්‍ය භවිෂ්‍ය අනාගත කාලයෙහි ය.
5.	लेट्	-	වේද විෂයෙහි පමණක් යෙදේ.
6.	लोट्	-	ආඥා, ප්‍රාර්ථනා යනාදි අර්ථවල යෙදේ.
7.	लङ्	-	අනද්‍යතන භූත අතීත අර්ථයෙහි යෙදේ.
8.	लिङ्	-	විධි ලිඞ් - විධි අර්ථයෙහි යෙදේ.
9.	लुङ्	-	සාමාන්‍ය භූත අතීත අර්ථයෙහි යෙදේ.
10.	लृङ्	-	ක්‍රියාතිපත්ති ක්‍රියා දෙකක නොවීම් අර්ථවල යෙදේ.

लट् वर्तमाने लेट् वेदे भूते लुङ् लङ् लिटस्तथा।
विध्याशिषौ लिङ्लोटौ लुट् लृट् लृङ् च भविष्यतः॥

- **कथन, गमन, धावन, दर्शन, हसन** ආදි කායසිය හෝ අවස්ථා යමකින් ප්‍රකාශ වන්නේ ද ඒවා ක්‍රියා නම් වේ. **पठति, धावति, लिखति, हसति, पश्यतः, खादतु, चकार, अपचत् गमिष्यति, चिन्तयामास** යනාදිය ක්‍රියාවෝ ය.

- ක්‍රියාපදයන්ගේ මූලය වන්නේ ධාතුව යි. ක්‍රියාපද නිර්මාණය වන්නේ මෙම ධාතුන්ගෙනි. ඉහත ප්‍රත්‍යයගත ව ඇති ක්‍රියාපදයන්ගේ ධාතුන් වන්නේ, පිළිවෙළින් **पठ्, धाव्, लिख्, हस्, दृश्, खाद्, कृ, पच्, गम्, चिन्त्** ආදිය යි.

- පරස්මෛපද, ආත්මනේපද හා උභයපද වශයෙන් ධාතු වර්ගත්‍රයකි. කිසියම් ක්‍රියාවක ඵලය කර්තෘට නොව අනෙකකුට වේ නම්, එකී ක්‍රියාවන්ගේ ධාතු පරස්මෛපද කොටසට ද, යම් ක්‍රියාවක ඵලය කර්තෘ වෙත ම ලැබේ නම්, එම ක්‍රියාවන්ගේ ධාතු ආත්මනේපද කොටසට ද අයත් වේ. කිසියම් ක්‍රියාවක් මෙම දෙකෙහි ම වේ නම්, එය උභයපද නම් වේ.

- **ति** යනු පරස්මෛපද ධාතුන් කෙරෙන් පර වර්තමානකාල ප්‍රථමපුරුෂ ඒකවචන ප්‍රත්‍යය යි.

नयति   हसति   पठति

- **ते** යනු ආත්මනේපද වර්තමානකාල ප්‍රථමපුරුෂ ඒකවචන ප්‍රත්‍යය යි.

हसते   नयते   पठते

- උභයපදී ධාතුන් කෙරෙන් මෙම ප්‍රත්‍යය දෙක ම යෙදේ.

- සංස්කෘත භාෂාවේ ධාතු හෙවත් ක්‍රියාමූල කොටස් දහයකි. ඒවා ''**ගණ**'' නාමයෙන් හඳුන්වති. ඒවාට විකරණ නම් වූ විශේෂ ප්‍රත්‍යය වර්ගයක් සම්බන්ධ වීමෙන් පද නිර්මාණය වේ.

- මෙසේ නිර්මාණය වන ක්‍රියාපද හෙවත් ආඛ්‍යාතපද ''**ලකාර**'' නම් වූ විභක්ති දහයකට අයත් වේ. එය ක්‍රියාපද පිළිබඳ භේද දහයකි. නාමපද විභක්තිවල වරනැගෙන්නේ යම් සේ ද මෙම ක්‍රියාපද ද දශලකාරයෙහි එසේ වරනැගේ.

- කර්තෘකාරක, කර්මකාරක හා භාවකාරක වශයෙන් කාරක තුනක් ද පවතී.

සරල වාක්‍ය නිර්මාණයේ දී උක්තාඛ්‍යාත සම්බන්ධ වන ආකාරය පහත දැක්වේ.

बालः सः सा तत्	बालौ तौ ते ते	बालाः ते ताः तानि
त्वम्	युवाम्	यूयम्
अहम्	आवाम्	वयम्

→

पतति	पततः	पतन्ति
पतसि	पतथः	पतथ
पतामि	पतावः	पतामः

लट् / लृट् / लङ् / लोट् / लिङ् ලකාරවල පරස්මෛපද ප්‍රත්‍යය මාලාව

लट्

ति	तः	न्ति
सि	थः	थ
मि	वः	मः

पठति	पठतः	पठन्ति
पठसि	पठथः	पठथ
पठामि	पठावः	पठामः

लृट्

स्य

स्यति	स्यतः	स्यन्ति
स्यसि	स्यथः	स्यथ
स्यामि	स्यावः	स्यामः

ष्य

पठिष्यति	पठिष्यतः	पठिष्यन्ति
पठिष्यसि	पठिष्यथः	पठिष्यथ
पठिष्यामि	पठिष्यावः	पठिष्यामः

लङ्

अ

त्	ताम्	अन्
अः	तम्	त
अम्	व	म

अपठत्	अपठताम्	अपठन्
अपठः	अपठतम्	अपठत
अपठम्	अपठाव	अपठाम

लोट्

तु	ताम्	अन्तु
–	तम्	त
आनि	आव	आम

पठतु	पठताम्	पठन्तु
पठ	पठतम्	पठत
पठानि	पठाव	पठाम

लिङ्

ईत्	ईताम्	ईयुः
ईः	ईतम्	ईत
ईयम्	ईव	ईम

पठेत्	पठेताम्	पठेयुः
पठेः	पठेतम्	पठेत
पठेयम्	पठेव	पठेम

ක්‍රියාපද සාධනයේ දී මෙසේ ධාතුන්ගෙන් පර ව **ति, तः** ආදි ප්‍රත්‍යය යොදා ගැනේ. ධාතුන් ප්‍රත්‍යයගත වන්නේ පුරුෂ හා කාලවලට අදාළ ව ය. මෙසේ **प्रथम, मध्यम** හා **उत्तम** යනුවෙන් පුරුෂ තුනක් ද **एकवचन, द्विवचन** හා **बहुवचन** වශයෙන් වචන තුනක් ද සංස්කෘත භාෂාවේ පවතී. දශලකාරයන්ගේ එබඳු විභක්ති ප්‍රත්‍ය 180කි. මෙහි එන ක්‍රියාපද පාඩම්වල දී **लट् - लङ् - लिट् - लृट् - लोट्** යන ලකාරයන් කෙරෙහි පමණක් අවධානය යොමු කෙරේ.

लकार	प्र.पु. एक.	प्र.पु. द्वि.	प्र.पु. बहु.	म.पु. एक.	म.पु. द्वि.	म.पु. बहु.	उ.पु. एक.	उ.पु. द्वि.	उ.पु. बहु.
लट्	ति	तः	न्ति	सि	थः	थ	मि	वः	मः
लृट्	स्यति	स्यतः	स्यन्ति	स्यसि	स्यथः	स्यथ	स्यामि	स्यावः	स्यामः
लङ्	त्	ताम्	न्	ः	तम्	त	अम्	व	म
लोट्	तु	ताम्	अन्तु	-[हि]	तम्	त	आनि	आव	आम
लिङ्	ईत्	ईताम्	ईयुः	ईः	ईतम्	ईत	ईयम्	ईव	ईम

√ पत्

लकार	प्र.पु. एक.	प्र.पु. द्वि.	प्र.पु. बहु.	म.पु. एक.	म.पु. द्वि.	म.पु. बहु.	उ.पु. एक.	उ.पु. द्वि.	उ.पु. बहु.
लट्	पतति	पततः	पतन्ति	पतसि	पतथः	पतथ	पतामि	पतावः	पतामः
लृट्	पतिष्यति	पतिष्यतः	पतिष्यन्ति	पतिष्यसि	पतिष्यथः	पतिष्यथ	पतिष्यामि	पतिष्यावः	पतिष्यामः
लङ्	अपतत्	अपतताम्	अपतन्	अपतः	अपततम्	अपतत	अपतम्	अपताव	अपताम
लोट्	पततु	पतताम्	पतन्तु	पत	पततम्	पतत	पतानि	पताव	पताम
लिङ्	पतेत्	पतेताम्	पतेयुः	पतेः	पतेतम्	पतेत	पतेयम्	पतेव	पतेम

ක්‍රියාකාරකම 4.1

01. පහත දැක්වෙන ක්‍රියාපද පරස්මෛපදයෙහි වරනගා ඇත. එය හොඳින් අධ්‍යයනය කරන්න.

धातु	लट्	लृट्	लङ्	लोट्	विधिलिङ्
√ भू	भवति	भविष्यति	अभवत्	भवतु	भवेत्
√ वद्	वदति	वदिष्यति	अवदत्	वदतु	वदेत्
√ धाव्	धावति	धाविष्यति	अधावत्	धावतु	धावेत्
√ गम्	गच्छति	गमिष्यति	अगच्छत्	गच्छतु	गच्छेत्
√ कृ	करोति	करिष्यति	अकरोत्	करोतु	कुर्यात्
√ हस्	हसति	हसिष्यति	अहसत्	हसतु	हसेत्
√ स्मृ	स्मरति	स्मरिष्यति	अस्मरत्	स्मरतु	स्मरेत्
√ पा	पिबति	पास्यति	अपिबत्	पिबतु	पिबेत्
√ स्था	तिष्ठति	स्थास्यति	अतिष्ठत्	तिष्ठतु	तिष्ठेत्

අභ්‍යාසය 4.1

01. ලට් ලකාර ක්‍රියාරූපවලින් හිස්තැන් පුරවන්න.

पुरुष	एकवचनम्	द्विवचनम्	बहुवचनम्	ඒකවචන	ද්විවචන	බහුවචන
प्रथमपुरुष	लिखति			ලියයි		
मध्यमपुरुष		लिखथः			දෙදෙන ලියහු	
उत्तमपुरुष			लिखामः			ලියමු

02. ලෘට් ලකාර ක්‍රියාරූපවලින් හිස්තැන් පුරවන්න.

पुरुष	एकवचनम्	द्विवचनम्	बहुवचनम्	ඒකවචන	ද්විවචන	බහුවචන
प्रथमपुरुष	लेखिष्यति			ලියන්නේ ය.		
मध्यमपुरुष		लेखिष्यथः			දෙදෙන ලියන්නෙහු	
उत्तमपुरुष			लेखिष्यामः			ලියන්නෙමු

03. ලඞ් ලකාර ක්‍රියා රූපවලින් හිස්තැන් පුරවන්න.

पुरुष	एकवचनम्	द्विवचनम्	बहुवचनम्	ඒකවචන	ද්විවචන	බහුවචන
प्रथमपुरुष	अलिखत्			ලියුවේ ය		
मध्यमपुरुष		अलिखतम्			දෙදෙනෙක් ලියුවෙහු	
उत्तमपुरुष			अलिखाम			ලියුවෙමු

04. ලෝට් ලකාර ක්‍රියා රූපවලින් හිස්තැන් පුරවන්න.

पुरुष	एकवचनम्	द्विवचनम्	बहुवचनम्	ඒකවචන	ද්විවචන	බහුවචන
प्रथमपुरुष	लिखतु			ලියාවා		
मध्यमपुरुष		लिखतम्			දෙදෙනෙක් ලියවු	
उत्तमपुरुष			लिखाम			ලියමෝවා

වර්තමාන ක්‍රියාපදයන්ගේ අගට **स्म** ප්‍රත්‍යය සම්බන්ධ කිරීමෙන් අතීතකාලික ලඞ් ලකාරයෙන් සිදුවන කාර්යය ඉටු කොටගත හැකි ය. එසේ සකස් වූ පදයන්ගෙන් ලැබෙන්නේ අතීත කාලික අර්ථයකි.

- अधावत् = දිව්වේ ය
- धावति + स्म > धावति स्म = දිව්වේ ය

- बाला हसति स्म । = දැරිය සිනාසුණා ය.
- माता वदति स्म । = මව පැවසුවා ය.

අභ්‍යාසය 4.2

01. පහත ක්‍රියාරූප භාවිත කරමින් වගුවේ හිස්තැන් පුරවන්න.

गच्छेः / अगच्छताम् / गच्छन्तु / गमिष्यति / गच्छेयम् / गमिष्यसि / अगच्छतम् / गच्छत
गच्छन्ति / गच्छाम / गमिष्यामि / अगच्छाव / गच्छथ / गच्छेताम् गमिष्यामः / गच्छावः

	लट्	लृट्	लङ्	लोट्	लिङ्
प्र.पु. एक.	गच्छति		अगच्छत्	गच्छतु	गच्छेत्
प्र.पु. द्वि.	गच्छतः	गमिष्यतः		गच्छताम्	
प्र.पु. बहु.		गमिष्यन्ति	अगच्छन्		गच्छेयुः
म.पु. एक.	गच्छसि		अगच्छः	गच्छ	
म.पु. द्वि.	गच्छथः	गमिष्यथः		गच्छतम्	गच्छेतम्
म.पु. बहु.		गमिष्यथ	अगच्छत		गच्छेत
उ.पु. एक.	गच्छामि		अगच्छम्	गच्छानि	
उ.पु. द्वि.		गमिष्यावः		गच्छाव	गच्छेव
उ.पु. बहु.	गच्छामः		अगच्छाम		गच्छेम

02. නිදසුන ඇසුරින් හිස්තැන් පුරවන්න.

	एकवचनम्	द्विवचनम्	बहुवचनम्
නිදසුන	वसति स्म = अवसत्	वसतः स्म = अवसताम्	वसन्ति स्म = अवसन्
०१.	पूजयति स्म =	स्म = अपूजयताम्	पूजयन्ति स्म =
०२.	= अरक्षत्	रक्षतः स्म =	= अरक्षन्
०३.	स्म =	कुरुतः स्म = अकुरुताम्	कुर्वन्ति = अकुर्वन्
०४.	= अचरत्	चरतः स्म =	=

03. සිංහලට පරිවර්තනය කරන්න.

०१. गच्छतः। ०२. गायावः। ०३. नमन्ति। ०४. वहामः। ०५. पठिष्यसि।
०६. म्लायति। ०७. नयसि। ०८. जयामि। ०९. धावथः। १०. हरन्ति।
११. नेष्यति। १२. भविष्यथ। १३. गमिष्यामि। १४. भजथ। १५. अतिष्ठम्।
१६. क्रीडिष्यतः। १७. करिष्यामि। १८. अवन्दत्। १९. अखादन्। २०. वादयिष्यावः।

04. සංස්කෘතයට පරිවර්තනය කරන්න.

01. කති. 02. (දෙදෙන) පාඩම් කරනු. 03. ගෙන යමි.
04. නාද කරති. 05. උසුලමු. 06. දකියි.
07. (දෙදෙන) කථා කරත්. 08. කරමි. 09. (දෙදෙන) ලියමු.
10. හිඳියි. 11. වෙත්වා ! 12. ගියෙහු.
13. පාඩම් කරාවා ! 14. දිව්වෝ ය. 15. බිවූහ.
16. වැන්දෙහි. 17. කීවා ය. 18. බිරුවේ ය.
19. කීවෙමු. 20. යව.

අභ්‍යාසය 4.3

01. හිස්තැනට සුදුසු ක්‍රියාපදය වරහන් තුළ ඇති නිර්දේශයන්ට අනුව සකසන්න.

०१. अश्वः शीघ्रं धावति। अहं शीघ्रं .... । (लट् - उ. पु. एक.)
०२. नराः समुद्रतीरं गच्छन्ति। वयं समुद्रतीरं .... । (लट् - उ. पु. बहु.)
०३. अहं संस्कृतं पठामि। त्वं संस्कृतं .... । (लट् - म. पु. एक.)

०४. त्वं क्षीरं पास्यसि। अहं क्षीरं .... । (लृट् - उ. पु. एक.)

०५. कर्मकराः प्रातः उत्तिष्ठन्ति। यूयं प्रातः .... । (लोट् - म. पु. बहु.)

०६. युवां दूरदर्शनं पश्यथः। आवां दूरदर्शनं .... । (लट् - उ. पु. द्वि.)

०७. गुरवः आसनेषु उपविशन्तु। यूयम् आसनेषु .... । (लोट् - म. पु. बहु.)

०८. यदा सूर्यः अस्तं याति। तदा अन्धकारं .... । (लृट् - प्र. पु. एक.)

०९. यावद् मम मित्रं न आगच्छति। तावद् अहं भोजनं .... । (लट् - उ. पु. एक.)

१०. अधिकारिणः कार्यालयम् अगच्छन्। यूयं कार्यालयम् .... । (लङ् - म. पु. बहु.)

ක්‍රියාකාරකම 4.2

01. පහත කථාව හඬනගා සාවධාන ව කියවන්න. ඔබ මෙතෙක් උගත් ආඛ්‍යාත පද යෙදී ඇති අයුරු අවබෝධ කරගන්න.

दुर्बुद्धिर्विनश्यति।

अस्ति मगधदेशे फल्लोत्पलनाम सरः। तत्र संकटविकटौ हंसौ **निवसतः**। कम्बुग्रीवनामेकः तयोर्मित्रम् एको कुर्मोऽपि तत्रैव प्रतिवसति स्म।



अथैकदा धीवराः तत्रा**गच्छन्**। तेऽ**कथयन्** - " वयं श्वः मत्स्यकूर्मादीन् **मारयिष्यामः**। " एतच्छ्रुत्वा कूर्मोऽ**वदत्** - " मित्रे किं युवाभ्यां धीवराणां वार्ता श्रुता? अधुना किमहं **करोमि** ? हंसौ **अवदताम्** - " प्रातो यदुचितं तत्कर्तव्यम्। " कूर्मोऽवदत् - " मैवम्। तद्यथाहम् अन्यं ह्रदं **गच्छामि** तथा **कुरुतम्**।" हंसाव**वदताम्** - " आवां किं **करवाव** ? कूर्मोऽवदत् - " अहं युवाभ्यां सह आकाशमार्गेणान्यत्र गन्तु**मिच्छामि**।

हंसौ अवदताम् – “ अत्र को उपायः ?” कच्छपो वदति – “ युवां काष्ठदण्डमेकं चञ्च्वा धारयताम्। अहं काष्ठदण्डमध्येऽलम्ब्य युवयोः पक्षबलेन सुखेन गमिष्यामि।” हंसौ अकथयताम् “ सम्भवति एष उपायः। किन्तु अत्रैकोपायोऽपि वर्तते। आवाभ्यां नीयमानं त्वामवलोक्य जनाः किञ्चिद् वदिष्यन्ति एव। यदि त्वमुत्तरं दास्यसि तदा तव मरणं निश्चितम्। अतः त्वमत्रैव वस।” तच्छ्रुत्वा क्रुद्धः कुर्मोऽवदत् – “ किमहं मूर्खः? उत्तरं न दास्यामि।” किञ्चिदपि न वदिष्यामि। अतोऽहं यथा वदामि तथा युवां कुरुतम्।

एवं काष्ठदण्डे लम्बमानं कूर्मं गोपालकः अपश्यन्। पश्चाद् अधावन् अवदन्। च – “ अहो महदाश्चर्यम्। हंसाभ्यां सह कूर्मोऽपि उड्डीयते।” कश्चिद् वदति– “ यद्ययं कूर्मः कथमपि निपतति तदा अत्रैव पक्त्वा खादिष्यामि।” अपरः अवदत्– “सरस्तीरे दग्ध्वा खादिष्यामि।” अन्योऽकथयत् –

“ गृहं नीत्वा भक्षयिष्यामि ” इति। तेषां तद् वचनं श्रुत्वा कूर्मः कुद्धो जातः। मित्राभ्यां दत्तं वचनं विस्मृत्य सोऽवदत् –

“यूयं भस्म खादत।” तत्क्षणमेव कूर्मो दण्डाद् भूमौ पतितः। गोपालकैः स मारितः। अत एवोक्तम्–

सुहृदां हितकामानां वाक्यं यो नाभिनन्दति।
स कूर्म इव दुर्बुद्धिः काष्ठाद् भ्रष्टो विनश्यति॥

විශේෂිත වරනැගීම් කිහිපයක්

√ दा (දෙයි) ලට් ලකාර පරස්මෛපදයෙහි			
पुरुषाः	एकवचन	द्विवचन	बहुवचन
प्रथम पुरुष	ददाति	दत्तः	ददति
मध्यम पुरुष	ददासि	दत्थः	दत्थ
उत्तम पुरुष	ददामि	दद्वः	दद्मः
√ शास् (අනුශාසනා කරයි) ලට් ලකාර පරස්මෛපදයෙහි			
पुरुषाः	एकवचन	द्विवचन	बहुवचन
प्रथम पुरुष	शास्ति	शिष्टः	शासति
मध्यम पुरुष	शास्सि	शिष्टः	शिष्ट
उत्तम पुरुष	शास्मि	शिष्वः	शिष्मः
√ हन् (නසයි) ලට් ලකාර පරස්මෛපදයෙහි			
पुरुषाः	एकवचन	द्विवचन	बहुवचन
प्रथम पुरुष	हन्ति	हतः	घ्नन्ति
मध्यम पुरुष	हंसि	हथः	हथ
उत्तम पुरुष	हन्मि	हन्वः	हन्मः
√ मि (විසිකරයි) ලට් ලකාර පරස්මෛපදයෙහි			
पुरुषाः	एकवचन	द्विवचन	बहुवचन
प्रथम पुरुष	मिनोति	मिनुतः	मिन्वन्ति
मध्यम पुरुष	मिनोषि	मिनुथः	मिनुथ
उत्तम पुरुष	मिनोमि	मिन्वः / मिनुवः	मिन्मः / मिनुमः
√ दरिद्रा (දිළිඳු වෙයි) ලට් ලකාර පරස්මෛපදයෙහි			
पुरुषाः	एकवचन	द्विवचन	बहुवचन
प्रथम पुरुष	दरिद्राति	दरिद्रितः	दरिद्रति
मध्यम पुरुष	दरिद्रासि	दरिद्रिथः	दरिद्रिथ
उत्तम पुरुष	दरिद्रामि	दरिद्रिवः	दरिद्रिमः

√ रुद् (අඬයි) ලට් ලකාර පරස්මෛපදයෙහි			
पुरुषाः	एकवचन	द्विवचन	बहुवचन
प्रथम पुरुष	रोदिति	रुदितः	रुदन्ति
मध्यम पुरुष	रोदिषि	रुदिथः	रुदिथ
उत्तम पुरुष	रोदिमि	रुदिवः	रुदिमः

√ रुध् (ආවරණය කරයි) ලට් ලකාර පරස්මෛපදයෙහි			
पुरुषाः	एकवचन	द्विवचन	बहुवचन
प्रथम पुरुष	रुणद्धि	रुन्धः	रुन्धन्ति
मध्यम पुरुष	रुणत्सि	रुन्द्धः	रुन्द्ध
उत्तम पुरुष	रुणध्मि	रुन्ध्वः	रुन्ध्मः

√ लू (බෙදයි) ලට් ලකාර පරස්මෛපදයෙහි			
पुरुषाः	एकवचन	द्विवचन	बहुवचन
प्रथम पुरुष	लुनाति	लुनीतः	लुन्वन्ति
मध्यम पुरुष	लुनासि	लुनीथः	लुनीथ
उत्तम पुरुष	लुनामि	लुनीवः	लुनीमः

√ अद् (කයි) ලට් ලකාර පරස්මෛපදයෙහි			
पुरुषाः	एकवचन	द्विवचन	बहुवचन
प्रथम पुरुष	अत्ति	अत्तः	अदन्ति
मध्यम पुरुष	अत्सि	अत्थः	अत्थ
उत्तम पुरुष	अद्मि	अद्वः	अद्मः

√ ग्रह् (ගනියි) ලට් ලකාර පරස්මෛපදයෙහි			
पुरुषाः	एकवचन	द्विवचन	बहुवचन
प्रथम पुरुष	गृह्णाति	गृह्णीतः	गृह्णन्ति
मध्यम पुरुष	गृह्णासि	गृह्णीथः	गृह्णीथ
उत्तम पुरुष	गृह्णामि	गृह्णीवः	गृह्णीमः

√ छिद् (කපයි) ලට් ලකාර පරස්මෛපදයෙහි			
पुरुषाः	एकवचन	द्विवचन	बहुवचन
प्रथम पुरुष	छिनत्ति	छिन्तः	छिन्दन्ति
मध्यम पुरुष	छिनत्सि	छिन्त्थः	छिन्त्थ
उत्तम पुरुष	छिनद्मि	छिन्द्वः	छिन्द्मः

√ चिन्त् ධාතුව (සිතයි) ලට් ලකාර පරස්මෛපදයෙහි			
पुरुषाः	एकवचन	द्विवचन	बहुवचन
प्रथम पुरुष	चेतति	चेतितः	चेतन्ति
मध्यम पुरुष	चेतसि	चेतिथः	चेतिथ
उत्तम पुरुष	चेतामि	चेतावः	चेतामः

गुणिनि गुणज्ञो रमते।

ගුණය දන්නා වූ තැනැත්තා ගුණවතා කෙරෙහි ඇලේ.

ज्ञानमार्गे ह्यहंकारः परिघो दुरतिक्रमः।

උඩඟුකම ඥාන මාර්ගයෙහි බලවත් බාධකයකි.

दर्दुरा यत्र वक्तारस्तत्र मौनं हि शोभनम्।

යම් තැනක මැඩියෝ කථාකරත් ද එහි නිහඬවීම යහපත් වේ.

०५
पञ्चमः पाठः।

रात्रिर्गमिष्यति भविष्यति सुप्रभातम्।

(රැය ගෙවී යන්නේ ය. පහන්දොර වන්නේ ය)

क्रियापदपरिचयः। ०२

අනාගත කාලය ලෘට් ලකාරය (භවිෂ්‍යති ලෘට්)

ලෘට් ලකාරය අනාගත කාලය දැක්වීම සඳහා භාවිත කෙරේ. මේ මොහොතේ පටන් මෙතෙක් සිදු නොවූ සියලු අනාගත ක්‍රියා මෙමගින් ප්‍රකාශ වේ.

जनकः चिन्तयति।

०१. मम पुत्रः सम्यक् पठिष्यति।

०२. वैद्यो भविष्यति।

०३. विदेशं गमिष्यति।

०४. धनं सम्पादयिष्यति।

०५. समाजसेवां करिष्यति।

०६. ग्रन्थान् लेखिष्यति।

ලට් ලකාර ක්‍රියාපද ලෘට් ලකාරයන්හි ප්‍රථමපුරුෂ ඒකවචනයෙහි යෙදෙන ආකාරය.

लिखति / धावति / गच्छति
ලියයි. / දුවයි. / යයි.
चलति / भवति / करोति
ඇවිදියි. / වෙයි. / කරයි.
जानाति / गायति
දනියි. /ගයයි.
पिबति / ददाति / तिष्ठति
බොයි. /දෙයි. / සිටියි.

ष्य

स्य

लेखिष्यति / धाविष्यति / गमिष्यति
ලියන්නේ ය. / දුවන්නේ ය. / යන්නේය.
चलिष्यति / भविष्यति / करिष्यति
ඇවිදින්නේ ය. / වන්නේ ය. / කරන්නේ ය.
ज्ञास्यति / गास्यति
දන්නේ ය. / ගයන්නේ ය.
पास्यति / दास्यति / स्थास्यति
බොන්නේ ය. / දෙන්නේ ය. / සිටින්නේ ය.

අනාගත කාලය ලෘට් (පරස්මෛපද)

ප්‍රත්‍යය සහ නිදර්ශන වරනැඟීම

	एकवचनम्	द्विवचनम्	बहुवचनम्	एकवचनम्	द्विवचनम्	बहुवचनम्
प्रथमपुरुष	स्यति	स्यतः	स्यन्ति	पठिष्यति	पठिष्यतः	पठिष्यन्ति
मध्यमपुरुष	स्यसि	स्यथः	स्यथ	पठिष्यसि	पठिष्यथः	पठिष्यथ
उत्तमपुरुष	स्यामि	स्यावः	स्यामः	पठिष्यामि	पठिष्यावः	पठिष्यामः

එහි සිංහල අර්ථය

පුරුෂ	ඒකවචන	ද්විවචන	බහුවචන
ප්‍රථමපුරුෂ	පාඩම් කරන්නේ ය	(දෙදෙන) පාඩම් කරන්නෝ ය	පාඩම් කරන්නාහ
මධ්‍යමපුරුෂ	පාඩම් කරන්නෙහි	(දෙදෙන) පාඩම් කරන්නෙහු	පාඩම් කරන්නෙහු
උත්තමපුරුෂ	පාඩම් කරන්නෙමි	(දෙදෙන) පාඩම් කරන්නෙමු	පාඩම් කරන්නෙමු

අනාගත කාලය ලෘට් (ආත්මනේපද)

ප්‍රත්‍යය සහ නිදර්ශන වරනැඟීම

	एकवचनम्	द्विवचनम्	बहुवचनम्	एकवचनम्	द्विवचनम्	बहुवचनम्
प्रथमपुरुष	स्यते	स्येते	स्यन्ते	पक्ष्यते	पक्ष्यते	पक्ष्यन्ते
मध्यमपुरुष	स्यसे	स्येथे	स्यध्वे	पक्ष्यसे	पक्ष्येथे	पक्ष्यध्वे
उत्तमपुरुष	स्ये	स्यावहे	स्यामहे	पक्ष्य	पक्ष्यावहे	पक्ष्यामहे

අභ්‍යාසය 5.1

01. हृ ධාතුව ළෘට් ලකාරපරස්මෛ පදයෙහි වරනගන්න.

पुरुषः	एकवचनम्	द्विवचनम्	बहुवचनम्
प्रथमपुरुष	हरिष्यति		
मध्यमपुरुष			
उत्तमपुरुष			

01. වර්තමානකාල ඒකවචන ක්‍රියා රූපයන්ට ගැළපෙන අනාගතකාල බහුවචන ක්‍රියාරූපය යා කරන්න. අර්ථ ද ලියන්න.

ලට් (වර්තමාන)	ළෘට් (අනාගත)	අර්ථ
नदति →	वदिष्यथ	(..............................)
गच्छामि	चलिष्यन्ति	(..............................)
वदसि	नदिष्यन्ति	(නාදකරන්නෝ ය.)
क्रीडामि	धाविष्यथ	(..............................)
चरसि	चरिष्यामः	(..............................)
चरामि	गमिष्यामः	(..............................)
चलति	क्रीडिष्यामः	(..............................)
धावसि	चरिष्यथ	(..............................)

අභ්‍යාසය 5.2

01. ලෘට් ලකාර පරස්මෛපද ඒකවචන ක්‍රියාරූපවලින් වාක්‍ය සම්පූර්ණ කර එම වාක්‍ය ද්විවචනයට හරවන්න.

නිදසුන :-

- कपिः फलानि खादिष्यति। (වඳුරා ගෙඩි කන්නේ ය.)
- कपी फलानि खादिष्यतः। (වඳුරෝ දෙදෙන ගෙඩි කන්නෝ ය.)

०१. शिक्षकः पाठं	................।	(හදාරන්නේ ය.)	०१.	....
०२. शिक्षिका श्लोकं	................।	(ගයන්නී ය.)	०२.	....
०३. बालकाः विद्यालयं	................।	(යන්නාහ.)	०३.	....
०४. कर्मकाराः कार्यं	................।	(කරන්නෝ ය.)	०४.	....
०५. त्वं भोजनम्	................।	(කන්නෙහි.)	०५.	....
०६. अहं वस्त्राणि	................।	(සෝදන්නෙමි.)	०६.	....
०७. अहं सायं गृहं	................।	(එන්නෙමි.)	०७.	....
०८. वयं चलनचित्रं	................।	(බලන්නෙමු.)	०८.	....
०९. वयं पत्रं	................।	(ලියන්නෙමු.)	०९.	....
१०. अहम् अन्नं	................।	(කන්නෙමි.)	१०.	....

02. පහත ශ්ලෝකය කියවා එහි ඇති ऌट् ලකාර ක්‍රියාපද උපුටා දක්වන්න. ඒවායේ අර්ථ ද ලියන්න.

रात्रिर्गमिष्यति भविष्यति सुप्रभातम्
भास्वानुदेष्यति हसिष्यति पङ्कजश्रीः।
इत्थं विचिन्तयति कोषगते द्विरेफे
हा हन्त हन्त नलिनीं गज उज्जहार॥

ලිට් ලකාරය (පරෝක්ෂ ලිට්)

මෙය අතීත කාලයට අයත් ආඛ්‍යාත විභක්තියකි. තමන්ගේ ඉන්ද්‍රියන්ට ප්‍රත්‍යක්ෂ නොවූ අන් අයගෙන් ලැබුණු ආරංචි මාත්‍රයෙක් තවත් අයකුට ප්‍රත්‍යක්ෂ කරලීමේ දී ලිට් ලකාරය භාවිත කෙරේ. සිංහලයේ මෙබඳු ක්‍රියා අගට 'ලු'යන ප්‍රත්‍යය යෙදේ.

रुरोद मम्लौ विरुराव जग्लौ बभ्राम तस्थौ विललाप दध्यौ ।
चकार रोषं विचकार माल्यं चकर्तवक्त्रं विचकर्ष वस्त्रम् ॥

(හැඬුවාලු. මැලවුණාලු. කෑගැසුවාලු. වෙහෙසට පත්වුණාලු. කැරකුණාලු. නැගිට සිටියාලු. විලාප කීවාලු. කල්පනාවට වැටුණාලු. කෝපවූවාලු. මල්දම කැඩුවාලු. මුහුණ පහුරුගා ගත්තාලු. වස්ත්‍රය ඇද ඉරුවාලු.)

ලට් ලකාර ක්‍රියාපද ලඞ් හා ලිට් ලකාරයන්හි ප්‍රථමපුරුෂ ඒකවචනයෙහි යෙදෙන ආකාරය

लट्	लङ्	लिट्
वदति	अवदत्	उवाद
करोति	अकरोत्	चकार
खादति	अखादत्	चखाद
पिबति	अपिबत्	पपौ
भवति	अभवत्	बभूव

लट्	लङ्	लिट्
चरति	अचरत्	चचार
ददाति	अददत्	ददौ
तिष्ठति	अतिष्ठत्	तस्थौ
पठति	अपठत्	पपाठ
पतति	अपतत्	पपात

ලිට් ලකාරය (පරෝක්ෂ ලිට්) (පරස්මෛපද)

ප්‍රත්‍යය සහ නිදර්ශන වරනැගීම

	एकवचनम्	द्विवचनम्	बहुवचनम्	एकवचनम्	द्विवचनम्	बहुवचनम्
प्रथमपुरुष	अ	अतुः	उः	बभूव	बभूवतुः	बभूवुः
मध्यमपुरुष	थ	अथुः	अ	बभूविथ	बभूवथुः	बभूव
उत्तमपुरुष	अ	व	म	बभूव	बभूविव	बभूविम

එහි සිංහල අර්ථය

පුරුෂ	ඒකවචන	ද්විවචන	බහුවචන
ප්‍රථමපුරුෂ	වීලු	(දෙදෙනෙක්) වූවෝලු	වූවෝලු
මධ්‍යම පුරුෂ	වූවෙහිලු	(දෙදෙනෙක්) වූවෙහුලු	වූවෙහුලු
උත්තමපුරුෂ	වූයෙම්ලු	(දෙදෙනෙක්) වූයෙමුලු	වූයෙමුලු

ලිට් ලකාරය (පරෝක්ෂ ලිට්) (ආත්මනේපද)

ප්‍රත්‍යය සහ වරනැගීම් නිදර්ශන

	एकवचनम्	द्विवचनम्	बहुवचनम्	एकवचनम्	द्विवचनम्	बहुवचनम्
प्रथमपुरुष	ए	आते	इरे	बभूवे	बभूवाते	बभूविरे
मध्यमपुरुष	से	आथे	ध्वे	बभूविषे	बभूवाथे	बभूविध्वे
उत्तमपुरुष	ए	वहे	महे	बभूवे	बभूविवहे	बभूविमहे

ක්‍රියාකාරකම 5.1

01. පහත සඳහන් ධාතූන් ලිට් ලකාර පරස්මෛපදයෙහි පන්තියේ සියලු දෙනා එක් ව ශබ්ද නගා වරනගන්න. මතකයෙන් කියවීමට හා ලිවීමට ද උත්සාහ කරන්න.

धातवः	प्र.पु. एक.	प्र.पु. द्वि.	प्र.पु. बहु.	म.पु. एक.	म.पु. द्वि.	म.पु. बहु.	उ.पु. एक.	उ.पु. द्वि.	उ.पु. बहु.
√ पठ्	पपाठ	पेठतुः	पेठुः	पेठिथ	पेठथुः	पेठ	पपाठ	पेठिव	पेठिम
√ पत्	पपात	पेततुः	पेतुः	पेतिथ	पेतथुः	पेत	पपात	पेतिव	पेतिम
√ स्था	तस्थौ	तस्थतुः	तस्थुः	तस्थाथ	तस्थथुः	तस्थ	तस्थौ	तस्थिव	तस्थिम
√ पा	पपौ	पपतुः	पपुः	पपाथ	पपथुः	पप	पपौ	पपिव	पपिम
√ कृ	चकार	चक्रतुः	चक्रुः	चकथ	चक्रथुः	चक्र	चकार	चकृव	चकृम
√ गम्	जगाम	जग्मतुः	जग्मुः	जगमिथ	जग्मथुः	जग्म	जगाम	जग्मिव	जग्मिम

අභ්‍යාසය 5.3

01. පහත කොටුවේ ඇති √ रुद् ධාතුවේ හා √ वस् ධාතුවේ ක්‍රියා රූපයන් නිවැරදි ව භාවිත කරමින් වගුවේ හිස්තැන් පුරවන්න.

रुरोद / रुरुदिम / रुरोदिथ / रुरुदुः / रुरुदिव/ रुरुदतुः / रुरुद / रुरुदथुः / रुरोद
उवास / ऊषथुः / ऊषीम / उवास / उवसिथ / ऊष / ऊषुः / ऊषिव / ऊषतुः

पुरुष	एकवचनम्	द्विवचनम्	बहुवचनम्
प्रथमपुरुष			
मध्यमपुरुष			
उत्तमपुरुष			

एकवचनम्	द्विवचनम्	बहुवचनम्

අභ්‍යාසය 5.4

01. පහත දක්වා ඇති ප්‍රථමපුරුෂ **लिट्** ලකාර ක්‍රියාපදයන් **लङ्** ලකාර ක්‍රියාපදයන්ට හරවන්න.

		लिट्			लङ्		
	धातु	एकवचनम्	द्विवचनम्	बहुवचनम्	एकवचनम्	द्विवचनम्	बहुवचनम्
	√ भू	बभूव	बभूवतुः	बभूवुः	अभवत्	अभवताम्	अभवन्
०१.	√ स्था	तस्थौ	तस्थतुः	तस्थुः	अतिष्ठत्		
०२.	√ दा	ददौ	ददतुः	ददुः			
०३.	√ खा	चखाद	चखादतुः	चखादुः	अखादत्		
०४.	√ पा	पपौ	पपतुः	पपुः	अपिबत्		
०५	√ लिख्	लिलेख	लिलिखतुः	लिलिखुः			
०६.	√ प्रच्	पप्रच्छ	पप्रच्छतुः	पप्रच्छुः			
०७.	√ श्रु	शुश्राव	शुश्रुवतुः	शुश्रुवुः	अश्रुणोत्		
०८.	√ चर्	चचार	चेरतुः	चेरुः		अचरताम्	
०९	√ मिल्	मिमेल	मिमिलतुः	मिमिलुः	अमिलत्		
१०.	√ पठ्	पपाठ	पेठतुः	पेठुः			
११.	√ हस्	जहास	जहासतुः	जहासुः		अहसताम्	
१२.	√ पत्	पपात	पेततुः	पेतुः	अपतत्		
१३.	√ या	ययौ	ययतुः	ययुः		अयाताम्	
१४.	√ दृश्	ददर्श	ददृशतुः	ददृशुः	अपश्यत्		
१५.	√ वच्	उवाच	ऊचतुः	ऊचुः	अवोचत्		
१६.	√ गम्	जगाम	जग्मतुः	जग्मुः	अगच्छत्		
१७.	√ जि	जिगाय	जिग्यतुः	जिग्युः			अजयन्
१८.	√ ज्ञा	जज्ञौ	जज्ञतुः	जज्ञुः	अजानात्		
१९.	√ सृ	ससार	सस्रतुः	ससृः		असरताम्	
२०.	√ घ्रा	जघ्रौ	जघ्रतुः	जघ्रुः	अजिघ्रत्		
२१.	√ गै	जगौ	जगतुः	जगुः	अगायत्		
२२.	√ रुष्	रुरोष	रुरुषतुः	रुरुषुः	अरोषत्		
२३.	√ म्लै	मम्लौ	मम्लतुः	मम्लुः	अम्लयत्		
२४.	√ नद्	ननाद	नेदतुः	नेदुः	अनदत्		
२५.	√ नम्	ननाम	नेमतुः	नेमुः			अनमन्

අභ්‍යාසය 5.4

01. පහත කොටුවේ ඇති ක්‍රියාරූප අදාළ ලකාරයන්ට වෙන් කරන්න.

तिष्ठथ / तिष्ठत / अतिष्ठम् / वसामि / वसेयुः / अवसन् / हरिष्यति / पपात / जहास / हसेत् / हसिष्यावः
स्मरतु / स्मरन्ति / अरक्षत / रक्षेयम् / ररक्ष / याचिष्यसि / याचताम् / ययाच / पिबामः/ पास्यति
अपिबः / पिबानि / गच्छन्तु / जगाम / गच्छेम / पठिष्यसि / नयतः / अलिखत् / पचेत्

लट्	लोट्	लङ्	लृट्	लिट्	विधिलिङ्

01. ලට්	>	වර්තමාන කාලය	>	स नगरं गच्छति ।
02. ලෘට්	>	අනාගත කාලය	>	स नगरं गमिष्यति ।
03. ලඞ්	>	අතීත කාලය	>	स नगरम् अगच्छत् ।
04. ලෝට්	>	ප්‍රාර්ථනාර්ථය	>	स नगरं गच्छतु ।
05. විධිලිඞ්	>	විධි, සම්භාවනාර්ථය	>	स नगरं गच्छेत् ।
06. ලිට්	>	පරෝක්ෂාතීතාර්ථය	>	स नगरं जगाम ।

අභ්‍යාසය 5.5

01. පහත කථාවෙහි වරහන් තුළ ඇති ධාතුවලින් අදාළ ලකාරයට අනුව ක්‍රියාරූප නිර්මාණය කොට හිස්තැන් පුරවන්න.

बुद्धिमान् काकः।

एकः काको आहाराय इतस्ततः ....। [भ्रम् - लङ्] तदा सः आपणात् एकम् अपूपम्..................... [अप + हृ - लङ्] पश्चात् वृक्षस्य उपरि .... [उप + विश् - लङ्] । स अचिन्तयत्- " अहो, महत् भाग्यं अहं स्वादिष्टम् अपूपं ....," [भक्ष् - लट् उ. ए.व] इति। तदा कश्चिद् जम्बूको तस्य वृक्षस्य समीपम् ....। [आ + गम् - लङ्] स काकस्य मुखेऽपूपम्....................., [दृश् - लङ्] सोऽचिन्तयत् - " केनापि उपायेन अपूपम् अपहरामि। " ततः शृगालस्तं काकम् ....। [वद् - लङ्] - " मित्र, चिरात् त्वां ....।[दृश् - लङ्] किं कुशली भवान्? खगेषु भवान् एव सुन्दरः, सुमधुरो गायकः। कृपया एकं गानम् ...., [गा - लोट्]

02. පහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

०१. अहं कदाप्यनृतं न वदिष्यामि।
०२. साधवः स्वल्पमपि पापं कर्तुमतीव लज्जन्ते।
०३. सायाह्ने आम्रफलानि वृक्षात् अपतन्।
०४. मम माता तण्डुलान् प्रक्षाल्य भाजने क्षिप्त्वा पचते।
०५. मूर्खस्य मांसानि वर्धन्ते कदापि प्रज्ञा न वर्धते।
०६. क्षणशः कणशश्चैव विद्यामर्थं च चिन्तयेत्।
०७. यदि काले मेघाः वर्षेयुः तर्हि विपुलं धान्यं भवेत्।
०८. त्यज दुर्जनसंसर्गं भज साधुसमागमम्।
०९.यदि माता नागच्छेत् तर्हि शिशुः विलपेत।
१०. स भूपतिरेकदा केनापि पठ्यमानं श्लोकद्वयं शुश्राव।

03. පහත සඳහන් වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කොට දේවනාගරී අක්ෂරවලින් ලියන්න.

01. අපි උත්සවයට සහභාගිවීමට පාසලට යන්නෙමු.
02. ඔබ අද මෙහි පැමිණෙහිවා.
03. බාලිකාවෝ උයනෙහි ක්‍රීඩා කොට ගෙදරට පැමිණියෝ ය.
04. සාගරයේ ශෝභාව දැකීමට මම එහි ගියෙමි.
05. ව්‍යාඝ්‍රයා ජලය බීමට ඔබමොබ ගියේ ය.
06. පියා පුතා දැක මෙසේ කීවේ ලු.
07. කැලයට යන්න එපා එහි බියකරු ව්‍යාඝ්‍රයක් සිටියි.
08. මිනිසා සැමදා සත්‍යය කිව යුතු ය. බොරු නොකිය යුතු ය.
09. මම ඊයේ පියා සමග නගරයට ගියෙමි.
10. කුරුල්ලෝ ආහාර පිණිස ගසින් ගසට පියාඹති.

किञ्चित्कालोपभोग्यानि यौवनानि धनानि च।

තරුණ බව හා ධනය ටික කලෙකින් භුක්තිවිඳ ගෙවී යයි.

कोऽवकाशो विवेकस्य हृदि कामान्धचेतसः।

කාමයෙන් අන්ධ වූ සිතැත්තාට විමසිලිමත් වන්නට කවර ඉඩක් ද?

को वा दुर्जनवागुरासु पतितः क्षमेण यातः पुमान्।

දුදනන්ගේ උගුල්වල හසු වූ කවර පුරුෂයෙක් නිරුපද්‍රැත ව ගියේ ද?

०६

षष्ठः पाठः।

उदारचरितानां तु वसुधैव कुटुम्बकम्।

(උතුම් චරිත ඇත්තවුන්ට ලොව ම එක පවුලකි)

सन्धिपरिचयः। ०१

- මෙම ඡේදය සාවධාන ව කියවන්න. එහි වර්ණ ගන්වා ඇති සන්ධිපද විමසා බලන්න.

कश्चित् कुक्कुर एकदा एकस्यां गवादन्यां पलालोच्चये निषण्ण आसीत्। अत्रान्तरे कोऽपि क्षुधितो वृषभस्तत्रागतः पलालमत्तुम्। कुक्कुरस्तं दृष्ट्वा तमुद्दिश्याभषत्। अथ वृषभोऽवदत् हे नीच पशो! त्वमिमं पलालं न खादसि मह्यं वा खादितुं न प्रयच्छसि। कोऽर्थस्ते मूर्ख तवानेन रक्षितेन पलालेन इति। इत्युक्त्वा स वृषभोऽन्यत्रागच्छत्।

- कश्चित् = कः + चित्
- कुक्कुर एकदा = कुक्कुरः + एकदा
- गवादन्यां = गवात् + अन्यां
- पलालोच्चये = पलाल + उच्चये
- निषण्ण आसीत् = निषण्णः + आसीत्
- अत्रान्तरे = अत्र + अन्तरे
- कोऽपि = कः + अपि
- वृषभस्तत्र = वृषभः + तत्र
- तत्रागतः = तत्र + आगतः
- पलालमत्तुम् = पलालम् + अत्तुम्
- कुक्कुरस्तं = कुक्कुरः + तं
- तमुद्दिश्याभषत् = तम् + उद्दिश्य + अभषत्
- वृषभोऽवदत् = वृषभः + अवदत्
- त्वमिमं = त्वम् + इमं
- कोऽर्थस्ते = कः + अर्थः + ते
- तवानेन = तव + अनेन
- इत्युक्त्वा = इति + उक्त्वा
- वृषभोऽन्यत्रागच्छत् = वृषभः + अन्यत्र + अगच्छत्

01. පහත සඳහන් වාක්‍යවල ඇති ස්වරසන්ධි උපුටා දක්වන්න.

०१. नाहं विद्याविक्रियं शासनशतेनापि करोमि।
०२. मातेव रक्षति पितेव हिते नियुङ्क्ते।
०३. विश्वेश्वरं विमुक्तिज्ञम्।
०४. महोद्यमं महाधैर्यम्।
०५. भूमावुपविश्यावदत्।
०६. तदालोकापवादः स्यात्।
०७. इत्युक्त्वोपविष्टः।
०८. बह्वपायोऽस्मिन्वने।
०९. सदैकस्थानविहारिणौ कालं नयतः।
१०. किं बहुना श्रूयतां ममैष सिंहनादः।
११. सचराचर लोकनायक।
१२. तद्यथानुश्रूयते ।

02. පහත සඳහන් ස්වරසන්ධි පද විසන්ධි කරන්න.

१.	नाहम्	२.	धनैश्वर्यम्	३.	देशाटनम्
४.	मधूदकम्	५.	नरैकत्वं	६.	विद्याभ्यासः
७.	प्रत्यक्षम्	८.	नरौदार्यम्	९	यतीन्द्रः
१०.	कन्याभरणम्	११.	महौषधः	१२.	वधूत्सवः
१३.	भूदकम्	१४.	इत्येव	१५.	मातृद्धिः
१६.	पूर्णेन्दुः	१७.	लघ्वाहार	१८.	नायकः
१९	कर्तृजुता	२०.	कर्त्रादि	२१.	महेच्छा
२२.	हितोपदेशः	२३.	मात्राज्ञा	२४.	सूर्योदयः
२५.	यथोक्तम्	२६.	तयासन्	२७.	देशोन्नतिः
२८.	सप्तर्षिः	२९	तेऽपि	३०.	वसन्तर्तुः
३१.	सदैव	३२.	अत्युत्तमम्	३३.	जलोघः
३४.	मतानुसारः	३५	विद्यार्थी	३६.	प्रतीक्षा
३७.	अतीव	३८.	सूक्तिः	३९	पितृर्द्धिः
४०.	तवैव	४१.	उपैति	४२.	तथैव
४३.	परमौषधम्	४४.	अत्यन्तम्	४६.	अन्वयः

03. පහත සඳහන් පදයුගල සන්ධි කරන්න.

०१. इति + आह	०२. मधु + ऊनम्
०३. कवि + ईश्वरः	०४. चन्द्र + आलोकः
०५. तदा + अहं	०६. करुणा + इन्दुः
०७. मया + उक्तम्	०८. देव + ऐश्वर्यम्
०९. नदी + अर्थम्	१०. भानु + अत्र
११. नै + अकः	१२. प्रति + एकम्
१३. वन + ओषधिः	१४. तेन + एव
१५. वर्षा + ऋतुः	

අභ්‍යාසය 6.2

01. පහත සඳහන් වාක්‍යවල ඇති ව්‍යඤ්ජන සන්ධි උපුටා දක්වන්න.

०१. कस्मिंश्चिद्वने स्थितास्तरवः करुणया तमपृच्छन्।

०२. चमत्कृतां तद्वार्तां श्रुत्वा स अकथयत्।

०३. तल्लिख्यतामध्यतनो दिवसः।

०४. न किञ्चिदर्थेन प्रयोजनम्।

०५. यद्यहं षण्मासाभ्यन्तरेव तव पुत्रान् पण्डितान् करिष्यामि।

०६. सुहृद्भेदं तावच्छृणुत।

०७. यस्यार्थाः स पुमाल्लोके।

०८. न सा विद्या न तद्धनम्।

०९. न तच्छिल्पं न सा कला।

१०. जायन्ते विरला लोके जलदा इव सज्जनाः।

02. පහත සඳහන් ව්‍යඤ්ජන සන්ධිපද විසන්ධි කරන්න.

१. शरदभ्र	२. तच्छविः	३. तल्लीलः
४. मनश्चञ्चलम्	५. जगन्नाथः	६. महच्चक्रम्
७. षण्मासाः	८. तल्लुनाति	९. महाञ्जयः
१०. चिन्मयम्	११. राजन्निह	१२. तच्छीलः
१३. तच्छात्रम्	१४. तवच्छत्रम्	१५. धावन्नश्वः
१६. मृच्छकटिकम्	१७. स्मरन्नुवाच	१८. भवांस्तनोति
१९. अजन्तः	२०. भवाल्लिखति	२१. कदाचिच्छय्यायां
२२. प्रागेव	२३. भवाञ्छूरः	२४. अङ्कितः

03. පහත සඳහන් විසන්ධිපද සන්ධි කරන්න.

०१. महान् + लाभः	०२. सुगन् + इह	०३. विद्वत् + जनः	०४. उद् + ज्वलः
०५. तत् + हित	०६. कः + चरति	०७. वाक् + विद्या	०८. दिक् + नागः
०९. स्व + छन्दः	१०. परि + छेदः	११. सत् + चारित्रः	१२. उत् + चारणः
१३. वाक् + दानम्	१४. षट् + अङ्गः	१५. सत् + गुणः	१६. वाक् + मयम्
१७. उत् + नतिः	१८. कस् + चित्	१९. सद् + जनः	

අභ්‍යාසය 6.3

01. පහත සඳහන් වාක්‍යවල ඇති සන්ධි උපුටා දක්වන්න.

०१. मधुरमिति किमुच्यते केवलं पीयूषमेव।
०२. किमागतोऽसि किन्ते नाम, कुतः समायातः।
०३. त्वं किङ्करिष्यसि।
०४. शीलराशिं शिवङ्करम्।
०५. निर्वादं निरहङ्कारम्।
०६. देव महाकुलसम्भूता एते राजपुत्राः।

०७.	श्रीमन्तं श्रीकरं शान्तं शान्तवेशं नमाम्यहम्।

०८.	किञ्चिद्वक्ष्यामि तच्छृणु।

०९.	वनेऽस्मिन् मृगाः चरन्ति।

१०.	अहं भवताम् अनुगृहीतोऽस्मि।

११.	सः मुख्यातिथेः स्वागतं करोति।

१२.	सुभाषितवचनानि नरं सन्मार्गं दर्शयन्ति।

१३.	सन्तोष एव सन्निधानम्।

१४.	सर्वे व्यवहाराः वाङ्मूलाः सन्ति।

१५.	भगवद्गीता अतिप्रसिद्धं पुस्तकम् अस्ति।

पङ्को हि नभसि क्षिप्तः क्षेप्तुः पततिं मूर्ध्नि।
අහසෙහි විසිකළ මඩ එය දැමූවහුගේ ම හිස මත වැටේ.

पद्मपत्रस्थितं वारि धत्ते मुक्ताफलश्रियम्।
නෙළුම් පතෙහි ජලය මුතු ඇටයක ශෝභාව දරයි.

परलोकजुषां स्वकर्मभिर्गतयो भिन्नपथा हि देहिनाम्।
මියගිය සත්ත්වයන්ට තම කර්ම අනුව වෙන් වූ මාර්ග ඇත.

०७
सप्तमः पाठः।

यत्ने कृते यदि न सिध्यति कोऽत्र दोषः।

(උත්සාහ කළමුත් ඵලයක් නොවුණ ද කිම මෙහි දෝෂය?)

सन्धिपरिचयः। ०२

විසර්ග සන්ධිය

अन्तः सारैरकुटिलैरच्छिद्रैः सुपरीक्षितैः।
मन्त्रिभिर्धार्यते राज्यं सुस्तम्भैरिव मन्दिरम्॥

ඉහත ශ්ලෝකයෙහි යටින් ඉරි ඇඳි

(1). अन्तः सारैः + अकुटिलैः + अच्छिद्रैः

(2). मन्त्रिभिः + धार्यते

(3). सुस्तम्भैः + इव යනාදි පරිදි විසන්ධි කළ හැකි ය. එහි දී සිදු වී ඇත්තේ "ඃ" ට "ර්" ආදේශවීමයි.

नामिन् ः + स्वर / घोष
ः ↓ र्

උදා :-
मन्त्रिभिः + धार्यते
मन्त्रिभ् + इ + ः + धार्यते
(नामिन्: इ) (ः ↓) (ඝෝෂ: धा)
मन्त्रिभि + र् + धार्यते
मन्त्रिभिर्धार्यते।

मुनिः + गच्छति
मुनि + ः + गच्छति
मुनि + र् + गच्छति
मुनिर्गच्छति

01. පහත උද්ධෘතයන්හි ඉරි ඇඳි පද විසන්ධි කරන්න.

०१. नीतिरेषा।
०२. न च तारागणैरपि।
०३. सर्वदेवमयस्यापि विशेषो नृपतेरयम्।
०४. नृपतेर्गृहसंमार्जनकर्ता गोरम्भो नाम सेवकः।
०५. किं निःशङ्को भूत्वा मुहुर्मुहुर्नर्दसि वृथा।
०६. व्याधिर्भेषजसंग्रहैश्च विविधैर्मन्त्रप्रयोगैर्विषम्।
०७. आकारैरिङ्गितैर्गत्या चेष्टया भाषणेन च।
०८. तत्किमावयोरनेन व्यापारेण।

02. (i) अः + अ

अः → उ (ආදේශය)

अ → (අවග්‍රහය ऽ)

अ + उ > ओ (ගුණවීම)

උදා :-

सोऽपि प्रणम्य
सः + अपि
स् + अः + अपि
स् + ओ + ऽपि
सोऽपि।

(ii) अः + घोषाक्षर

अः → उ (ආදේශය)

अ + उ > ओ (ගුණවීම)

උදා :-

वरमेको गुणीपुत्रः
वरमेकः + गुणीपुत्रः
वरमेक् + अः + गुणीपुत्रः
अः → ओ
वरमेको गुणीपुत्रः

- कः + अर्थः > कोऽर्थः
- नरः + अत्र > नरोऽत्र
- ततः + अपगतः > ततोऽपगतः
- देवः + याति > देवोयाति
- बालः + नमति > बालोनमति
- कः + गतः > कोगतः

අභ්‍යාසය 7.2

01. පහත උද්ධෘතයන්හි ඇතුළත් විසර්ග සන්ධිපද තෝරා විසන්ධි කරන්න.

०१. अकुलीनोऽपि मूर्खोऽपि भूपालं योऽत्र सेवते ।
अपि संमानहीनोऽपि स सर्वत्र प्रपूज्यते ॥

०२. शुद्रो वा यदि वान्योऽपि चण्डालोऽपि जटाधरः ।

०३. यत्ने कृते यदि न सिध्यति कोऽत्र दोषः ।

०४. वृद्धो वा वैराग्ययुक्तो वा शोकग्रस्तो वा ।

०५. परं ममापि भेको मेघनादो नाम मित्रं तिष्ठति ।

03. (i) आ (:) + स्वर/ घोष

↓

लोपश्

උදා :- बालिकाः गच्छन्ति ।

बालिका गच्छन्ति ।

අභ්‍යාසය 7.3

01. පහත සඳහන් වාක්‍ය සන්ධි කර නැවත ලියන්න.

०१. ताः आहुः ।

०२. सकोपाः ऊचुः ।

०३. वीराः युद्धात् न बिभ्यति ।

०४. अस्वस्थाः औषधं पिबन्ति ।

०५. गृहस्थाः भिक्षवे भिक्षां ददति ।

०६. दुराराध्या हि राजानः पर्वता इव सर्वदा ।

०७. सुदुष्टा मन्त्रसाध्याश्च राजानः पन्नगा इव ।

(ii) अ : + अ හැර සෙසු ස්වර
↓
लोपश्

උදා :- सूर्यः + उदयति
सूर्य उदयति

අභ්‍යාසය 7.4

01. පහත සඳහන් පද විසන්ධි කරන්න.

०१. पिङ्गलक आह। ०२. उन्मत्त इव। ०३. कम्बुग्रीव आह।
०४. दमनक आह। ०५. दूत आह।

04. सः / एषः + व्यञ्जनाक्षर
↓
: - लोपश्

උදා :- • सः + चरति • एषः + याति
स चरति एष याति

අභ්‍යාසය 7.5

01. විසන්ධි කරන්න.

०१. एष ते प्रत्ययः।
०२. ततः स मयोक्तः।
०३. स भूपतेर्दोषो न तेषाम्।
०४. स मातुलोऽपि नायातः।
०५. एष खलु तत्र न गच्छति।
०६. स स्वयमेवात्मानं वधाय नियोजयति।
०७. किन्तु एष कुत्र गतवान् इति न जानामि।
०८. स एव निधनं याति कीलोत्पाटीव वानरः।

05. (i) ः + च छ स → श्

• ततः + च > ततश्च

ः + ट ठ ष → ष्

• मुनिः + षष्टः > मुनिषष्टः

ः + त थ श → स्

• इतः + ततः > इतस्ततः

අභ්‍යාසය 7.6

01. යටින් ඉරි ඇඳි පද විසන්ධි කරන්න.

०१. एकश्चन्द्रस्तमो हन्ति ।
०२. नद्यश्च नार्यश्च सदृक्प्रभावास्तुल्यानि कूलानि कुलानि तासाम् ।
०३. शिवास्ते पन्थानः सन्तु ।
०४. अन्येद्युस्तं सार्थवाहं मिथ्याहुः ।
०५. वचस्तत्र प्रयोक्तव्यं यत्रोक्तं लभते फलम् ।
०६. दयाश्च नागाश्च वहन्ति चोदिताः ।
०७. न त्वां भूयस्तोषयिष्यामि ।
०८. मया सुगुप्तमन्त्रस्तव नियोदितः ।
०९. अन्यथा सुप्रसादश्चेति ।
१०. अथ तस्मिन्गते चतुरकश्चिन्तयामास ।

06. भोः / भगोः / अघोः + अब → ः लोपश्

• भोः + एति = भो एति
• भगोः + नमस्ते = भगो नमस्ते
• अघोः + याति = अघो याति

07. प्रातः / अन्तः / पुनः + अब

ः > र् आदेश

- प्रातः + अत्र > प्रातर् + अत्र = प्रातरत्र
- पुनः + अपि > पुनर् + अपि = पुनरपि

අභ්‍යාසය 7.7

01. සන්ධි කරන්න.

०१. अन्तः + अस्थि =

०२. प्रातः + आसः =

०३. अन्तः + आगतः =

०४. पुनः + उदयः =

०५. अन्तः + गतः =

०६. पुनः + भव =

08. විසර්ගයට "ර්" ආදේශ වූ විට, පරව "ර්" කාරය ඇත්නම්, එම "ර්" කාරය ලොප් වේ. ඊට පෙර සිටි ස්වරය දීර්ඝ වේ.

- पुनः + रमते
  पुन् + अ + ः + रमते
  पुन् + अ + र् + रमते
  पुन् + अ + र् + ~~र्~~ + अमते
  पुन् + आ + र् + अमते
  पुनारमते

අභ්‍යාසය 7.8

01. විසන්ධි කරන්න.

०१. कपीरसं ०२. हरीरत्या ०३. भानूरमते ०४. साधूरागं

02. පහත උද්ධෘතයන්හි විසර්ග සන්ධිපද තෝරා, ඒවා විසන්ධි කරන්න.

०१. अकुलीनोऽपि मूर्खोऽपि भूपालं योऽत्र सेवते।
अपि संमानहीनोऽपि स सर्वत्र प्रपूज्यते॥

०२. देव एष मयानीतः स सञ्जीवकः।

०३. शेषः सर्वोऽपि मृगजनो दूरीभूतस्तिष्ठति।

०४. करटक आह- कथमेतत्। सोऽब्रवीत्।

०५. शुद्रो वा यदि वान्योऽपि चण्डालोऽपि जटाधरः।
दीक्षितः शिवमन्त्रेण स भस्माङ्गीशिवो भवेत्॥

०६. ततश्च हा हा मुषितोऽस्मि चिरकालं श्रुतो मया तवापवादः।

०७. आदित्यचन्द्रावनिलोऽनलश्च द्यौर्भूमिरापो हृदयं यमश्च।
अहश्च रात्रिश्च उभे च संध्ये धर्मश्च जानाति नरस्य वृत्तम्॥

०८. अतिप्रसक्तैः पुरुषैर्यतस्ताः क्रीडन्ति काकैरिव लूनपक्षैः।

०९. अधोदृष्टिर्वदेत्कृत्वा पापं प्राप्तः सभां नरः।
तस्माद्यत्नात्परिज्ञेयश्चिह्नैरेतैर्विचक्षणैः॥

१०. पूज्यते यदपूज्योऽपि यदगम्योऽपि गम्यते।
अर्थेभ्योऽपि हि वृद्धेभ्यः संवृत्तेभ्यस्ततस्ततः॥

1. नामिनो रः।
2. (i) अतोऽत्युः।
   (ii) हबे।
3. (i) (ii) आदबे लोपश्।
4. सैषाद्धसे।
5. विसर्जनीयस्य सः।
6. भोसः भोसः।
7. अह्नो रो रात्रिषु।
8. (i) रः।
   (ii) रि लोपो दीर्घश्च।

ප්‍රකෘතිභාව සන්ධිය

इह **अमी अश्वा** इतस्ततो धावन्ति। (මේ අශ්වයෝ මෙහි ඒ මේ අත දුවති.)

अमी अश्वाः යන පද දෙක **इयं स्वरे** යන සන්ධි රීතියට අනුව සන්ධි කළ හැකි ය. එහෙත් මෙහි දී සන්ධි නො කෙරේ. මෙලෙස සන්ධි කළ හැකි තැන් සන්ධි නො කර, තැබීම **ප්‍රකෘතිභාව** නමින් හැඳින්වේ.

පළමු අවස්ථාව

अदस् ශබ්දයේ පුරුෂලිඞ්ග ප්‍රථමා බහුවචන **अमी** යන රූපය පර වර්ණ හා සන්ධි නොවේ.

	ඒකවචන	ද්විවචන	බහුවචන
अदस् >	असौ	अमू	अमी
	↓	↓	↓
	अश्वः	अश्वौ	अश्वाः
	असावश्वः	अम्वश्वौ	अमी अश्वाः

අභ්‍යාසය 7.9

०१. अमी + आदित्याः = ...

०२. अमी + अजाः = ...

०३. अमी + उत्तमाः = ...

०४. अमी + ईश्वराः = ...

०५. अमी + अग्रजाः = ...

දෙවන අවස්ථාව

- माता आह - दुहितः। शीघ्रं गत्वा **माले आनय** ।

(මව කීවා ය. දියණියනි, වහා ගොස් මල්මාලා දෙක ගෙන එන්න.)

ई - ऊ - ए අන්ත ද්විවචන රූප ද සන්ධි නොවේ.
अग्नी - पटू - माले

අභ්‍යාසය 7.10

१. अग्नी + अत्र = ...

२. दम्पती + इव = ...

३. मणी + इह = ...

४. कन्ये + अत्र = ...

५. साधू + आहतुः = ...

තෙවන අවස්ථාව

i. आ, औ, उ, इ, अ, ऋ, ऌ, ए, ऐ හා ओ නිපාත වශයෙන් යෙදෙන විට, ප්‍රකෘතියෙන් සිටී. සන්ධි නො වේ.

උදා :-

१. आ ! एवं मन्यसे । (අනේ! මෙහෙම ද සිතන්නෙ?)

२. नो अत्र स्थातव्यम् । (මෙහි නොසිටිය යුතු ය.)

३. उ उत्तिष्ठ । (ආ... නැගිටින්න.)

४. इ इन्द्रं पश्य । (අහෝ! ඉන්ද්‍ර දෙවියනි, බලන්න.)

५. अ अपेहि । (පිටවෙන්න.)

आ (आङ्) යන්න සන්ධි වේ.

आ उत्तमैः	=	ओत्तमैः	(මදක් උතුම් වූ)
आ ईक्षसे	=	एक्षसे	(ක්‍රියා යෝගයෙහි)
आ अमृतान्	=	आमृतान्	(මර්යාදා අර්ථයෙහි)
आ इन्द्रतः	=	एन्द्रतः	(අභිවිධි අර්ථය)

ii. अहो, आहो, उताहो, नो, हो, हहो, अथो, मिथो යන ओ කාරාන්ත නිපාත ද සන්ධි නො වේ.

- अहो ! अविवेकोऽस्मद्भूपतेः । (අනේ! අපේ රජතුමාට විවේකයක් නෑ)
- अहो ! आपतितं शोभनम् । (අහෝ! වියැකුණු සුන්දරත්වය)
- हे आचार्य । (පින්වත් ගුරුතුමනි,)

හතරවන අවස්ථාව

ප්ලුත ද සන්ධි නොවේ.

උදා :-

०१. देवदत्त एहि । (දේවදත්ත, එන්න)
०२. आगच्छ कृष्ण अत्र गौश्चरति । (කෘෂ්ණ, එන්න මෙහි ගවයෙක් හැසිරෙයි)
०३. तिष्ठ वधु एषाप्यागच्छति । (ස්වාමිදියණියනි, සිටින්න. ඇය ද එයි)
०४. श्रुणु हरे अत्रेयं गोपि । (විෂ්ණු දෙවියනි, අසන්න. මෙහි ගෙවිළිය වෙයි)
०५. पश्य ! गुरो एष मां ताडयति । (බලන්න ගුරුතුමනි, මොහු මට පහර දෙයි)

පස්වන අවස්ථාව

हे, है නිපාත ද සන්ධිකාර්යයට යටත් නොවී ප්‍රකෘතියෙන් ම සිටී.

- हे आर्ये (උතුමාණෙනි,)
- हे अग्रज (අයියේ,)
- है उत्तम (උතුමාණෙනි,)
- है ईश्वर (ඊශ්වර දෙවියනි,)

परहितनिरतानामादरो नात्मकार्ये ।
පරාර්ථයෙහි යෙදුණවුනට තම කටයුතු විෂයයෙහි ඇල්මක් නැත.

परिवर्तिनि संसारे मृतः को वा न जायते ।
පෙරළෙන සසරෙහි මළ කවරෙක් නූපදී ද?

परोपदेशवेलायां शिष्टाः सर्वे भवन्ति वै ।
අනුන්ට උපදෙස් දෙන අවස්ථාවේ දී ඒකාන්තයෙන් සියල්ලෝ ම ශිෂ්ටයෝ ය.

०८

अष्टमः पाठः ।

प्रारब्धमुत्तममजना न परित्यजन्ति ।

(උතුම් ජනයෝ ඇරඹි කටයුතු නොම අත්හරිති)

समासपरिचयः ।

द्विगुसमासः (संख्यापूर्वो द्विगुः ।)

විග්‍රහවාක්‍යය		සමාසපදය	අර්ථය
त्रयाणां भुवनानां समाहारः	-	त्रिभुवनम्	- තුන්ලොව
त्रयाणां सिंहलानां समाहारः	-	त्रिसिंहलम्	- ත්‍රිසිංහලය
अष्टानाम् अध्यायानां समाहारः	-	अष्टाध्यायी	- අෂ්ටාධ්‍යායී

අර්ථ වශයෙන් යම් සමූහයක් හෝ කොටසක් ගැන කියැවෙන සංඛ්‍යාවාචී පදයක් සහ උත්තරපදයක් අතර සිදුවන සංක්ෂිප්තතාව ද්විගු සමාසය යි. කර්මධාරය සමාසයෙන් මෙය වෙනස් වන්නේ විශේෂණ පදය ලෙස සංඛ්‍යාවාචී ශබ්දයක් යෙදෙන බැවිනි. මෙම සමාසයේ පූර්වපදය ලෙස යෙදෙන්නේ එම සංඛ්‍යාවාචී පදය යි. ඉහත දක්වා ඇති පද කිසියම් සංඛ්‍යාර්ථයක් ප්‍රකාශ කෙරේ.

द्विगुः
- समाहार द्विगुः
- असमाहार द्विगुः

01. සමාහාර ද්විගු සමාසයේ සමාසපදය නපුංසකලිඞ්ග ද, ඒකවචනාන්ත ද වේ.

- पञ्चानि शीलानि समाहारः - पञ्चशीलम् (පන්සිල්)
- पञ्चानां पात्राणां समाहारः - पञ्चपात्रम् (පාත්‍ර පහ)
- त्रयाणां रात्रीणां समाहारः - त्रिरात्रम् (තුන්රැය)
- त्रयाणां चीवराणाम् समाहारः - त्रिचीवरम् (තුන් සිවුර)

02. ඇතැම් ස්ථානයන්හි සමාහාර ද්විගු සමාසපදය ඊකාරාන්ත හා ස්ත්‍රීලිඞ්ග ද වේ.

- त्रयाणां लोकानां समाहारः - त्रिलोकी (තුන්ලොව)
- दशानां ग्रामानां समाहारः - दशग्रामी (ගම් දහය)
- सप्तानां शतानां समाहारः - सप्तशती (සත්සියය)
- चतुर्णां पथाम् समाहारः - चतुष्पथम् (සිවුමග)

03. මෙම සමාස ප්‍රභේදයේ සංඛ්‍යාවාචී පදය අගට යෙදෙන අවස්ථා ද ඇත.

- द्वयोः वचनयोः समाहारः - वचनद्वयम् (වචන දෙක)
- त्रयाणां द्वाराणां समाहारः - द्वारत्रयम् (තිදොර)
- त्रयाणां रत्नानां समाहारः - रत्नत्रयम् (තෙරුවන්)

04. අසමාහාර ද්විගු සමාසය ඒකත්වයට නොපැමිණෙයි. නපුංසකලිඞ්ග ද ඇසුරු නොකරයි. පරපදයේ ලිඞ්ගය ම ගනියි.

- दशाश्च ते ऋषयश्च - दशर्षयः (ඍෂිවරු දස දෙනෙක්)
- अष्टौ च ताः स्त्रियश्च - अष्टस्त्रियः (ස්ත්‍රීන් අට දෙනෙක්)
- सप्त च तानि पद्मानि - सप्तपद्मानि (සත්පියුම්)

අභ්‍යාසය 8.1

1. පහත සඳහන් සමාස විග්‍රහයන් සඳහා වූ නිවැරදි සමාසපදය ලියන්න.

०१. सप्तानां पदानां समाहारः .... (සත්පියවර)
०२. शतस्य शब्दानां समाहारः .... (සියක් ශබ්ද)
०३. चतुर्णां सूत्राणां समाहारः .... (සිවු සූත්‍ර)
०४. पञ्चानाम् अङ्गानां समाहारः .... (පසඟ)
०५. त्रयाणां लक्षणानां समाहारः .... (තිලකුණු)
०६. त्रयाणां दिनानां समाहारः .... (තෙදින)
०७. पञ्चानां वटानां समाहारः .... (නුගගස් පහ)
०८. सप्तानां अब्दानां समाहारः .... (සත්වසක්)
०९. दशानां रात्रीणां समाहारः .... (දසරැයක්)
१०. पञ्चानां मञ्चानां समाहारः .... (ඇඳන් පහ)
११. त्रयोः पात्रयोः समाहारः .... (පාත්‍ර තුන)
१२. अष्टानां पादानां समाहारः .... (අටපාද)

2. පහත සඳහන් සමාසපදයන්හි විග්‍රහ වාක්‍යය සකසන්න.

०१. पञ्चवटी .... ०२. पञ्चगवम् ....
०३. त्रिरात्रम् .... ०४. पञ्चपात्रम् ....
०५. त्रिचैत्यम् .... ०६. द्विपात्रम् ....
०७. चतुर्युगम् .... ०८. पञ्चराजी ....
०९. पञ्चमालम् .... १०. चतुर्बुद्धी ....

कर्मधारयसमासः (कर्मधारयस्तुल्यार्थे ।)

मधुरवचनम्
शीघ्रगामी
धर्मजीवितम्
पादपद्मम्

ඉහත වෘත්තයේ ඇත්තේ නිතර අපට හමුවන වචන කිහිපයකි. මිහිරි වචනය, වේගවත් ගමන, දැහැමි ජීවිතය, පා පියුම යනු උක්ත ශබ්දයන්ගේ අනුපිළිවෙළ අර්ථයි. මේවා සකස් වී ඇත්තේ කිසියම් විශේෂ්‍යයක් හෝ විශේෂණයක් මුල් වීමෙනි. එබැවින් විශේෂ්‍ය හා විශේෂණ පදයන්ගේ සංක්ෂිප්තතාව තුළින් සැකසෙන පද කර්මධාරය සමාසයට අයත් වේ. මෙය උත්තර පද ප්‍රධාන සමාසයකි.

විග්‍රහවාක්‍යය		සමාසපදය	අර්ථය
• नीलश्च असौ आकाशश्च	=	नीलाकाशः	(නිල් අහස)
• वीरश्च सः पुरुषश्च	=	वीरपुरुषः	(වීරපුරුෂයා)
• पवित्रञ्च तत् स्थानञ्च	=	पवित्रस्थानम्	(පිරිසිදු ස්ථානය)
• शारिपुत्रश्च सः स्थविरश्च	=	शारिपुत्रस्थविरः	(සැරියුත් තෙර)
• मन्दञ्च तत् शीतलञ्च	=	मन्दशीतलम्	(මඳසිසිල)

මෙසේ එක ම වස්තුවක් හැඟවෙන යෝග්‍ය වූ විශේෂ්‍ය විශේෂණ පදයන්ගේ සංයෝගයෙන් කර්මධාරය සමාසය නිර්මාණය වන බව පැහැදිලි ය. සමස්ත සමාසයේ ලිඞ්ගය තීරණය වන්නේ පරපදයට අනුව ය.

- विद्याधनम् (විද්‍යාධනය)
- महाजलम् (විශාල ජලය)
- धीरपुरुषः (දිරිමත් පුරුෂයා)
- वङ्गानदी (වක්නදිය)

पूर्व ශබ්දය සැමවිට ම සමාසපදයේ අගට එකතු වේ.

- भूतपूर्व (පෙරවූ)
- दृष्टपूर्व (පෙරදුටු)
- कृतपूर्व (පෙරකළ)
- श्रुतपूर्व (පෙර ඇසූ)

කර්මධාරය සමාසයෙහි ප්‍රභේද නමයක් දැකිය හැකි ය. පහත වගුවෙහි දැක්වෙන්නේ එම සමාස ප්‍රභේද හා ඒවාට අදාළ උදාහරණ යි.

नाम	विग्रहः	समासः	अर्थः
१. विशेषणपूर्वपदः	दुष्टश्च सः नरश्च प्रिया च सा भार्या च मधुरञ्च तं फलञ्च	दुष्टनरः प्रियभार्या मधुरफलम्	නපුරු මිනිසා ප්‍රිය බිරිඳ මිහිරි ගෙඩිය
२. विशेषणोत्तरपदः	अश्वघोषश्च सः यतिश्च ब्राह्मणश्च सः धीरश्च पुलस्तिश्च सः मुनिश्च	अश्वघोषयतिः ब्राह्मणधीरः पुलस्तिमुनिः	අශ්වඝෝෂ හිමි දිරිමත් බමුණා පුලස්ති මුනිවරයා
३. विशेषणोभयपदः	दृढश्च सः शीतलश्च रमणीया च सा शुक्ला च शीतञ्च तं उष्णञ्च	दृढशीतलः रमणीयशुक्ला शीतोष्णम्	දැඩි සීතල මනහර සුදු සීතල උෂ්ණ
४. उपमानपूर्वपदः	चन्द्र इव मुखम् शैल इव स्तब्धः अग्नि इव दीप्तः	चन्द्रमुखम् शैलस्तब्धः अग्निदीप्तः	සඳවත ගල්කණුව ගිනි වැනි දීප්තිය
५. उपमानोत्तरपदः	सिंहः इव नरः पद्मम् इव पादः लता इव तनुः	नरसिंहः पादपद्मः तनुलता	සිංහයෙකු වැනි මිනිසා පාපියුම වැලක් වැනි සිරුර
६. सम्भावनापूर्वपदः	गुण इति बुद्धिः श्रीपादः इति पर्वतः तृष्णा इति व्याधिः	गुणबुद्धिः श्रीपादपर्वतः तृष्णाव्याधिः	ගුණබුද්ධි ශ්‍රී පාද පර්වතය තෘෂ්ණා රෝගය
७. अवधारणापूर्वपदः	धर्म एव जीवितम् गुरुः एव देवः तपः एव धनम्	धर्मजीवितम् गुरुदेवः तपोधनम्	දැහැමි දිවිය ගුරු දෙවියා තපස් ධනය
८. न निपात पूर्वपदः	न आगतः न गुणः न कालः	अनागतः अगुणः अकालः	නොපැමිණි අගුණ අකල්
९ प्रादि पूर्वपदः	प्रकृष्टः गुणः कुत्सितः कविः प्रकृष्टः आचार्यः	प्रगुणः कुकविः प्राचार्यः	වඩාගුණ නරක කවියා උතුම් ගුරුවරයා

උදාහරණ :-

नीलमेघः

මෙහි **नील** යනු විශේෂණ පදය යි. එය පූර්වපදය ලෙස සිටී. **मेघः** යනු උත්තරපදය යි.

नीलश्च सः मेघश्च – नीलमेघः (නිල් වලාකුල)

අභ්‍යාසය 8.2

1. පහත සඳහන් විග්‍රහ වාක්‍යවලට අදාළ සමාස සකසමු.

०१. महान् च असौ प्रभूः च	....	(මහා ප්‍රභූවරයා)
०२. सुन्दरी च सा नारी च	....	(සොඳුරු ස්ත්‍රිය)
०३. महान् च असौ धनिकः च	....	(මහා ධනවතා)
०४. उदारः च असौ जनः	....	(උතුම් ජනයා)
०५. चरणः कमलम् इव	....	(පාපියුම)
०६. शुक्लः च असौ अश्वश्च	....	(සුදු අශ්වයා)
०७. नीलं च तत् कण्ठं च	....	(නිල් ගෙළ)
०८. चन्दन इव शीतला	....	(සඳුන් සිසිල)
०९. दुग्धम् इव धवलाः	....	(කිරි මෙන් සුදු)
१०. नवनीतम् इव कोमलम्	....	(ගිතෙල් මෙන් මොළොක්)
११. पीतं च तत् अम्बरम्	....	(කහ සිවුර)
१२. दुष्टश्च सः जनः च	....	(නපුරු මිනිසා)

2. ඉහත සඳහන් සමාසපද අධ්‍යයනය කරමින් පහත සමාසපදයන්හි විග්‍රහ වාක්‍ය සොයමු.

• रम्यलता	....	• विद्याधनम्	....
• मुखकमलम्	....	• श्वेतपद्मानि	....
• अनागत	....	• कुपुत्रः	....
• ब्राह्मणपण्डितः	....	• अकृतम्	....
• महापुरुषः	....	• गुणबुद्धिः	....

3. පහත වාක්‍ය අධ්‍යයනය කර සමාස පද සාදන්න. එම වාක්‍යවල අර්ථ ද ලියන්න.

०१. सरसि रक्तानि कमलानि विकसितानि सन्ति ।

०२. सतां चित्तम् उत्पलम् इव कोमलं भवति ।

०३. तत्र एकं हिमधवलं गृहम् अस्ति ।

०४. माता पुत्रस्य मुखकमलं पश्यति ।

०५. समुद्रमन्थनात् निर्गतं गर्गरं महता वेगेन नीरम् प्रति आगतम् ।

गर्गरं - දියසුළිය

बहुव्रीहि समासः (बहुव्रीहिरन्यार्थे ।)

योगीश्वरं दशबलं लोकज्ञं लोकपूजितम् ।
लोकाचार्यं निराचार्यं लोकनाथं नमाम्यहम् ॥

සමාස වන පදයන්හි අර්ථයට පරිබාහිර වෙනත් අර්ථයක් ඉස්මතු කරලීම දක්නට ලැබෙන්නේ බහුව්‍රීහි සමාසයේ යි. මෙහි ප්‍රමුඛ වන්නේ ම සමාස පදය නොව අන්‍යපදය යි.

විග්‍රහවාක්‍යය		සමාසපදය		අන්‍යපදය
• योगीनाम् ईश्वरं यः सः	>	योगीश्वरः	=	बुद्धः
• दशानि बलानि यस्य सः	>	दशबलः	=	बुद्धः
• त्रीणि नेत्राणि यस्य सः	>	त्रिनेत्रः	=	शिवः
• पीतं क्षीरं येन सः	>	पीतक्षीरः	=	बालः
• बहूनि फलानि यस्य सः	>	बहुफलः	=	वृक्षः
• चक्रं पाणौ यस्य सः	>	चक्रपाणिः	=	शक्रः
• लम्बौ कर्णौ यस्य सः	>	लम्बकर्णः	=	क्षत्रियः
• धर्मे बुद्धिः यस्य सः	>	धर्मबुद्धिः	=	शारिपुत्रः

- මෙහි විශේෂත්වය වනුයේ අන්‍ය පදයේ ලිඞ්ගය ගැනීම යි. එම නිසා සමාසපදය එක් ලිඞ්ගයකට අයත් වුව ද අන්‍ය පදයේ බලපෑමට අනුව ලිඞ්ගය තීරණය වේ.

- විග්‍රහ වාක්‍යයේ දී එම අන්‍යාර්ථය ප්‍රකාශ කිරීම පිණිස **यद्, तद्, एतद्, इदम् ,अदस्** යන සර්වනාම ශබ්දයන්හි පද භාවිත කරයි.

त्रीणि नेत्राणि यस्य सः > त्रिनेत्रः = शिवः මෙහි 'ශිවඃ' යන අන්‍යාර්ථය හැඟවීම සඳහා යොදාගෙන ඇත්තේ "**यस्य**" යන **यद्** ශබ්දයේ ෂෂ්ඨී විභක්ති ඒකවචනයත් **तद्** ශබ්දයේ ප්‍රථමා විභක්ති ඒකවචනයත් බව පැහැදිලි ය.

- විභක්ති අර්ථ වශයෙන් බහුව්‍රීහි සමාසයෙහි ප්‍රභේද සතකි.

විභක්ත්‍යර්ථ නාමය	විග්‍රහවාක්‍යය	සමාසපදය	අන්‍යපදය
1. ප්‍රථමාර්ථ බහුව්‍රීහි	सह पुत्रेण यो वर्तते सः	सपुत्रः	जनकः
2. ද්විතීයාර්ථ බහුව්‍රීහි	प्राप्तम् उदकं यं सः	प्राप्तोदकः	ग्रामः
3. තෘතීයාර්ථ බහුව්‍රීහි	पीतं क्षीरं येन सः	पीतक्षीरः	बालः
4. චතුර්ථ්‍යර්ථ බහුව්‍රීහි	दत्तः पशुः यस्मै सः	दत्तपशुः	विप्रः
5. පඤ්චම්‍යර්ථ බහුව්‍රීහි	उद्धृतं जलम् यस्मात् सः	उद्धृतजलम्	कूपम्
6. ෂෂ්ඨ්‍යර්ථ බහුව්‍රීහි	बहूनि फलानि यस्य सः	बहुफलः	वृक्षः
7. සප්තම්‍යර්ථ බහුව්‍රීහි	बहूनि मूलानि यस्मिन् सः	बहुमूलः	वृक्षः

- විවිධ ලක්ෂණයන්ට අදාළ ව බහුව්‍රීහි සමාසය තවත් ප්‍රභේද එකොළොසක් හඳුනාගත හැකි ය.

සමාස ප්‍රභේදය	විග්‍රහවාක්‍යය	සමාසපදය	අන්‍යපදය
ද්විපද බහුව්‍රීහි	छिन्नो वृक्षो येन सः	छिन्नवृक्षः	फरसुः
ත්‍රි පද බහුව්‍රීහි	मत्ता बहवो मातङ्गा यस्मिंस्तत्	मत्तबहुमातङ्गम्	वनं
සංඛ්‍යා පූර්ව පද බහුව්‍රීහි	शतानि पत्राणि यस्य सः	शतपत्रम्	पद्मम्
සංඛ්‍යෝත්තර පද බහුව්‍රීහි	विंशतिः समीपे ये वर्तन्ते	उपविंशाः	नराः
සංඛ්‍යෝභය පද බහුව්‍රීහි	द्वौ न त्रयो वा ये ते	द्वित्राः	नराः
උපමාන පූර්ව පද බහුව්‍රීහි	चन्द्रः इव मुखं यस्य सः	चन्द्रमुखः	बालकः
සහ පූර්ව පද බහුව්‍රීහි	शिष्येण सह वर्तते इति	सशिष्यः	गुरुः
න පූර්ව පද බහුව්‍රීහි	नास्ति समो यस्य सः	असमः	बुद्धः
ප්‍රාදි පූර්ව පද බහුව්‍රීහි	प्रकृष्टो वातो यस्मिन् सः	प्रवातः	देशः
දිගන්තරාල ලක්ෂණ බහුව්‍රීහි	पूर्वस्याश्च उत्तरस्याश्च दिशोः यदन्तरालम्	पूर्वोत्तरा	ऐशानीदिशा
ව්‍යතීහාර ලක්ෂණ බහුව්‍රීහි	केशेषु केशेषु गृहीत्वा इदं युद्धं प्रवृत्तमिति	केशाकेशी	युद्धम्

01. පහත වාක්‍යයන්හි ඇති සමාස පද තෝරන්න. සමාස නොකරන ලද පද සමාස කරන්න. වාක්‍යයන්හි අර්ථ ද ලියන්න.

०१. महात्मा बुद्धः विनयशीलः आसीत्।
०२. सिद्धार्थः शास्त्रेषु पारङ्गतः आसीत्।
०३. सा दिनं दिनं प्रति दानं करोति स्म।
०४. हंसस्य पक्षाः दुग्धधवलाः सन्ति।
०५. युधिष्ठिरः भीमः अर्जुनः च कुन्त्याः पुत्राः आसन्।
०६. संसारः मरणशीलः अस्ति।
०७. सा पीतम् अम्बरं धारयति।
०८. सप्ताहे सप्तदिनानि भवन्ति।
०९. अहं भवतः शरणम् आगता।
१०. वृक्षारूढः वानराः कूर्दन्ते।
११. अविवेकः परमापदां पदम्।
१२. सः प्रत्यहं पठति यथेच्छं वदति।
१३. किं इदम् अनुरूपं साधु जनस्य ?
१४. कोकिलमयूरौ मधुरेण कूजतः।
१५. सिंहात् भीतः बालः कम्पते।
१६. बालकः अष्टाध्यायीं स्मरति।
१७. पाणिपादं प्रक्षाल्य भोजनं कुरु।
१८. तव पुत्राः च पौत्राः च चिरं जीवतु।
१९. संसारे जितेन्द्रियः एव सुखी।
२०. तत्र एका सुन्दरकन्या अस्ति।

पीत्वा मोहमयीं प्रमादमदीरामुन्मत्तभूतं जगत्।

මුළාව ඇති කරන පමාව නමැති සුරාව බී ලෝකයා උන්මත්තක වී ඇත.

पुण्यस्यफलमिच्छन्ति पुण्यं नेच्छन्ति मानवाः।

මිනිස්සු පින්වල ඵලය කැමති වෙති. පින් කිරීමට කැමති නොවෙති.

पुण्यैरेव हि लभ्यते सुकृतिभिः सत्संगतिर्दुर्लभा।

දුර්ලභ වූ සත්පුරුෂ ආශ්‍රය පුණ්‍යවන්තයන්ට ලැබෙන්නේ පින නිසා ම නොවේ ද?

०९

नवमः पाठः।

जननी जन्मभूमिश्च स्वर्गादपि घरीयसी।

(මව ද උපන් බිම ද ස්වර්ගයටත් වඩා වටී)

तद्धितपरिचयः। ०१

නාමපදවල අන්තයෙහි විශේෂ අර්ථවත් ප්‍රත්‍යය යොදා සාදාගනු ලබන නාම විශේෂය තද්ධිත නම් වේ. මෙම තද්ධිත ප්‍රත්‍යය නාමයන්ට අතිශය හිතවත් ව නොයෙක් අර්ථ ලබාදීම සඳහා අනුග්‍රහ දක්වයි. තද්ධිත නාමයන් බොහෝ සෙයින් අර්ථයට සුදුසු ලිඞ්ග ඇත්තේ වේ. අව්‍යය තද්ධිත අලිඞ්ගික වේ. පහත දැක්වෙන පරිදි තද්ධිතයන්ගේ ලිඞ්ගභේදය හඳුනාගත හැකි ය.

- අපත්‍යාර්ථ තද්ධිතයෙහි इन्/ एरण् හා අල්පාර්ථයෙහි डिमन् (इमन्) ප්‍රත්‍යයෝ පුරුෂලිඞ්ග වෙති.
- භාවාර්ථ ता සමූහාර්ථයෙහි ता / या / इनी / कड्या යන ප්‍රත්‍යාන්තයෝ ස්ත්‍රීලිඞ්ග වෙති.
- භාවාර්ථයෙහි त्व / यण् දෙක ද कण्/ यण्/ इकण्/ अण्/ घ्वण् සමූහාර්ථයෙහි ප්‍රත්‍යාන්තයෝ නපුංසකලිඞ්ග වෙති.

මේ විශේෂ කාරණය පිළිබඳ අවධානය යොමු කරමින් ඔබ ඉගෙනගත් තද්ධිත පිළිබඳ නැවත ආවර්ජනය කරන්න.

තද්ධිත ප්‍රයෝජන

- එක් පදයක් වීම
- ඒකවිභක්තික වීම
- චමත්කාරජනක බව
- ව්‍යක්ත බව
- ලිවීමේ පහසුව ඇතිවීම
- වාක්‍ය අලංකාර කිරීම
- වාක්‍යයන්ගේ කෙටි බව ඇති වීම
- ඕජෝ ගුණය
- සුබෝච්චාරණය

ආදි වශයෙන් සමාසයෙන් ලැබෙන ප්‍රයෝජන තද්ධිතවලින් ද ලැබේ. එහෙත් පදවල වඩාත් සංක්ෂිප්ත බව ඇති වන්නේ තද්ධිත ව්‍යාකරණාංගයෙනි.

උදාහරණ :-

- श्रमणस्य + अपत्यम् > श्रमणापत्यम् (समास)
- श्रमण् + एर > श्रामणेरः (तद्धित)

තද්ධිත වර්ග

1. අපත්‍යාර්ථ තද්ධිතය
2. භාව තද්ධිතය
3. අස්ත්‍යර්ථ තද්ධිතය
4. සමූහාර්ථ තද්ධිතය
5. අතිශයාර්ථ තද්ධිතය
6. අනේකාර්ථ තද්ධිතය
7. සංඛ්‍යා තද්ධිතය
8. අව්‍යය තද්ධිතය

I. අතිශයාර්ථ තද්ධිතය

අතිශයාර්ථයෙහි යෙදෙන ප්‍රත්‍යය 04කි.

तर तम ईयस् इष्ठ

ක්‍රියා නාමයන් ඇතුළු සියලු ම නාමයන් කෙරෙන් तर / तम ප්‍රත්‍යද්වය ද, සියලු ම ගුණ නාමයන් කෙරෙන් ईयस् හා इष्ठ ප්‍රත්‍යද්වය ද භාවිත වේ.

तर / तम ප්‍රත්‍යය

०१. पञ्चम्यायां कक्ष्यायां अध्ययने नियुक्तछात्रेषु रतनसारः पटुतमः भवति।
(පස්වැනි පන්තියේ අධ්‍යයනයේ නියුතු සිසුන් අතුරෙන් රතනසාර දක්ෂතම වෙයි.)

०२. चतुर्थ्यायां कक्ष्यायां अधीतः रतनसारः सुमनसारात् पटुतरः अभवत्।
(හතරවැනි පන්තියේ ඉගෙනගත් රතනසාර සුමනසාරට වඩා දක්ෂ විය.)

වණිගන්වා ඇති පදයන්හි එන **पटु** යන මූලික නාමයෙන් "දක්ෂ" යන අර්ථය ද ඊට ප්‍රත්‍යය ගන්වා නිපදවාගත් **पटुतर** යන පදයෙන් "අතිශය දක්ෂයා" යන අර්ථය ද ලැබේ. " **तम** " ප්‍රත්‍යය භාවිත වන්නේ "ඉතා අධික" යන අර්ථයෙහි ය.

■ " तर " ප්‍රත්‍යය දෙකකින් හෝ තුනකින් අධික බව තුලනය කිරීමේ දී ද, ඊට වැඩි ගණනකින් අධික වස්තුව හෝ පුද්ගලයා තේරීමේ දී " तम " ප්‍රත්‍යය ද යොදා ගැනේ.

මූලික නාමය	දෙදෙනෙකු අතුරින්	බොහෝ දෙනෙකු අතුරින්
पटु	पटुतर	पटुतम
දක්ෂ	වඩා දක්ෂ	දක්ෂතම
සාමාන්‍ය	තුලනාත්මක	අතිශය වාචක
दीर्घ (දික්)	दीर्घतर (වඩා දික්)	दीर्घतम (ඉතා දික්)
प्रिय (ප්‍රිය වූ)	प्रियतर (වඩා ප්‍රිය)	प्रियतम (ඉතා ප්‍රිය)
पाप (පාප)	पापतर (වඩා පාපී)	पापतम (ඉතා පාපී)

උදා :-

මුල් නාමය	ප්‍රත්‍යය	තද්ධිත ප්‍රකෘතිය	තද්ධිත පදය	අර්ථය
लघु	तर	लघुतर	लघुतरः	වඩා සැහැල්ලු
लघु	तम	लघुतम	लघुतमः	සැහැල්ලුතම
लघु	ईयस्	लघीयस्	लघीयान्	වඩාත් සැහැල්ලු
लघु	इष्ठ	लघीष्ठ	लघीष्ठः	සැහැල්ලුතම

वत् / मत् / विन् ප්‍රත්‍යයාන්ත තද්ධිත නාමයන්ගෙන් පරව ईयस् / इष्ठ ප්‍රත්‍යය යෙදුණු විට එම ප්‍රත්‍යය ලොප් වේ.

• धनवान्	धन	+	ईयस्	=	धनीयस्	> धनीयान्	(වඩා ධනවත්)
	धन	+	इष्ठ	=	धनिष्ठ	> धनिष्ठः	(ධනවත් ම)
• मतिमान्	मति	+	ईयस्	=	मतीयस्	> मतीयान्	(වඩා බුද්ධිමත්)
	मति	+	इष्ठ	=	मतिष्ठ	> मतिष्ठः	(බුද්ධිමත් ම)
• मेधाविन्	मेधा	+	ईयस्	=	मेधीयस्	> मेधीयान्	(වඩා නුවණ ඇති)
	मेधा	+	इष्ठ	=	मेधिष्ठ	> मेधिष्ठः	(වඩාත් ම නුවණ ඇති)

විශේෂයක්

- දෙදෙනෙකු හෝ වස්තු දෙකක් සැසඳීමේ දී **तर** / **ईयस्** ප්‍රත්‍යය දෙක ද යෙදේ.
- දෙදෙනෙකුට හෝ වස්තු දෙකකට වඩා වැඩි ගණනක් සැසඳීමේ දී **तम** / **इष्ठ** යන ප්‍රත්‍යය දෙක ද යෙදේ.
- ක්‍රියා නාමයන් ඇතුළු සියලු ම නාමයන් කෙරෙන් **तर** / **तम** යන ප්‍රත්‍යය යෙදේ.
- ගුණ නාමයන් කෙරෙන් පමණක් **ईयस्** / **इष्ठ** යන ප්‍රත්‍යය යෙදේ.

ईयस् / **इष्ठ** ප්‍රත්‍යයන් පර කල්හි **गुरु** ආදි ශබ්දයන්ට
විශේෂ රූප ආදේශ වීමෙන් තද්ධිත රූප සෑදේ.

උදහරණ :-

මුල් නාමය	ආදේශය		ප්‍රත්‍යය	තද්ධිත නාමය		තේරුම
गुरु	गरु	+	ईयस्	गरीयस्	> गरीयान्	(වඩා බර)
	गरु	+	इष्ठ	गरिष्ठ	> गरिष्ठः	(වඩාත් ම බර)
प्रशस्य	श्र	+	ईयस्	श्रेयस्	> श्रेयान्	(වඩා ස්ථිර)
	श्र	+	इष्ठ	श्रेष्ठ	> श्रेष्ठः	(වඩාත් ම ස්ථිර)
अल्प / युवन्	कन्	+	ईयस्	कनीयस्	> कनीयान्	(වඩා බාල)
	कन्	+	इष्ठ	कनिष्ठ	> कनिष्ठः	(වඩාත් ම බාල)
वृद्ध/ प्रशस्य	ज्या	+	ईयस्	ज्यायस्	> ज्यायान्	(වඩා වැඩිමල්)
	ज्या	+	इष्ठ	ज्येष्ठ	> ज्येष्ठः	(වඩාත් ම වැඩිමල්)

අභ්‍යාසය 9.1

01. පහත සඳහන් නාමයන්ට ප්‍රත්‍යය එකතු කොට තද්ධිත පද සාදන්න.

१. गुरु	+ तर	>	....	७. पाप	+ इष्ठ	>	....
२. तुङ्ग	+ तर	>	....	८. तुङ्ग	+ ईयस्	>	....
३. दीर्घ	+ तर	>	....	९. कुलवान्	+ इष्ठ	>	....
४. दृढ	+ तम	>	....	१०. मायाविन्	+ ईयस्	>	....
५. कृष्ण	+ तर	>	....	११. बलवान्	+ इष्ठ	>	....
६. पाप	+ ईयस्	>	....	१२. प्रीतिमान्	+ ईयस्	>	....

02. පහත සඳහන් නාමයන්ට අදාළ ආදේශයන්ට ප්‍රත්‍යය එකතු කොට තද්ධිත පද සාදන්න.

මුල් නාමය	ආදේශය		ප්‍රත්‍යය		තද්ධිත නාමය	තේරුම
स्थूल	स्थव	+	ईयस्	>	....	(වඩා මහත්)
	स्थव	+	इष्ठ	>	....	(වඩාත් ම මහත්)
युवन्	यव	+	ईयस्	>	....	(වඩා තරුණ)
	यव	+	इष्ठ	>	....	(වඩාත් ම තරුණ)
ह्रस्व	ह्रस्	+	ईयस्	>	....	(වඩා කෙටි)
	ह्रस्	+	इष्ठ	>	....	(වඩාත් ම කෙටි)
दीर्घ	द्राघ	+	ईयस्	>	....	(වඩා දිග)
	द्राघ	+	इष्ठ	>	....	(වඩාත් ම දිග)
दूर	दवी	+	ईयस्	>	....	(වඩා ඈත)
	दवी	+	इष्ठ	>	....	(වඩාත් ම ඈත)
क्षुद्र	क्षोद	+	ईयस्	>	....	(වඩා කුඩා)
	क्षोद	+	इष्ठ	>	....	(වඩාත් ම කුඩා)

03. සමාස හා තද්ධිත අතර ඇති වෙනස සනිදර්ශන ව පහදා තද්ධිත ප්‍රයෝජන කවරේදැ යි ලියන්න.

II. අනේකාර්ථ තද්ධිතය

गैरिकः बालकः शैशवे एव नगरं आगत्य राजकीयविद्यालयं प्रविश्य चिरलः सम्यग् अध्ययनं कृत्वा ततः परं विश्वविद्यालयं गत्वा तत्र विदेशीय भाषाध्ययने स्वकीयकौशल्यं विशद्य विश्वविद्यालयीय स्वर्णमुद्रिकां जित्वा आदिमः शिष्योऽभवत्।

ඉහත උද්ධෘතයේ වර්ණගන්වා ඇති පදවලින් දැක්වෙන්නේ විවිධ වූ අර්ථ ගෙන දෙන තද්ධිත පද සමූහයකි. එහි වසන, එයට අයත්, එයින් කරන ලද, ස්වාර්ථ ආදි නොයෙක් අර්ථ ප්‍රකට කරන බැවින් මෙම තද්ධිත පද අනේකාර්ථ තද්ධිත වශයෙන් හැඳින්වේ. එක ම තද්ධිත පදයේ වුව විවිධ අර්ථ සැපයේ.

උදාහරණ :-

कण्	गिरौ वसति	(කන්දෙහි වසන)	गैरिकः
	गिरौ जातः	(කන්දෙහි උපන්)	
	गिरौ नियुक्तः	(කන්දෙහි නියුතු)	
	गिरेः आगतः	(කන්දෙන් පැමිණි)	
इकण्	नगरे वसति	(නගරයෙහි වසන)	नागरिकः
	नगरे जातः	(නගරයෙහි උපන්)	
	नगरे नियुक्तः	(නගරයෙහි නියුතු)	
	नगरात् आगतः	(නගරයෙන් පැමිණි)	

අනේකාර්ථයෙහි බොහෝ ප්‍රත්‍යය ප්‍රමාණයක් යෙදෙන මුත් මෙහි දී වැඩි වශයෙන් භාවිතයේ යෙදෙන, ප්‍රචලිත තද්ධිත ප්‍රත්‍යය කිහිපයක් පමණක් දැක්වේ.

अण् कण् इकण् यण् ईन ईय कीय इय र य मय इत डतर डामह धेय ता

अण् ආදි ප්‍රත්‍යයන්ගේ ण् කාරය මගින් නාමයේ මූලස්වර වෘද්ධිය සිදු වීමෙන් අනතුරු ව ण् කාරය ලොප් වේ.

ප්‍රත්‍යයාර්ථය	ප්‍රත්‍යය	විග්‍රහ වාක්‍ය	උදාහරණ	තේරුම
විසීම් අර්ථයෙහි	अण्	विदेहेषु जातः	वैदेहः	විදේහයෙහි උපන්
	कण्	कलिङ्गेषु जातः	कालिङ्गकः	කාලිංගයා
	इकण्	द्वारे नियुक्तः	दौवारिकः	දොරටුපාලයා
	यण्	परिषदि भवः	पारिषद्यः	පිරිසෙහි වූ
ප්‍රහරණාර්ථයෙහි	इकण्	शक्तिः प्रहरणमस्य	शाक्तिकः	ශක්තියෙන් යුත්
විසීම් අර්ථයෙහි	ईन	ग्रामे भवः	ग्रामीणः	ගමෙහි උපන්
	ईय	विदेशेषु भवः	विदेशीयः	විදේශීය/විදේශයේ උපන්
හටගත්තේ ය	इत	लज्जा सञ्जाता यस्य सः	लज्जितः	ලැජ්ජාවෙන් යුත්
		क्षुधा सञ्जाता यस्य सः	क्षुधितः	බඩසයින් පෙළුණු
		पुष्पानि सञ्जाता यस्मिन् सः	पुष्पितः	මල් හටගත්
අල්පාර්ථයෙහි	र	अल्पा कुटी	कुटीरः	කුඩා කුටිය
සාධ්වර්ථයෙහි	य	कर्मणि साधुः	कर्मण्यः	කටයුත්තට සුදුසු
විකාරාර්ථයෙහි	मय	मनसः विकारः	मनोमयः	සිතින් කළ
එයින් කරන ලද	मय	स्वर्णेण कृतः	स्वर्णमयः	රන්මුවා
		काष्ठेन कृतः	काष्ठमयः	දැවමුවා
නිර්ධාරණාර්ථයෙහි	डतर	अयमनयोः कः	कतरः	කවරෙකු (දෙදෙනෙකුගෙන්)
	डतम	अयमेषां कः	कतमः	කවරෙකු (බෝහෝ දෙනෙකුගෙන්)
වීම් අර්ථයෙහි	इय	क्षेत्रे भवः	क्षत्रियः	ක්ෂත්‍රිය කුලයෙහි උපන්
	इम	आदौ भवः	आदिमः	මුල් ම
අල්පාර්ථයෙහි	क	अल्पः पुत्रः	पुत्रकः	දරුවා/සිඟිත්තා
		अल्पः वृक्षः	वृक्षकः	කුඩා ගස

කාලාර්ථවාචී ශබ්දයන් කෙරෙන් පර ව ඒ කාලයෙහි 'වූ, වන, පවත්නා' යන අරුත්හි 'तन' ප්‍රත්‍යය ද ප්‍රශ්නාර්ථවාචී ශබ්දයන් කෙරෙන් පර ව 'त्य' ප්‍රත්‍යය ද යෙදේ.

• කාලාර්ථයෙහි	तन	अद्य भवः		अद्यतन	අද වන
		नव भवः	(नव > नू)	नूतन	අද වන
		स्वस् भवः		स्वस्तन	හෙට වන
		ह्यस् भवः		ह्यस्तन	ඊයේ වූ
• ප්‍රශ්නාර්ථයෙහි	त्य	कुत्र भवः		कुत्रत्य	කොහි වූයේ
		कुतः भवः		कुतस्त्य	කොහි වූයේ
		तत्र भवः		तत्रत्य	එහි වූයේ
		ततः भवः		ततस्त्य	එහි වූයේ
		अत्र भवः		अत्रत्य	මෙහි වූයේ
		अतः भवः		अतस्त्य	මෙහි වූයේ

විශේෂයක්

පහත දැක්වෙන ප්‍රත්‍යයන් ඒ ඒ උදාහරණ නාමයන් කෙරෙන් පමණක් යෙදෙන බව සැලකිය යුතුයි.

• 'මෙය' යන අර්ථයෙහි	कीय	राज्ञः इदम्	राजकीयम्	රජයට අයත්/රාජකීය
• ස්වාර්ථයෙහි	धेय	नाम एव	नामधेयम्	නමැති
		भाग एव	भागधेयम्	කොටස්කරු
	ता	देवः एव	देवता	දේවතාවා
	तिक	मृद् एव	मृत्तिका	සුවඳවත් පසක්/මැටි
• දැකීමෙහි	डिन्	साक्षाद् द्रष्टा	साक्षि	ඇසින් දුටු (සාක්ෂි)
• පිත්‍රර්ථයෙහි	डामह	मातुः पिता	मातामहः	මවගේ පියා (සීයා)
		पितुः पिता	पितामहः	පියාගේ පියා (සීයා)
• භ්‍රාත්‍රර්ථයෙහි	व्य	पितुर्भ्राता	पितृव्यः	පියාගේ සහෝදරයා (බාප්පා)
	डुल	मातुर्भ्राता	मातुलः	මවගේ සහෝදරයා (මාමා)

අභ්‍යාසය 9.2

01. ඉහත උදාහරණ ආශ්‍රයෙන් පහත සඳහන් නාමයන්ට ප්‍රත්‍යය එකතු කොට තද්ධිත පද සාදන්න. තේරුම් ද ලියන්න.

• විසීම් අර්ථයෙහි	ईन	प्राचौ भवः	प्राच् + ईन	प्राचीन	පෙරදිග
	ईय	विद्यालये भवः	विद्याल + ईय	....	....
		राष्ट्रे भवः	राष्ट्र + ईय	....	....
		औषधौ भवः	औषध + ईय	....	....
• හටගත්තේ ය	इत	पल्लवाः सञ्जाता यस्य सः	पल्लव + इत	....	....
		पिपासा सञ्जाता यस्य सः	पिपासा + इत	....	....
		तारकाः यस्मिन् भवः	तारका + इत	....	....
• එයින් කරන ලද	मय	घृतेन कृतः	घृत + मय	....	....
		रजतेन कृतः	रजत + मय	....	....
		मृला कृतः	मृत् + मय	....	....
• අල්පාර්ථයෙහි	र	अल्पा शुण्डा	शुण्डा + र	....	....
		अल्पा शमी	शमी + र	....	....
	क	अल्पः अश्वः	अश्व + क	....	....
		अल्पः पुरुषः	पुरुष + क	....	....
• යෝග්‍යාර්ථයෙහි	य	धूर्ये योग्यः	धूर + य	....	....
		गवि योग्यः	गव + य	....	....
• විසීම් අර්ථයෙහි	अण्	नगरे जातः	नगर + अण्	....	....
	कण्	गिरिषु भवः	गिरि + कण्	....	....
	इकण्	वेदेषु भवः	वेद + इकण्	....	....

• කාලාර්ථයෙහි **तन**	सदा भवः	सदा + तन	....	....
	पुरा भवः	पुरा+ तन	....	....
	चिरं भवः	चिरं + तन	....	....
	प्राक् भवः	प्राक् + तन	....	....

02. පහත සඳහන් වාක්‍යවල ඇති අනේකාර්ථ තද්ධිත පද උපුටා දක්වන්න.

03. එම වාක්‍ය සියල්ල සිංහලට පරිවර්තනය කරන්න.

०१. वसन्तकाले बाहुल्येन पुष्पिताः लताश्च फलविताः फलिताः वृक्षाश्च दृश्यन्ते।

०२. तारकिता शर्वरी सर्वेषां चित्तानि आह्लादयति।

०३. अद्यतने लाङ्कीयजनाः स्वकीयं संस्कृतिं परित्यज्य विदेशिकान् अनुबन्धन्ति।

०४. शाकटिको दैनिकं स्वकीयशकटेन नगरं गत्वा नागरान् वाणिज्यं कृत्वा स्वग्रामं पुनरागच्छति।

०५. पौराणिकविहारदेवालमन्दिराणां पुरस्तात् पार्श्वद्वयोः दौवारिकौ प्रतिष्ठितौ स्तः।

०६. बहवः भारतीयदारिद्रजनाः ग्रामीयप्रदेशेषु विना जीवनोपायं अतिदुष्करेण जीवितं नयन्ति।

०७. अस्मिन् जगति सर्वकालीनकिञ्चिदपि नास्तीति सम्यग्सम्बुद्धोऽवदत्।

०८. धानुरिकः व्याधः मृगान् अन्वेष्टुं वनं प्रविष्टः, कण्टकिते वृक्षमूले एकाकीमृगकिसोरं
दृष्ट्वा प्रहृष्टं गतः।

උපකාරක පද

शर्वरी	-	රාත්‍රිය	आह्लादयति	-	සතුටුකරයි
अनुबन्धन्ति	-	ලුහුබඳිති	दैनिकं	-	දිනපතා
वाणिज्यं	-	වෙළඳාම	पुरस्तात्	-	ඉදිරිපස
पुनरागच्छति	-	නැවත එයි	पार्श्वद्वयोः	-	දෙපැත්තෙහි
प्रतिष्ठिता	-	පිහිටියේ	जीवनोपाय	-	ජීවත්වීමේ මාර්ගය

दारिद्रजनाः	-	දිළිඳු ජනයා	प्रहृष्टं गतः	-	සතුටට පත්වූයේ ය
सदातनिकं	-	සැමදා පවතින	धानुरिकः	-	දුන්නක් අතදරා සිටින
किसोरं	-	පැටියා	एकाकी	-	තනිව ම/හුදකලාව
जगति	-	ලෝකයේ			

प्रज्ञा नाम बलं ह्येवं निष्प्रज्ञस्य बलेन किम्।

බලය නම් ප්‍රඥාවයි. ඉන් තොරවූවහුගේ බලයෙන් කවර ප්‍රයෝජනයක් ද?

प्रज्ञाबलं च सर्वेषु सुख्यं कार्येषु साधनाम्।

සියල්ලන් කෙරෙහි ප්‍රඥාබලය සියලු කටයුතු සාධනයට හේතු වේ.

प्रतिकारविधानमानुषः सति शेषे हि फलाय कल्पते।

ආයුෂ ඉතිරි ව ඇති විට පමණක් පිළියම් කිරීම ප්‍රතිඵලදායක වේ.

१० दशमः पाठः।

चक्रवत् परिवर्तन्ते दुःखानि च सुखानि च।

(රියසක මෙන් දුක සැප පෙරළේ)

तद्धितपरिचयः। ०२

III සංඛ්‍යා තද්ධිතය

සංඛ්‍යා ශබ්දයන්ගේ ෂෂ්ඨී විභක්ත්‍යන්ත නාමපද කෙරෙන් පූරණාර්ථ ප්‍රකාශක ප්‍රත්‍යයන් යොදා සාදාගනු ලබන තද්ධිත **සංඛ්‍යා තද්ධිත** නම් වේ.

උදාහරණ :-

මූලික නාමය	ප්‍රත්‍යය	විග්‍රහ වාක්‍යය	තද්ධිත රූපය	අර්ථය
द्वि	तीय	द्वयोः पूरणः	द्वितीयः	(දෙවැනි)
त्रि	तीय	त्रयाणां पूरणः	तृतीयः	(තෙවැනි)
चतुर्	थ	चतुर्णां पूरणः	चतुर्थः	(හතරවැනි)
षष्	थ	षण्णां पूरणः	षष्ठः	(අටවැනි)
पञ्च	म	पञ्चमानां पूरणः	पञ्चमः	(පස්වැනි)
एकादश	म	एकादशानां पूरणः	एकादशमः	(එකොළොස්වැනි)
द्वादश	म	द्वादशानां पूरणः	द्वादशमः	(දොළොස්වැනි)
त्रयोदश	म	त्रयोदशानां पूरणः	त्रयोदशमः	(තෙළෙස්වැනි)
विंशति	तम	विंशत्यानां पूरणः	विंशतितमः	(විසිවැනි)
शत	तम	शतानां पूरणः	शततमः	(සියවැනි)
सहस्र	तम	सहस्रानां पूरणः	सहस्रतमः	(දහස්වැනි)

විශේෂයක්

මෙම පූරණවාචී සංඛ්‍යා තද්ධිත පද ත්‍රිලිඞ්ගික වේ. වරනැගීමේ දී පුංලිඞ්ගයෙහි 'දේව' ශබ්දය මෙන් ද නපුංසකලිඞ්ගයෙහි 'ඵල' ශබ්දය මෙන් ද, ස්ත්‍රීලිඞ්ගයෙහි 'නදී' ශබ්දය මෙන් ද වරනැගේ. පහත උදාහරණ සාවධාන ව අධ්‍යයනය කරන්න.

උදාහරණ :-

तद्धित नाम	पुंलिङ्ग	स्त्रीलिङ्ग	नपुंसकलिङ्ग
प्रथम	प्रथमः	प्रथमा	प्रथमम्
द्वितीय	द्वितीयः	द्वितीया	द्वितीयम्
तृतीय	तृतीयः	तृतीया	तृतीयम्
चतुर्थ	चतुर्थः	चतुर्थी	चतुर्थम्
पञ्चम	पञ्चमः	पञ्चमी	पञ्चमम्

අභ්‍යාසය 10.1

01. පහත සඳහන් සංස්කෘත වාක්‍යවල ඇති සංඛ්‍යා තද්ධිතපද උපුටා දක්වන්න.
02. පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

०१. पञ्चसु कुमारेषु चतुर्थः समुद्रतीरे आस्थाय प्रीत्या चन्द्रमपश्यत्।

०२. सप्तमस्य आषढमासस्य अष्टमे दिने मम जन्मदिनं भवति।

०३. हे मित्र, तव तृतीयस्य मातुलस्य द्वितीया दुहित्रा सह पाणिग्रहणं कर्तुं योग्यम्।

०४. अतः परं सप्तमे वर्षे षष्टे रविवारे शत्रुभिः सह सङ्ग्राममारभताम्।

०५. गुरु सन्निधौ निषद्य शास्त्रोद्ग्रहणं कुर्वन् छात्रः सर्वछात्रेषु प्रथमः भवति।

०६. तस्करः रात्रौ गृहस्य चतुर्थगर्भं प्रविश्य द्वितीयाः भागिन्याः आभरणानि अचोरयत्।

०७. विद्यालये नवम्यां कक्ष्यायां षोढश बालिका च अष्ट बालकाश्च संस्कृतं पठन्ति।

०८. अस्माकं कुटुम्बे सप्त भ्रातरः सन्ति। तेषु षष्ठः पाणिग्रहणं कर्तुं अपेक्षितः भवति।

०९. नवदशमे वा विंशतितमे वा दिवसे मम स्वसा विदेशात् स्वदेशमागमिष्यति।

१०. प्रथमः पराक्रमबाहुः नाम राजा पुलस्तिनगरे पराक्रमसमुद्रम् इति महावापिं कृतवान्।

११. द्विसहस्रपञ्चदशमस्य वर्षस्य सप्तमे मासे रविवारे सचिवस्य दुहिता जायतेति जन्म पत्रिकां लिखतु।

१२. गतवर्षे वैशाखे शुक्लपक्षे द्वितीयस्मिन् मङ्गलवारे सः विहारं गत्वा श्रद्धया प्रव्रजितः।

१३. वयमागामिनी इन्दुवारे परात् पाठालयात् द्वादशम्यायां होरायां नृत्यमण्डले नृत्यं पश्याम।

१४. परिवेणे पञ्चमा कक्ष्या गणिताचार्यस्य, चतुर्था कक्ष्या संस्कृताचार्यस्य, तृतीया कक्ष्या आङ्गलाचार्यस्य च समर्पिताः।

१५. पुरा किल सहस्रतमे वर्षे द्वादशस्य मासस्य सप्तविंशतितमे कविवारे दिवसे बलवान् अन्यतरः राजा भारतवर्षम् अजयत्।

උපකාරක පද

समुद्रतीर	- මුහුදු තෙර / වෙරළ	आस्थाय	- හිඳ
आषाढमास	- ඇසල මස	दुहित्रा सह	- දුව සමග
पाणिग्रहण	- විවාහය / අතිනත ගැනීම	योग्यं	- සුදුසු
सन्निधौ	- සමීපයෙහි	शास्त्रोद्ग्रहणं	- ශාස්ත්‍ර හැදෑරීමට
तस्करः	- හොරා	गर्भ / ओवरकं	- කාමරය
भागिन्याः	- නැගණියගේ	कुटुम्बे	- පවුලේ
स्वसा	- සොයුරිය	स्वदेशं	- සියරට
पुलस्तिनगरं	- පොළොන්නරු නගරය	वैशाख	- වෙසක් මස
जायतेति	- උපන්නේයැයි	जन्मपत्रिका	- වේලපත්කඩය
शुक्लपक्षे	- පුරපස	आगामिनी	- එන / පැමිණෙන
होरायां	- පැයේ / හෝරාවේ	कक्ष्या	- පන්තිය
आङ्गलाचार्यस्य	- ඉංග්‍රීසි ගුරුතුමාගේ	समर्पिताः।	- පැවරිණ / භාර කරන ලදහ
नृत्यमण्डले	- රැඟුම් හලෙහි	भारतवर्षं	- භාරත දේශය

සතියේ දින

रविवारः	- ඉරිදා	इन्दुवारः	- සඳුදා
मङ्गलवारः / कुजवारः	- අඟහරුවාදා	बुधवारः	- බදාදා
गुरुवारः	- බ්‍රහස්පතින්දා	किविवारः	- සිකුරාදා
शनिवारः	- සෙනසුරාදා	सप्ताहः	- සතිය

IV අව්‍යය තද්ධිතය

විභක්තීන්හි වරනොනැගෙන නමුත් ඒක විභක්තික අර්ථයක් ගෙනදෙන අව්‍යය ස්වරූපයෙන් සිටින **තද්ධිත අව්‍යය තද්ධිත** නම් වේ. **නොයෙක් විභක්ත්‍යන්ත නාමයන් කෙරෙන් නානාර්ථවත් ප්‍රත්‍යය යෙදී සෑදෙන මෙම තද්ධිතපද ලිඞ්ග, විභක්ති, වචන නොගෙන මුල් නාමපදයේ විභක්ති අර්ථය පමණක් ගෙන ඒකස්වරූපයෙන් ම සිටී.**

ප්‍රත්‍යයාර්ථ	ප්‍රත්‍යය	විග්‍රහ වාක්‍යය	උදාහරණ	තේරුම
• පඤ්චමී අර්ථයෙහි	तः	ग्रामात्	ग्रामतः	(ගමෙන්)
	तः	सर्वस्मात्	सर्वतः	(සියල්ලෙන්)
	तः	मातुः	मातृतः	(මවගෙන්)

• සප්තමී අර්ථයෙහි	त्र	सर्वस्मिन्	सर्वत्र	(සැමතැන)
	त्र	कस्मिन्	कुत्र	(කොහි)
	त्र	अस्मिन्	अत्र	(මෙහි)
	व	कस्मिन्	क्व	(කොහි)
• ප්‍රකාරාර්ථයෙහි	थम्	अनेन प्रकारेण	इत्थम्	(මෙසේ)
	थम्	केन प्रकारेण	कथम्	(කෙසේ)
	था	येन प्रकारेण	यथा	(යම් සේ)
	था	तेन प्रकारेण	तथा	(එසේ)
	था	सर्वेण प्रकारेण	सर्वथा	(සියලු ආකාරයෙන්)
	धा	एकेन प्रकारेण	एकधा	(එක් ආකාරයකින්)
	धा	द्वाभ्याम् प्रकाराभ्याम्	द्विधा	(දෙයාකාරයකින්)
	धा	अष्टभिः प्रकारैः	अष्टधा	(අට ආකාරයකින්)
	ध्यमण्	एकेन प्रकारेण	ऐकध्यम्	(එක් ආකාරයකින්)
• කාලාර්ථයෙහි	दा	एकस्मिन् काले	एकदा	(එක් දිනක්)
	दा	कस्मिन् काले	कदा	(කවදා)
	दा	तस्मिन् काले	तदा	(එදා)
	दा	यस्मिन् काले	यदा	(යම් දිනක)
	दा	सर्वस्मिन् काले	सर्वदा	(හැම දිනක)
	दानीम्	अस्मिन् काले	इदानीम्	(දැන්)
	दानीम्	तस्मिन् काले	तदानीम्	(එදින)
	र्हि	तस्मिन् काले	तर्हि	(එකල්හි)
	रहि	एतस्मिन् काले	एतर्हि	(මෙකල්හි)
	इद्युः	परस्मिन् दिने	परेद्युः	(වෙනත් දිනක)
	इद्युः	अन्येस्मिन् दिने	अन्येद्युः	(අන් දිනක)
	द्यः	अस्मिन् दिने	अद्य	(අද)
	द्यः	समाने काले	सद्यः	(එදින)
	धुना	अस्मिन् काले	अधुना	(දැන්)
• සදෘශාර්ථයෙහි	वत्	चन्द्रेण तुल्यः	चन्द्रवत्	(සඳු බඳු)
	वत्	मुखेन तुल्यः	मुखवत्	(මුහුණ බඳු)
	वत्	भानुना तुल्यः	भानुवत्	(හිරු බඳු)

• වාරාර්ථයෙහි	शः	बहुवारान् तुल्यः	बहुशः	(බොහෝ වරක්)
	शः	शतवारान् तुल्यः	शतशः	(සිය වරක්)
	शः	सहस्रवारान् तुल्यः	सहस्रशः	(දහස් වරක්)
	स्	द्वौ वारौ	द्विः	(දෙවරක්)
	स्	त्रीन् वारान्	त्रिः	(තෙවරක්)
	स्	चतुरः वारान्	चतुः	(සිව්වරක්)
	कृत्वः	पञ्च वारान्	पञ्चकृत्वः	(පස්වරක්)
	कृत्वः	शत वारान्	शतकृत्वः	(සියවරක්)
	कृत्वः	सहस्र वारान्	सहस्रकृत्वः	(දහස් වරක්)
• දූරාර්ථයෙහි	आ	दक्षिणस्यां दिशि दूरे	दक्षिणा	(දකුණු දිග)
	आ	उत्तरस्यां दिशि दूरे	उत्तरा	(උතුරු දිග)
	आ	पश्चिमायां दिशि दूरे	पश्चिमा	(බටහිර දිග)
	आहि	दक्षिणस्यां दिशि दूरे	दक्षिणाहि	(දකුණු දිග)
	आहि	उत्तरस्यां दिशि दूरे	उत्तराहि	(උතුරු දිග)
	आहि	पश्चिमायां दिशि दूरे	पश्चिमाहि	(බටහිර දිග)
• අතිශයාර්ථයෙහි	तराम्	अतिशयेन कः	किन्तराम्	(වැඩිම කවු ද?)
	तराम्	अतिशयेन उच्चैः	उच्चैस्तराम्	(උස ම)
	तराम्	अतिशयेन पचति	पचतितराम्	(වඩා පිසින)
	तमाम्	अतिशयेन कः	किन्तमाम्	(වැඩිම කවු ද?)
	तमाम्	अतिशयेन नीचैः	नीचैस्तमाम्	(මිටි ම)
	तमाम्	अतिशयेन नमति	नमतितमाम्	(වඩා වදින)
• අයත් බැව්හි	सात्	राज्ञः अधीनम्	राजसात्	(රජුට අයත්)
	सात्	अग्नेः अधीनम्	अग्निसात्	(ගින්නට අයත්)
• ස්වාර්ථයෙහි	सात्	सर्वं भस्म	भस्मसात्	(සියල්ල නැසුණු)

අභ්‍යාසය 10.2

01. පහත ඡේදයෙහි ඇති අව්‍යය තද්ධිතපද උපුටා දක්වා ඒවායේ තේරුම් ලියන්න.
02. පහත සඳහන් සංස්කෘත ඡේදය සිංහලට පරිවර්තනය කරන්න.

दक्षिणाहि ग्रामतः आगतः ग्रामीणः नगरं प्रतिगच्छन् मार्गे पार्श्वतः एकस्मिन् वृक्षमूले श्रान्तं एकं नरं दृष्ट्वा इत्थम् अपृच्छत्। "कस्त्वं ? कुत्रतः आगतोऽसि ? अत्र किं करोसि ? इति"। सोऽवदत् - "अहमिव नगरतः आगतः दरिद्रोऽस्मि। अहं ग्रामं प्रतिगच्छन् मार्गे श्रान्तोऽस्मि। ततः मार्गस्य परितः उच्चैस्तराम् अस्य वृक्षस्य छायायां विश्रमितुं प्रविष्टः। दारिद्रात् दिवाभोजनं न लब्धम्। अधुना गमनारम्भं कर्तुं समयः इति"। "न हि तथा कुरु, त्वं गमनाय न शक्यम्। यदि त्वं गमनं करोसि तर्हि पुनरपि श्रान्तं भविष्यसि। मम सन्तिके आहारं अस्ति। गृह्णातु भवान् इदानीम् आहारं भुक्त्वा विश्रम्य अत्रतः निष्क्रमतु" इति ग्रामीणः अवोचत्। सन्तृप्तः दरिद्रः "साधु भवान्" इत्युक्त्वा, आहारं अनुभूय, पुण्यं दत्वा, आहाराणि सहस्रकृत्वा लब्धुं आशिर्वादं कृत्वा, सद्यः गमनारम्भं सज्जीकृतः। ग्रामीणश्च "पन्थानं सन्तु ते शिवाः" इत्युक्त्वा स्वगमनं कृतवान्।

අභ්‍යාසය 10.3

01. පහත සඳහන් සංස්කෘත වාක්‍යවල ඇති අව්‍යය තද්ධිතපද උපුටා දක්වන්න.
02. පහත සඳහන් සංස්කෘත වාක්‍ය පරිවර්තනය කරන්න.

०१. गङ्गायाः परितः बहवः वृक्षाः सन्ति।
०२. भारतदेशे दक्षिणात्ये जनपदे महिलारोप्यं नाम नगरमस्ति।
०३. विशालायाः पाठशालायाः पुरतः दीर्घे विस्तृते च क्रीडाङ्गणे वयं क्रीडामः।
०४. ललनायाः वदनं चन्द्रवत् इति कविभिः काव्येषु वर्णितम्।
०५. धीरः नरः परिश्रमेण उच्चैस्तराम् गच्छति।
०६. सदैव भिक्षुः सर्वथा निर्धनः भवितव्यः इति लाङ्किकजनाः चिन्तयन्ति।
०७. जगति सर्वत्रैव सर्वदैव यस्य धनं अस्ति तस्य प्रभुत्वं भवति।
०८. अधुना त्वं कुत्र गच्छसि इति पिता पुत्रं अपृच्छत्।
०९. अपुत्रके धनिनि मृते सति धनं राजसात् भवति।
१०. ज्ञातयः मृतस्य पितुः शरीरं अग्निसात् कुर्वन्ति।
११. अधुना सर्वत्रैव पश्य ! तव पुरतः तव लेखनी च पृष्टतः तव पुस्तकं च स्तः।
१२. आकाशे उच्चैस्तमामपि चरन्तः कुलालः क्षणेन नीचैस्तमामपि गोचरं प्रत्याकर्षति।
१३. भारतदेशस्य उत्तराहि विश्रुतं उच्चैस्तराम् बुद्धगया इति वरतमं बौद्धमन्दिरं प्रतिष्ठितम्।
१४. अद्याहम् अत्रैव तिष्ठामि। यदि त्वं श्वः गृहं गमिष्यसि, तर्हि अहमपि सद्यः गृहम् आगमिष्यामि।
१५. पूर्वं अत्र छात्राः उच्चैस्तराम् शब्देन कोलाहलं कुर्वन्ति। यदा अध्यापकः आगच्छेत् तदा सर्वे तूष्णीमभवन्।

උපකාරක පද

दक्षिणात्ये	දකුණුදිග	कुलालः	උකුස්සා
ग्रामीणः	ගැමියා (ගම්වැසියා)	प्रतिगच्छन्	වෙතට යන්නේ
श्रान्तं	ක්ලාන්ත	अपृच्छत्	විචාළේ ය
दारिद्रः	දිළින්දා	विश्रमितुं	විඩා හරින්නට
दारिद्रात्	දිළිඳුකම නිසා	समयः	කාලය (වේලාව)
शक्यं	හැකියි	विश्रम्य	විඩා සිඳුවා
तुष्टिप्राप्तः	සතුටට පත්	विश्रुते	ප්‍රසිද්ධ
वर्णितं	වර්ණනා කරන ලදි	परिश्रमेण	උත්සාහයෙන්
जगति	ලෝකයෙහි	अपुत्रके	දරුවන් නැති
धनिनि मृते	ධනවතා මැරුණු කල්හි	राजसात् भवति	රාජසන්තක කරයි.
अग्निसात् कुर्वन्ति	ගිනිබත් කරයි.	प्रत्याकर्षति	වෙතට ඇදී යයි.
तूष्णीमभवन्	නිශ්ශබ්ද වූහ.		

प्रतिकूलतामुपगते हि विधौ विफलत्वमेति बहुसाधनता।

දෛවය සතුරු වූ කළ සඵලත්වය සඳහා කරන කටයුතු නිෂ්ඵල වේ.

क्षणे क्षणे यन्नवतामुपैति तदेव रूपं रमणीयतायाः।

මොහොතක් මොහොතක් පාසා නවතාවයට පැමිණේ ද එය ම සුන්දරත්වයෙහි ස්වභාවය යි.

प्रतिपन्नार्थनिर्वाहं सहजं हि सतां व्रतम्।

කළයුතු කාර්යය ඉටුකිරීම සුදනන්ගේ සහජ ව්‍රතයකි.

११
एकादशः आठः।

गच्छन् पिपीलिको याति योजनानां शतान्यऽपि।

(යන කුහුඹුවා යොදුන් සියයක් වුව යයි)

कृदन्तपरिचयः। १

ධාතුන්ගේ අගට කෘත් ආදි ප්‍රත්‍යයන් සම්බන්ධ කිරීමෙන් සාදාගනු ලබන පද විශේෂය කෘදන්ත නාමයෙන් හඳුන්වයි. ඒවා වාච්‍යාර්ථයට සුදුසු ලිඞ්ග ඇත්තෝ වෙති. **වරනැගිය හැකි හා වරනැගිය නොහැකි කෘදන්ත** යනුවෙන් වර්ග දෙකකි.

- මෙහි වරනැගිය හැකි කෘදන්ත කාරකය, කාලය, ලිඞ්ගය හා පදය වශයෙන් පහත පරිදි වර්ගකළ හැකි ය.

කාරක	03 - කර්තෘකාරකය	කර්මකාරකය	භාවකාරකය
කාල	03 - වර්තමානකාල	අනාගතකාල	අතීතකාල
ලිඞ්ග	03 - පුරුෂලිඞ්ග	ස්ත්‍රීලිඞ්ග	නපුංසකලිඞ්ග
පද	02 - පරස්මෛපද	ආත්මනේපද	

- එක් කෘදන්ත පදයක දක්නට ලැබෙන්නේ එක කාරකයක්, එක කාලයක්, එක පදයක් හා එක් ලිඞ්ගයකි. කෘදන්තයක ප්‍රකෘති රූපය සාමාන්‍යයෙන් පුරුෂලිඞ්ගය හෝ නපුංසකලිඞ්ගය ගැනේ. ස්ත්‍රී ප්‍රත්‍යයක් සම්බන්ධ වූ විට එය ස්ත්‍රීලිඞ්ගික වේ.

धातुः	प्रत्ययः	मूल-शब्दः	पुंल्लिङ्गम्	स्त्रीलिङ्गम्	नपुंसकलिङ्गम्
√ कृ	क्तवतु (तवत्)	कृतवत्	कृतवान्	कृतवती	कृतवत्
√ गम्	क्तवतु (तवत्)	गतवत्	गतवान्	गतवती	गतवत्
√ पठ्	क्तवतु (तवत्)	पठितवत्	पठितवान्	पठितवती	पठितवत्

- ධාතුගත ස්වරය ගුණ, වෘද්ධි හෝ ව්‍යස්ත යන ස්වරූපයන්ට පත්වීම ආඛ්‍යාතයන්හි මෙන් ම කෘදන්තවල ද දැකිය හැකි ලක්‍ෂණයකි.

कृदन्तप्रत्ययाः



පැහැදිලි කිරීම්වල දී ඉහත ඇතැම් කෘදන්ත ප්‍රත්‍යයන්ගේ ශුද්ධස්වරූපය පමණක් යොදා ගන්නා බව සැලකිය යුතු ය.



වර්තමානකාලික කෘදන්ත

වර්තමානකාලික शतृ (अत्) සහ (शानच्) आन/ मान ප්‍රත්‍යයෝ

වර්තමානකාලික शतृ (अत्) ප්‍රත්‍යය

කර්තෘවාච්‍ය වර්තමානකාලික පරස්මෛපද ධාතූන් කෙරෙන් शतृ (अत्) ප්‍රත්‍යය වේ.

भू + अ > भव + अत् > भवत्
पठ् + अ > पठ + अत् > पठत्

धातुः		प्रत्ययः		मूल-शब्दः	धातुः		प्रत्ययः		मूल-शब्दः
√ भू	+	अत्	→	भवत्	√ पत्	+	अत्	→	पतत्
√ रुध्	+	अत्	→	रुधत्	√ चल्	+	अत्	→	चलत्
√ दा	+	अत्	→	ददत्	√ गम्	+	अत्	→	गच्छत्
√ वद्	+	अत्	→	वदत्	√ हस्	+	अत्	→	हसत्

- එසේ සාදාගත් කෘදන්ත පද පහත ඇති පරිදි ලිඞ්ගත්‍රයේ වරනැගිය හැකි ය.

पश्यति → पश्यन् (पुंलिङ्ग - एकवचनम्)
पश्यति → पश्यन्ती (स्त्रीलिङ्ग - एकवचनम्)
पश्यति → पश्यत् (नपुंसकलिङ्ग - एकवचनम्)

කෘදන්ත වරනැගීම

मूलशब्दः			एकवचनम्	द्विवचनम्	बहुवचनम्
पठत्	प्रथमाविभक्ति	पुंलिङ्गे	पठन्	पठन्तौ	पठन्तः
		स्त्रीलिङ्गे	पठन्ती	पठन्त्यौ	पठन्त्यः
		नपुंसकलिङ्गे	पठत्	पठती	पठन्ती

गच्छन् पिपीलिको याति योजनानां शतान्यपि।
अगच्छन् वैनतेयोऽपि पदमेकं न गच्छति॥

- गच्छन् पिपीलिकः – යන්නා වූ කුහුඹුවා
- अगच्छन् वैनतेयः – නොයන්නා වූ ගුරුළා

- गच्छन् छात्रः आचार्यं नमति।
- लिखन् शिक्षकः चित्रं दर्शयति।
- लिखन्ती शिक्षिका प्रत्युत्तरं ददाति।

बालकः गच्छति। → गच्छन् बालकः गीतं गायति।
बालकः गीतं गायति। → गच्छन् बालकः गीतं गायति।

අභ්‍යාසය 11.1

ඉහත නිදසුන ඇසුරෙන් පහත වාක්‍ය සකසන්න.

०१. बालकः क्रीडति। मित्रम् आह्वयति।

०२. रावणः जयति। शूरः भवति।

०३. यन्त्रं चलति। कार्यं करोति।

०४. शिक्षकः लिखति। पाठयति।

०५. छात्रः पाठं लिखति। चिन्तयति।

ලිඞ්ග අනුව කෘදන්ත යෙදීම

पुंलिङ्गे प्रथमा - एकवचनम्

बालकः लिखति। - लिखन् बालकः।

पुरुषः हसति। - हसन् पुरुषः।

वानरः पतति। - पतन् वानरः।

अश्वः धावति। - धावन् अश्वः।

स्त्रीलिङ्गे प्रथमा - एकवचम्

बालिका लिखति। - लिखन्ती बालिका।

वनिता गच्छति। - गच्छन्ती वनिता।

नपुंसकलिङ्गे प्रथमा - एकवचम्

यानं गच्छति। - गच्छत् यानम्।

जलं प्रवहति। - प्रवहत् जलम्।

पुष्पं विकसति। - विकसत् पुष्पम्।

पत्रं पतति। - पतत् पत्रम्।

වර්තමානකාලික කෘදන්ත වරනැගීම (පුංලිඞ්ගය)

विभक्तयः	एकवचनम्	द्विवचनम्	बहुवचनम्
प्रथमाविभक्तिः	गच्छन्	गच्छन्तौ	गच्छन्तः
द्वितीयाविभक्तिः	गच्छन्तम्	गच्छन्तौ	गच्छतः
तृतीयाविभक्तिः	गच्छता	गच्छद्भ्याम्	गच्छद्भिः
चतुर्थीविभक्तिः	गच्छते	गच्छद्भ्याम्	गच्छद्भ्यः
पञ्चमीविभक्तिः	गच्छतः	गच्छद्भ्याम्	गच्छद्भ्यः
षष्ठीविभक्तिः	गच्छतः	गच्छतोः	गच्छताम्
सप्तमीविभक्तिः	गच्छति	गच्छतोः	गच्छत्सु

අභ්‍යාසය 11.2

පහත වගුව සම්පූර්ණ කරන්න.

विभक्तयः	एकवचनम्	द्विवचनम्	बहुवचनम्
प्रथमाविभक्तिः	वदन्	वदन्तौ	वदन्तः
द्वितीयाविभक्तिः	....	....	....
तृतीयाविभक्तिः	....	वदद्भ्याम्	वदद्भिः
चतुर्थीविभक्तिः	....	....	....
पञ्चमीविभक्तिः	....	....	वदद्भ्यः
षष्ठीविभक्तिः	वदतः	....	....
सप्तमीविभक्तिः	....	....	....

अत् ප්‍රත්‍යාන්ත ස්ත්‍රීලිඞ්ග गच्छत् ශබ්දය

विभक्तयः	एकवचनम्	द्विवचनम्	बहुवचनम्
प्रथमाविभक्तिः	गच्छन्ती	गच्छन्त्यौ	गच्छन्त्यः
द्वितीयाविभक्तिः	गच्छन्तीम्	गच्छन्त्यौ	गच्छन्तीः
तृतीयाविभक्तिः	गच्छन्त्या	गच्छन्तीभ्याम्	गच्छन्तीभिः
चतुर्थीविभक्तिः	गच्छन्त्यै	गच्छन्तीभ्याम्	गच्छन्तीभ्यः
पञ्चमीविभक्तिः	गच्छन्त्याः	गच्छन्तीभ्याम्	गच्छन्तीभ्यः
षष्ठीविभक्तिः	गच्छन्त्याः	गच्छन्त्योः	गच्छन्तीनाम्
सप्तमीविभक्तिः	गच्छन्त्याम्	गच्छन्त्योः	गच्छन्तीषु

अत् ප්‍රත්‍යාන්ත නපුංසකලිඞ්ග गच्छत् ශබ්දය

विभक्तयः	एकवचनम्	द्विवचनम्	बहुवचनम्
प्रथमाविभक्तिः	गच्छत्	गच्छती	गच्छन्ती
द्वितीयाविभक्तिः	गच्छत्	गच्छती	गच्छन्ती
तृतीयाविभक्तिः	गच्छता	गच्छद्भ्याम्	गच्छद्भिः
चतुर्थीविभक्तिः	गच्छते	गच्छद्भ्याम्	गच्छद्भ्यः
पञ्चमीविभक्तिः	गच्छतः	गच्छद्भ्याम्	गच्छद्भ्यः
षष्ठीविभक्तिः	गच्छतः	गच्छतोः	गच्छताम्
सप्तमीविभक्तिः	गच्छति	गच्छतोः	गच्छत्सु

आन / मान ප්‍රත්‍යය

ආත්මනේ පද ධාතූන් කෙරෙන් කර්තෘ, ක්‍රියා හා කර්ම යන වාච්‍ය තුනෙහි ම **शानच्** (**आन**) ප්‍රත්‍යය යෙදේ. ඇතැම් විට **म** කාරාගමයෙන් **आन** ප්‍රත්‍යය **मान** කියා ද සිටී.

√ पच् + अ > पच + आन (मान) > पचमान (පිසන/පිසිමින්)

√ वृत् + अ > वर्त + आन (मान) > वर्तमान (පවතින/පවතිමින්)

धातुः	प्रत्ययः	मूल-शब्दः	अर्थः	धातुः	प्रत्ययः	मूल-शब्दः	अर्थः
√ वृत्	आन	वर्तमान	පවතින	√ वन्द्	आन	वन्दमान	වඳින
√ दीप्	आन	दीप्यमान	දිලිසෙන	√ भुज्	आन	भुञ्जमान	අනුභව කරන
√ वृध्	आन	वर्धमान	වැඩෙන	√ शुभ्	आन	शोभमान	බබළන
√ विद्	आन	विद्यमान	පවතින	√ कम्प्	आन	कम्पमान	සෙලවෙන

අභ්‍යාසය 11.3

01. නිදසුන් ඇසුරෙන් පහත වාක්‍ය සම්පූර්ණ කරන්න.

१. अग्रजः निरीक्ष्यते। अग्रजः निरीक्ष्यमाणः अस्ति।
(අයියා නිරීක්ෂණය කරයි. අයියා නිරීක්ෂණය කරමින් ඇත)

२. अग्रजा निरीक्ष्यते। अग्रजा निरीक्ष्यमाणा अस्ति।
(අක්කා නිරීක්ෂණය කරයි. අක්කා නිරීක්ෂණය කරමින් ඇත)

३. मित्रम् निरीक्ष्यते। मित्रम् निरीक्ष्यमाणम् अस्ति।
(මිත්‍රයා නිරීක්ෂණය කරයි. මිත්‍රයා නිරීක්ෂණය කරමින් ඇත)

०१. शाखा कम्पते। ....
०२. मम मित्रं वर्धते। ....
०३. पाठः अनुवर्तते। ....
०४. रावणः सभायां विराजते। ....
०५. पक्षिणः डयन्ते। ....
०६. कर्मकारः प्रयतते। ....
०७. नक्षत्रं प्रकाशयते। ....
०८. चन्द्रः शोभते। ....
०९. माता शिशुं लालयते। ....
१०. आम्रफलं लम्बते। ....

<u>වර්තමාන කෘදන්ත මිශ්‍ර ක්‍රියා වශයෙන් යෙදීම</u>

उदाहरणानि :-

छात्रः मातरं स्मरति ।
छात्रः पत्रं लिखति ।
} छात्रः मातरं स्मरन् पत्रं लिखति ।
(ශිෂ්‍යයා මව සිහිකරමින් ලිපියක් ලියයි)

बालकः क्रीडति ।
मित्रम् आह्वयति ।
} बालकः क्रीडन् मित्रम् आह्वयति ।
(ළමයා ක්‍රීඩා කරමින් මිතුරා කැඳවයි)

අභ්‍යාසය 11.4

01. ඉහත නිදර්ශනයන්ට අනුව සුදුසු **अत्** ප්‍රත්‍යය සහිත කෘදන්ත පදයන්ගෙන් පහත වාක්‍ය නිවැරදි ව ලියන්න.

०१. अग्रजा पुस्तकं पठति ।
अग्रजा विद्यालयं गच्छति । ....

०२. महिलाः वार्तालापं कुर्वन्ति ।
महिलाः नगरं गच्छन्ति । ....

०३. चोराः धावन्ति ।
आरक्षकाः चोरान् गृह्णन्ति । ....

०४. मित्रं अन्नं खादति ।
मित्रं जलं पिबति । ....

०५. शिक्षकः लिखति ।
शिक्षकः आकाशं दर्शयति । ....

අභ්‍යාසය 11.5

01. **पश्यत्** ශබ්දය ලිඞ්ගත්‍රයේ වරනගන්න.
02. පහත වර්ණගන්වා ඇති පදයන්හි ධාතු හා ප්‍රත්‍යය වෙන් කොට දක්වන්න. එම වාක්‍ය සිංහලට ද පරිවර්තනය කරන්න.

०१. युद्यमानः सैनिकः दिवंगतः।

०२. सेवमानः सेवकः वृत्तिं लभते।

०३. मोदमाना बाला क्रीडति।

०४. पुरस्कारः लभमानः वृद्धः सन्तुष्टः भवति।

०५. गच्छमानाः छात्राः पठन्ति ।

०६. वर्धमानं ज्वरं भवान् निवारयतु।

०७. वन्दमानौ दम्पती बुद्धं पुष्पाणि अर्पयति।

०८. भाषमाणः शठः मधुरं धनं हरति।

०९. कम्पमानेभ्यः वृक्षेभ्यः जलबिन्दवः निपतन्ति।

१०. सूत्रे लम्बमानेभ्यः चीवरेभ्यः जलं स्रवति।

११. वन्दमानः श्रामणेरः आशिषं लभते।

१२. प्रकाशमानैः नक्षत्रैः आकाशः दीप्यति।

१३. कष्टानि सहमानाः वीराः कीर्तिं लभन्ते।

१४. परिवर्तमानः कालः तु नित्यं चक्रवत् वर्तते।

१५. सम्बुद्धं वन्दमानः बौद्धोपासकः प्रसन्नः भवति।

१६. तडागे जायमानेभ्यः कमलेभ्यः परागाः पतन्ति।

१७. संस्कृतव्याकरणस्य प्रयतमानाः छात्राः साफल्यम् आप्नुवन्ति।

१८. वर्धमाना बालिका शनैः तरुणी भवति।

१९. दीनान् सेवमानः मूढः मोदते।

२०. वर्षाकाले मोदमानाः मयूराः गङ्गातीरे नृत्यन्ति।

නොමිලේ බෙදා හැරීම පිණිසයි

අභ්‍යාසය 11.6

01. උදාහරණය ඇසුරෙන් පහත හිස්තැන් සම්පූර්ණ කරන්න.

උදා :-	हसति	हसन् (पुं.)	हसन्ती (स्त्री.)	हसत् (नपुं.)
०१.	खादति	....	....	....
०२.	इच्छति	....	....	....
०३.	त्यजति	....	....	....
०४.	क्रीडति	....	....	....
०५.	नयति	....	....	....
०६.	पश्यति	....	....	....
०७.	नमति	....	....	....
०८.	चिन्तयति	....	....	....
०९.	पिबति	....	....	....
१०.	तरति	....	....	....

අභ්‍යාසය 11.7

01. උදාහරණය ඇසුරෙන් පහත හිස්තැන් සම්පූර්ණ කරන්න.

උදා :-	वन्दते	-	वन्द्	+	आन / मान	>	वन्दमान
	वर्धते	-	....	+	....	>	....
	कम्पते	-	....	+	....	>	....
	एधते	-	....	+	....	>	....
	सेवते	-	....	+	....	>	....
	लभते	-	....	+	....	>	....
	विद्यते	-	....	+	....	>	....
	शोभते	-	....	+	....	>	....
	मोदते	-	....	+	....	>	....
	स्पर्धते	-	....	+	....	>	....
	ईक्षते	-	....	+	....	>	....
	भाषते	-	....	+	....	>	....

අභ්‍යාසය 11.8

01. පහත පද්‍යයන්හි එන කෘදන්ත රූප තෝරා ලියන්න.

नैव किञ्चित्करोमीति युक्तो मन्येत तत्ववित्।
पश्यन् श्रुण्वन् स्पृशन् जिघ्रन् अश्नन् गच्छन् स्वपन् श्वसन्॥

प्रलपन् विसृजन् गृह्णन् उन्मिषन् निमिषन् अपि।
इन्द्रियाणीन्द्रियार्थेषु वर्तन्त इति धारयन्॥

උපකාරක පද

महिला	- ස්ත්‍රිය	ज्वर	- උෂ්ණ රෝගය
वार्तालापं	- සාකච්ඡාව	सूत्रे	- වැලෙහි
वृत्तिं	- වැටුප	आशिषं	- ආශීර්වාද
पुरस्कारः	- ගෞරව පෙරදැරි ව	कष्टानि	- කටුක / දුෂ්කර
पराग	- රේණු	प्रयतमानः	- උත්සාහ කරනුලබන
दीनान्	- දීනයන් (පහත් අය)		
अर्पयतः	- පුදත් (දෙදෙන)	एधते	- වසයි

कल्पवृक्षोऽप्यभव्यानां प्रायो याति कलाशताम्।
නුසුදුසු අයට කල්පවෘක්ෂය පවා හානිකර වෙයි.

कष्टो हि बान्धवस्नेहं राज्यलोभोऽतिवर्तते।
රාජ්‍ය ලෝභය ඥාති ස්නේහය ඉක්මවා පවතියි.

कस्य नाभ्युदये हेतुर्भवेत्साधु समागतः।
සත්පුරුෂ සමාගමය කවරෙකුගේ දියුණුවට හේතු නොවේ ද?

१२
द्वादशः पाठः ।

गतः कालो नचायाति ।

(ගෙවුණු කාලය නොඒම ය)

कृदन्तपरिचयः । ०२

අනාගතකාල කෘදන්ත

स्यतृ (स्यत्) හා स्यमान ප්‍රත්‍යය

'स्यत्' හා 'स्यमान' යනු අනාගත කාලවාචී කෘදන්ත ප්‍රත්‍යද්වය යි. ඉන් 'स्यत्' ප්‍රත්‍යය පරස්මෛපදී ධාතුන්ගෙන් පර ව කර්තෘකාරකයෙහි ද, 'स्यमान' ප්‍රත්‍යය ආත්මනේපදී ධාතුන්ගෙන් පර ව කර්තෘකාරකයෙහි ද වේ. 'स्यमान' ප්‍රත්‍යය පර කල්හි ලෘට් ලකාරය සම්බන්ධ කාර්ය්‍ය ද සිදුවේ. මෙහි රූප වර්තමානකාලික शानच् (ආන/මාන) ප්‍රත්‍යයාන්ත ශබ්දයන්ට සමාන ය.

√ भू > भव् + इ + स्य > भविष्य + अत् > भविष्यत्

√ दिव् > देव् + इ + स्य > देविष्य + अत् > देविष्यत्

√ सेव् > सेव् + इ + स्य > सेविस्य + मान > सेविष्यमान

√ जन् > जन +इ + स्य > जनिष्य + मान > जनिष्यमान

	परस्मैपद	आत्मनेपद	
√ पठ्	पठिष्यत्	पठिष्यमान	(මතු පාඩම් කරන්නේ)
√ भू	भविष्यत्	भविष्यमान	(මතු වන්නේ)
√ कृ	करिष्यत्	करिष्यमाण	(මතු කරන්නේ)
√ नी	नेष्यत्	नेष्यमान	(මතු පමුණුවන්නේ)
√ चुर्	चोरयिष्यत्	चोरयिष्यमान	(මතු සොරකම් කරන්නේ)
√ खन्	खनिष्यत्	खनिष्यमाण	(මතු සාරන්නේ)
√ हृ	हरिष्यत्	हरिष्यमाण	(මතු රැගෙන යන්නේ)

අතීතකාල කෘදන්ත

අතීතකාලික क्वसु (वस्) कानच् (आन) ප්‍රත්‍යය

कानच् (आन)

- ලිට් ලකාරයේ පරස්මෛපදී ධාතුන් කෙරෙන් පර ව (क्वसु) वस् ප්‍රත්‍යය වේ. මෙම ප්‍රත්‍යය පර ව සිටින කල්හි ධාතුව ද්විත්ව වේ.

ධාතුව හා ප්‍රත්‍යය	කෘදන්ත නාමය	කෘදන්ත පදය	අර්ථය
√ गम् > गम् + वस्	जग्मिवस्	जग्मिवान्	ගියේ
√ भू > भू + वस्	बभूवस्	बभूवान्	වූයේ
√ पा > पा + वस्	पपिवस्	पपिवान्	බීවේ
√ कृ > कृ + वस्	चकृवस्	चकृवान्	කළේ
√ स्था > स्था + वस्	स्थितवस्	स्थितवान्	සිටියේ

- ලිට් ලකාරයේ ම ආත්මනේපද ධාතුන් කෙරෙන් (कानच्) आन ප්‍රත්‍යය යෙදීමෙන් පහත ශබ්දරූප නිර්මාණය වේ. ධාතුවේ මුල් අකුර මෙහි ද ද්විත්වවීම සිදුවේ.

ධාතුව හා ප්‍රත්‍යය	කෘදන්ත නාමය	කෘදන්ත පදය	අර්ථය
√ युध् + आन	ययुधान	ययुधानः	යුද කළේ
√ मुच् + आन	मुमुचान	मुमुचानः	මිදූයේ
√ कृ + आन	चक्राण	चक्राणः	කළේ
√ भिद् + आन	बिभिदान	बिभिदानः	බින්දේ
√ पच् + आन	पपचान	पपचानः	පිසූයේ

णिनि ප්‍රත්‍යය

अर्ध + √ भुज् > अर्धभोजिन् > अर्धभोजी (අඩක් කෑයේ)
पितृ + √ हन् > पितृघातिन् > पितृघाती (පියා නැසූයේ)
आ + √ गम् + इन् > आगामिन् > आगामी (පැමිණියේ)

क्विप् ප්‍රත්‍යය

व्रत्र √ हन् > व्रत्रहन् - व्रत्रहा (වෘත්‍ර නම් අසුරයා නැසූයේ)
पाप √ कृ > पापकृत् (පව් කළේ)
सोम √ सु > सोमसुत् - सोमसुद् (සෝමරස මිරිකූයේ)

क्वनिप् ප්‍රත්‍යය

राजन् + √ युध् > राजयुध्वन् > राजयुध्वा (රජුට පහර දුන්නේ)

राजन् + √ कृ > राजकृत्वन् > राजकृत्वा (රජු කළේ)

पार + √ दृस् > पारदृस्वन् > पारदृश्वा (පරතෙර දුටුවේ)

ड ප්‍රත්‍යය

परि √ खन् > परिखा - परिखा (හාත්පසින් කනින ලද දිය අගල)

सरस् √ जन् > सरोज - सरोजम् (විලෙහි උපන්නේ)

क्त (त) හා क्तवत् (तवत्) ප්‍රත්‍යය

क्त (त) ප්‍රත්‍යය

සකර්මක ධාතූන් කෙරෙන් පර ව අතීතකාල කර්මකාරකයෙහි **क्त (त)** හා **क्तवत् (तवत्)** යන ප්‍රත්‍යය යොදා ගැනේ. මෙම ප්‍රත්‍යයාන්ත කෘදන්තයකින් වාක්‍යයක් අවසන් කිරීමට ද හැකියාව පවතී. ආඛ්‍යාත පදයක් යෙදීම අවශ්‍ය නොවේ. එබැවින් ම ඒවා නිෂ්ඨා කෘදන්ත ගණයට ද ඇතුළත් වේ. **त** හා **तवत्** යනු මෙහි ශේෂ වන ශුද්ධ ප්‍රත්‍යයද්වය යි.

පහත ක්‍රම සාවධාන ව අධ්‍යයනය කරන්න.

පළමු ක්‍රමය

धातु + त

√ कृ	+	त =	कृत	(කළ)
√ ज्ञा	+	त =	ज्ञात	(දැනගත්)
√ नी	+	त =	नीत	(පැමිණ වූ)
√ भू	+	त =	भूत	(වූ)

දෙවැනි ක්‍රමය

धातु + इ + त

√ लिख् + इ + त	= लिखित	(ලියූ)
√ खाद् + इ + त	= खादित	(කනලද)
√ विद् + इ + त	= विदित	(දැනගත්)
√ चिन्त् + इ + त	= चिन्तित	(සිතූ/සිතනලද)

තෙවැනි ක්‍රමය

धातु (नम्) + त

√ गम् + त	= गत	(ගිය)
√ हन् + त	= हत	(නැසූ)
√ रम् + त	= रत	(ඇලුණු)
√ मन् + त	= मत	(සිතූ)

සිවුවැනි ක්‍රමය

धातु (X) + त

√ श्रम् + त	= श्रान्त	(වෙහෙසුණු)
√ भ्रम् + त	= भ्रान्त	(කැරකුණු)
√ शम् + त	= शान्त	(නිවුණු)
√ दम् +त	= दान्त	(දැමුණු)

පස්වැනි ක්‍රමය

√ धातु + त > ट

√ नश् + त	= नष्ट	(නැසුණු)
√ दृश् + त	= दृष्ट	(දුටු)
√ तुष् + त	= तुष्ट	(සතුටු වූ)

සැ.යු.

- X යන සංකේතයෙන් කියවෙන්නේ ධාතුවේ ස්වරය දීර්ඝ කළ යුතු බවයි.

හයවැනි ක්‍රමය

धातु (वर्गाक्षरस्य चतुर्थमक्षरम्) + त > ध

√ लभ् + त = लब्ध (ලබන ලද)

√ रुध् + त = रुद्ध (ආවරණය කළ)

√ बुध् + त = बुद्ध (අවබෝධ කළ)

හත්වැනි ක්‍රමය

(व य र ल) <> धातु + त

⇩

उ इ ऋ लृ <> धातु + त

√ वच् + त > उच् +त = उक्त (කියන ලද)

√ वप् + त > उप् +त = उप्त (වැපිරූ)

√ वस् + त > उष् +त = उषित (විසූ)

√ यज् + त > इज् + त > इष् + त = इष्ट (යාග කළ)

विशेषरूपाणि

√ सह् + त = सोढ (ඉසිලූ)

√ स्था + त = स्थित (සිටි)

√ मुच् + त = मुक्त (මිදුණු)

√ पा + त = पीत (බොන ලද)

√ रुज् + त = रुग्ण (බිඳුණු)

क्तवत् (तवत्) ප්‍රත්‍යය

√ अङ्क् + इ + त = अङ्कितः अङ्कितवान् (සලකුණු කළ)
√ कम्प् + इ + त = कम्पितः कम्पितवान् (සෙලවුණු)
√ अर्ज् + इ + त = अर्जितः अर्जितवान् (රැස්කළ)
√ क्षुध् + इ + त = क्षुधितः क्षुधितवान् (බඩසයින් පෙළුණු)
√ खाद् + इ + त = खादितः खादितवान् (කන ලද)
√ कथ् + इ + त = कथितः कथितवान् (කියූ)

√ पठ् + तवत् = पठितवत् पठितवान् (පාඩම්කළ)
√ दा + तवत् = दत्तवत् दत्तवान् (දුන්)
√ ग्रह् + तवत् = गृहीतवत् गृहीतवान् (අල්ලාගත්)
√ जि + तवत् = जितवत् जितवान् (දිනූ)
√ हन् + तवत् = हतवत् हतवान् (නැසූ)
√ खाद् + तवत् = खादितवत् खादितवान् (කන ලද)

त ප්‍රත්‍යය

धातवः	पु.	नपुं.	स्त्री.
√ पठ्	पठित	पठितम्	पठिता
√ स्ना	स्नात	स्नातम्	स्नाता
√ पा	पीत	पीतम्	पीता
√ भू	भूत	भूतम्	भूता
√ कृ	कृत	कृतम्	कृता
√ त्यज्	त्यक्त	त्यक्तम्	त्यक्ता

तवत् ප්‍රත්‍යය

धातवः	पु.	नपुं.	स्त्री.
√ पठ्	पठितवान्	पठितवत्	पठितवती
√ स्ना	स्नातवान्	स्नातवत्	स्नातवती
√ पा	पीतवान्	पीतवत्	पीतवती
√ भू	भूतवान्	भूतवत्	भूतवती
√ कृ	कृतवान्	कृतवत्	कृतवती
√ त्यज्	त्यक्तवान्	त्यक्तवत्	त्यक्तवती

නොමිලේ බෙදා හැරීම පිණිසයි

• 'त' ප්‍රත්‍යයාන්ත කෘදන්ත පද භාවිත වන අයුරු

प्रातरत्र मया स्नातं भवता शयितं कथम्।

अधीतः शिशुभिः पाठम् उक्तं तैर्मधुरं वचः॥

කෘත්‍ය කෘදන්ත

• तव्य / अनीय / य ප්‍රත්‍යය

पापात् सदैव भेतव्यं न वक्तव्यं मृषा क्वचित्।

पालनीया गुरोराज्ञा पूजनीयः सदातिथिः॥

• ඉහත පද්‍යයෙහි වර්ණ ගන්වා ඇති පද පිළිබඳ අවධානය යොමු කරන්න. එම කෘදන්ත රූප භාෂාවේ යෙදෙන අවස්ථා තේරුම් ගන්න.

√ दा + तव्य > दातव्य (දිය යුතු / දීමට සුදුසු)

√ गम् + अनीय > गमनीय (යා යුතු / යෑමට සුදුසු)

तव्य ප්‍රත්‍යය එකතු වන විට ඇතැම් ධාතූන්ගේ මුල් ස්වරය ගුණ වේ. සමහර තැන්හි එසේ නොවේ.

√ कृ + तव्य > कर्तव्य (කළ යුතු)
√ एध् + इ + तव्य > एधितव्य (වැඩිය යුතු)
√ पत् + इ + तव्य > पतितव्य (වැටිය යුතු)
√ दा+ तव्य > दातव्य (දිය යුතු)
√ जि+ तव्य > जेतव्य (දිනිය යුතු)
√ नी + तव्य > नेतव्य (පැමිණවිය යුතු)

अनीय ප්‍රත්‍යය ද එකතු වන්නේ ගුණ වූ ධාතුවකට ය.

√ सृज् + अनीय > सर्जनीय (මැවීමට සුදුසු)
√ तृप् + अनीय > तर्पणीय (සතුටට සුදුසු)

√ शुभ् + अनीय > शोभनीय (බැබලිය යුතු)
√ कृ + अनीय > करणीय (කළ යුතු)
√ बुध् + अनीय > बोधनीय (අවබෝධකළ යුතු)
√ नी + अनीय > नयनीय (පැමිණවිය යුතු)

අභ්‍යාසය 12.1

- පහත සඳහන් වගුවල කෘදන්ත පදවලට අර්ථ සපයන්න.

12.1-i

धातु	तव्य	अनीय	अर्थ
√ सृज्	स्रष्टव्य	सर्जनीय	
√ छिद्	छेतव्य	छेदनीय	
√ भिद्	भेतव्य	भेदनीय	
√ पच्	पक्तव्य	पचनीय	
√ कथ्	कथितव्य	कथनीय	
√ चुर्	चोरितव्य	चोरणीय	
√ भू	भवितव्य	भवनीय	
√ नी	नेतव्य	नयनीय	
√ भी	भेतव्य	भयनीय	
√ पठ्	पठितव्य	पठनीय	
√ वच्	वक्तव्य	वचनीय	
√ कृ	कर्तव्य	करणीय	
√ पूज्	पूजितव्य	पूजनीय	

12.1-ii

धातु	तव्य	अनीय	अर्थ
√ अट्	अटितव्यम्	अटनीयम्	
√ अर्च्	अर्चितव्यम्	अर्चनीयम्	
√ कृ	कर्तव्यम्	करणीयम्	
√ क्री	क्रेतव्यम्	क्रयणीयम्	
√ गम्	गन्तव्यम्	गमनीयम्	
√ ग्रह्	ग्रहीतव्यम्	ग्रहणीयम्	

- **य** ප්‍රත්‍යය පර ව සිටි විට ධාතුගත **आ** ස්වරය **ए** බවට පත් වේ.

√ दा + य > द् + आ + य > द् + ए + य > देय (දිය යුතු / දීමට සුදුසු)

අභ්‍යාසය 12.2

1. ඉහත උදාහරණය ඇසුරින් පහත ධාතු හා ප්‍රත්‍යය එක්කොට කෘදන්ත පද සාදා අර්ථ ද ලියන්න.

√ धा + य > ....

√ हा + य > ....

√ पा + य > ....

√ ज्ञा + य > ....

2. පහත ශ්ලෝකයෙහි කෘදන්ත පද වෙන්කර දක්වන්න.

गेयं गीतानामसहस्रं ध्येयं श्रीपतिरूपमजस्रम् ।
नेयं सज्जनसङ्गे चित्तं देयं दीनजनाय च वित्तम् ॥

- ධාත්වන්තයෙහි වූ य, इ, ई, उ, ऊ, යන වර්ණ ගුණ බවට හෝ වෘද්ධි බවට පත් වේ. ऋ ॠ වර්ණ වෘද්ධි වේ.

  √ जि + य > जे + य > जेय (දිනිය යුතු / දිනීමට සුදුසු)

  √ नी + य > ने + य > नेय (ගෙනයා යුතු / ගෙනයාමට සුදුසු)

  √ कृ + य > कार् + य > कार्य (කළ යුතු / කිරීමට සුදුසු)

- හුදකලා ව්‍යඤ්ජනයකට පෙරටු ව සිටි इ, उ ගුණ වේ. ඇතැම් විට अ කාරය දීර්ඝ වී හෝ නොවී පවතී. ऋ වෙනස් නොවේ.

  √ भिद् + य > भेद् + य > भेद्य (බිඳිය යුතු / බිඳීමට සුදුසු)

  √ युज् + य > योज् + य > योग्य (යෙදිය යුතු / යෙදීමට සුදුසු)

√ वच् + य > वाच् + य > वाच्य (वाक्य)

√ दृश् + य > दृश्य

√ शप् + य > शप्य

√ शक + य > शक्य

√ गद् + य > गद्य

√ रम् + य > रम्य

√ पद् + य > पद्य

मनसा सततम्

मनसा सततं स्मरणीयम्
वचसा सततं वदनीयम्
लोकहितं मम करणीयम् ॥ लोकहितम् ॥

न भोगभवने रमणीयम्
न च सुखशयने शयनीयम्
अहर्निशं जागरणीयम्
लोकहितं मम करणीयम् ॥ मनसा ॥

न जातु दुःखं गणनीयम्
न च निजसौख्यं मननीयम्
कार्यक्षेत्रे त्वरणीयम्
लोकहितं मम करणीयम् ॥ मनसा ॥

दुःखसागरे तरणीयम्
कष्टपर्वते चरणीयम्
विपत्तिविपिने भ्रमणीयम्
लोकहितं मम करणीयम् ॥ मनसा ॥

- श्रीधर भास्कर वर्णेकरः

https://youtube/uyvungSDuXy

ක්‍රියාකාරකම 12.1

01. පහත පද්‍යයන්හි ඇති කෘදන්ත ශබ්ද තෝරා ලියන්න.

आलस्यं सर्वदा त्यज्यं कार्यं पित्रोः प्रियं सुतैः।
दरिद्राय धनं देयं कृत्यं परहितं सदा॥
वक्तव्यं मधुरं वाक्यं दग्धव्या कटुभाषिता।
पातव्यं निर्मलं नीरं स्मरणियं गुरोर्वचः॥
मोचनीयं स्वशैथिल्यं सहनीयं सतां वचः।
द्रोहणीयं न कस्मैचित् मोहनीयं न चापदि
दमनीयः स्वयं चात्मा तदिदं वेदशासनम्॥

ක්‍රියාකාරකම 12.2

02. පහත ඡේදය සාවධාන ව කියවන්න.

कश्चन व्याधः अस्ति। सः अतीव दुष्टः निष्करुणः च। एकदा सः वनं गच्छति। तत्र जालं प्रसारयति। एका कपोती जाले पतति। व्याधः कपोतीं पञ्जरे स्थापयति" अग्रे गच्छति च। तदा वृष्टिः आरब्धा। भीतः व्याधः आश्रयम् अन्विष्यति। एकस्य महावृक्षस्य अधः आगच्छति। सः वृक्षम् उद्दिश्य- भोः अत्र यः वसति" तं प्रति शरणागतः अस्मि। मां रक्षतु'' इति कथयति। तत्र वृक्षे ? एकः कपोतः आसीत्। कपोतः व्याधस्य पञ्जरे स्थितां पत्नीं पश्यति। तदा सा कपोती पतिम् उद्दिश्य वदति- ''एषः व्याधः शीतार्तः, क्षुधार्तः अस्माकं गृहम् आगतः अस्ति। एतस्य सत्कारं करोतु'' इति। पत्न्याः वचनं कपोतः अङ्गीकरोति। सः अङ्गारकम् आनयति। अग्निं ज्वालयति। व्याधं वदति- शशभोः! व्याध शीतबाधां दूरीकरोतु'' इति। अनन्तरं कपोतः चिन्तयति- ''व्याधः क्षुधार्तः। तस्मै दातुं गृहे आहारं नास्ति। किं करोमि ? '' इति। कपोतः व्याधं वदति ''अतिथिमहाशय ! आहारं ददामि। कृपया स्वीकरोतु'' इति। ततः कपोतः व्याधस्य आहारार्थम् अग्निं प्रविशति। कपोतस्य त्यागं दृष्ट्वा व्याधः लज्जाम् अनुभवति। कपोतीं बन्धनात् मोचयति। कपोती अपि पतिविरहदुःखेन अग्निं प्रविशति। इत्थं कपोती-कपोतयोः त्यागं दृष्ट्वा व्याधः दुःखेन अश्रूणि स्रावयति।

03. ඉහත ඡේදයේ ඇති වර්තමානකාලික ක්‍රියාපදයනට සුදුසු අතීත කෘදන්ත පද සකසා පහත ඡේදයේ හිස්තැන් පුරවන්න.

कश्चन व्याधः आसीत्। सः अतीव दुष्टः निष्करुणः च। एकदा सः वनं गतवान्। तत्र जालं ....। एका कपोती जाले ....। व्याधः कपोतीं पञ्जरे ...., अग्रे .... च। तदा वृष्टिः आरब्धा। भीतः व्याधः आश्रयम् ....। एकस्य महावृक्षस्य अधः ....। सः वृक्षम् उद्दिश्य- शशभोः, अत्र यः वसति तं प्रति शरणागतः अस्मि। मां रक्षतु" इति ....। तत्र वृक्षे एकः कपोतः आसीत्। कपोतः व्याधस्य पञ्जरे स्थितां पत्नीं ....। तदा सा कपोती पतिम् उद्दिश्य .... "एषः व्याधः शीतार्तः, क्षुधार्तः अस्माकं गृहम् आगतः अस्ति। एतस्य सत्कारं करोतु" इति। पत्न्याः वचनं कपोतः .... सः अङ्गारकम् ....। अग्निं ....। व्याधं .... शश "भोः ! व्याध शीतबाधां दूरीकरोतु" इति। अनन्तरं कपोतः ....। व्याधः क्षुधार्तः। तस्मै दातुं गृहे आहारः नास्ति। किं करोमि? इति। कपोतः व्याधम् .... " अतिथिमहाशय ! आहारं ददामि, कृपया स्वीकरोतु" इति। ततः कपोतः व्याधस्य आहारार्थम् अग्निं ....। कपोतस्य त्यागं दृष्ट्वा व्याधः लज्जाम् अनुभवति। कपोतीं बन्धनात् मोचयति। कपोती अपि पतिविरह दुःखेन अग्निं प्रविशति। इत्थं कपोती-कपोतयोः त्यागं दृष्ट्वा व्याधः दुःखेन अश्रूणि स्त्रावयति।

उपायेन हि यत्कुर्यात्तन्नशक्यं पराक्रमैः।
උපායෙන් කළ හැකි දෙය පරාක්‍රමයෙන් කළ නොහැකි ය.

उपार्जितानामर्थानां त्याग एव हि रक्षणम्।
රැස්කළ ධනය පරිත්‍යාග කිරීම ම රැකීම නම් වේ.

उप्तं सुकृतबीजं हि सुक्षेत्रेषु महत्फलम्।
සාරවත් බිමෙහි වපුරන ලද යහපත් බීජය මහත්ඵල ගෙන දෙයි.

१३

त्रयोदशः पाठः।

वयं मिलित्वा वाक्यानि रचयामः।

(එක් වී අපි වැකි ලියමු)

वाक्यनिर्माणपरिचयः। ०१

පුහුණුවට

अद्य	-	අද	प्रातः	-	උදෑසන
प्रत्यूषे	-	අලුයම	चन्द्रवारे / सोमवारे	-	සඳුදා
एकवादने	-	1.00 ට	सपादसप्तवादने	-	7.15 ට
सार्धपञ्चवादने	-	5.30 ට	पूर्वमाघे / उत्तरपौषे	-	ජනවාරි මාසයේ

අභ්‍යාසය 13.1

1. පහත සඳහන් නාමපදයන්හි බහුවචන රූප ලියන්න.

गृहगोधिका >	उलूकः >	गृहपतिः >	सारमेयः > ....
चित्रलः >	चषकः >	चमसः >	उपधानम् > ....
कविः >	बन्धुः >	भ्राता >	माता > ....
रज्जुः >	सरोवरः >	त्यागः >	शास्त्रं > ....
धेनुः >	धनिकः >	चित्रम् >	देवी > ....

2. සුදුසු ක්‍රියාපද යොදා හිස්තැන් පුරවන්න.

१. मुनी -	२. गुरवः - ....
३. आचार्याः -	४. सा - ....
५. ते -	६. ताः - ....
७. दासः -	८. माता - ....
९. बालिके -	१०. खगाः - ....

3. පහත සඳහන් වාක්‍ය ද්විවචනයට හරවන්න.

१. हंसः कूजति। -	२. मनुष्यः व्रजति। - ....
३. कविः रचयति। -	४. बालिका नृत्यति। - ....
५. चोरः चोरयति। -	६. नटः प्रविशति। - ....
७. साधुः भाषति। -	८. सारमेयः भषति। - ....
९. अश्वः चरति। -	१०. सारथिः नयति। - ....

අභ්‍යාසය 13.2

1. පහත සඳහන් වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කරන්න.

    1. නිහඬ ව ඉන්න.
    2. උදෑසන 7.30ට එහෙ යන්න.
    3. අලුයම අවදි වෙන්න.
    4. සඳුදා නොවරදවා ම එන්න.
    5. ජනවාරි මාසේ එහි යන්න එපා.
    6. එහෙ මෙහෙ ඇවිදින්න එපා.
    7. හෙමින් කන්න.
    8. ඇත්ත කියන්න. බොරු කියන්න එපා.
    9. කවදාවත් අමතක කරන්න එපා.
    10. ඉක්මනින් ලිපියක් එවන්න.

2. පහත සඳහන් වාක්‍ය ප්‍රථමපුරුෂයට හරවන්න.

१. अहम् आगच्छामि।	-	२. आवां नयावः।	- ....
३. वयं नृत्यामः।	-	४. अहं न चोरयामि।	- ....
५. वयं लिखामः।	-	६. आवां न रक्षावः।	- ....
७. अहम् इच्छामि।	-	८. वयं तुष्यामः।	- ....
९. आवां मिलावः।	-	१०. अहं क्षालयामि।	- ....

3. පහත සඳහන් ක්‍රියාපද ඒකවචනයට හරවන්න.

१. क्षाम्यन्ति।	-	२. भ्राम्यथः।	- ....
३. मुञ्चथ।	-	४. क्षिपन्ति।	- ....
५. वर्णयामः।	-	६. रचयावः।	- ....
७. भूषयामः।	-	८. भक्षयन्ति।	- ....
९. स्पृशथः।	-	१०. दीव्यामः।	- ....

ප්‍රථමා ද්විතීයා විභක්ති

- सा चलनचित्रं पश्यति ।
- अहं सेवाफलं खादामि ।
- मार्जारः मत्स्यं चोरयति ।
- पिता कार्यालयं गच्छति ।

මෙම වාක්‍යයන්හි **चलनचित्रं** - **सेवाफलं** - **मत्स्यं** - **कार्यालयं** යන පද කර්මපදයෝ වෙති. ඒවා ද්විතීයා විභක්තියෙන් තබා ඇත. ප්‍රධාන වශයෙන් කර්තෘකාරක වාක්‍යයක කර්මපදය තනනු ලබන්නේ ද්විතීයා විභක්ත්‍යනුකූල ව ය. ඉහත පළමු වාක්‍යයෙහි තේරුම 'ඇය **චිත්‍රපටියක් නරඹයි**'. යන්නයි. '**මම ඇපල් ගෙඩියක් කමි**', '**පූසා මාළුවකු සොරකම් කරයි**'. යනු දෙවන හා තෙවැනි වාක්‍යයන්හි අර්ථ වේ. ඒ වාක්‍යයන්හි කර්මපදය එක හා සමාන ලෙස යෙදී ඇත. එහෙත් සිව්වැනි වාක්‍යයෙහි තේරුම '**තාත්තා කාර්යාලයට යයි**' වේ. **චිත්‍රපටියක්, ඇපල් ගෙඩියක්, මාළුවකු** යන කර්මපදයන්ට වඩා '**කාර්යාලයට**' යන වචනය වෙනස් වේ. ඒ අනුව ක්‍රියාව විඳින්නා පමණක් නොව, **ගමනාර්ථයෙහි** ද ද්විතීයා විභක්තිය භාවිත වේ.

උදා :- गुरवः विद्यालयं गच्छन्ति । (ගුරුවරු පාසලට යති)

वैद्यमहोदयः चिकित्सालयं गच्छति । (වෛද්‍යවරයා රෝහලට යයි)

मुनी आश्रमं प्रविशतः । (මුනිවරු දෙදෙනා අසපුවට පිවිසෙත්)

ක්‍රියාකාරකම 13.1

- පහත වගුව ඇසුරෙන් සුදුසු පද තෝරා අර්ථවත් වාක්‍ය නිර්මාණය කරන්න.

सः - सा - कवी - कन्ये - मातरौ तौ - मार्जाराः कवयः - अश्वः	पयोहिमं - जम्बीरफलं पायासं - पुस्तकं - पुष्पाणि कपोतान् - धर्मं - धनं उपहारं - गुरून् - फलानि तृणं	यच्छति । खादति । पचतः । पश्यतः । चोरयन्ति । यच्छतः । खादन्ति । चरति । रचयतः ।

අභ්‍යාසය 13.3

1. පහත වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කරන්න.

01. ඔවුහු පන්සලට යති.
02. මුනිවරු අසපුවලට යති.
03. ගුරුවරු දෙදෙනා පුස්තකාලයට පිවිසෙත්.
04. ගැහැණු ළමයි වැවට බසිති.
05. කුමාරිකාවෝ උයනට යති.
06. ඔබ පාසලට යහි ද?
07. අම්මා පොළට යයි.
08. ගොවියෝ කුඹුරුවලට යති.
09. කුරුල්ලෝ කැදලි කරා පියාඹති.
10. අපි කඩේට යමු.

2. පහත සඳහන් වාක්‍ය අතීතකාලයට හරවන්න.

०१. त्वं कुत्र गच्छसि ?
०२. वयं क्षीरं पिबामः।
०३. ते पुस्तकं पठन्ति।
०४. मातरः शिशून् रक्षन्ति।
०५. बालिके गीतं गायतः।
०६. युवां कुत्र वसथः?
०७. तौ किं मन्त्रयतः?
०८. कृषीवलौ वृषभौ ताडयतः।
०९. अहं संस्कृतं लिखामि।
१०. कवयः चन्द्रं वर्णयन्ति।

තෘතීයා විභක්තිය

කර්මකාරක වාක්‍යයක ප්‍රධාන වනුයේ කර්මපදය යි. ප්‍රධාන කර්මය ප්‍රථමා විභක්තියෙන් තැබේ. මෙබඳු වාක්‍යයන්හි කර්තෘපදය තබන්නේ තෘතීයා හෙවත් තුන්වැනි විභක්තියෙනි.

i. තෘතීයා විභක්තිය කර්මකාරක වාක්‍යයන්හි කර්තෘපදය ලෙස යෙදීම.

උදා :-

पुत्र्या दूरदर्शनं दृश्यते ।	**දුව විසින්** රූපවාහිනිය නරඹනු ලැබේ.
पित्रा वार्तापत्रिका पठ्यते ।	**තාත්තා විසින්** පුවත්පත කියවනු ලැබේ.
मात्रा पायासं पच्यते ।	**අම්මා විසින්** කිරිබත උයනු ලැබේ.

ii. විසින් - යන අර්ථය ද තෘතීයා විභක්තියෙන් සූචනය කෙරේ.

ගොවියා විසින්	-	कृषिकेन
වඳුරා විසින්	-	कपिना
නෑයා විසින්	-	बन्धुना
අම්මා විසින්	-	मात्रा

අභ්‍යාසය 13.4

- සුදුසු පද යොදා හිස්තැන් පුරවන්න.

०१.	पुस्तकः रच्यते ।	(ලේඛකයා විසින්)
०२.	पुत्रः नीयते ।	(තාත්තා විසින්)
०३.	बीजानि उप्यन्ते ।	(ගොවියන් විසින්)
०४.	श्लोकः पठ्यते ।	(ඇය විසින්)
०५.	भारः उह्यते ।	(සේවකයන් දෙදෙනා විසින්)
०६.	कदलीफले खाद्येते ।	(වඳුරන් විසින්)
०७.	पञ्चालिका दीयते ।	(අම්මා විසින්)

०८. .... मृगः म्रियते। (සිංහයා විසින්)

०९. .... धनं चोर्यते। (සොරුන් විසින්)

१०. .... जालं कृन्त्यते। (මීයන් දෙදෙනා විසින්)

iii. सह - सार्धं - समं - साकं (සමග) යන නිපාත සමග යෙදෙන නාමපදයන් ද තෘතීයා විභක්තියෙන් තැබේ.

ගොවියා සමග	-	कृषिकेन	सह
වඳුරා සමග	-	कपिना	
නෑයා සමග	-	बन्धुना	
අම්මා සමග	-	मात्रा	

අභ්‍යාසය 13.5

- පහත සඳහන් වාක්‍යයන් सह - सार्धं - समं - साकं නිපාත පද යොදා වාක්‍ය සංස්කෘතයට නගන්න.

01. ඔහු ඇය සමග පාසල් යයි.
02. අම්මා තාත්තා සමග බයිසිකලයෙන් පොළට ගියා ය.
03. ඔබ මා සමග එහි යහි ද?
04. නුඹලා ඊයේ ඔවුන් සමග පාඩම් කළෙහු.
05. මුනිවරු පඬිවරුන් සමග ධර්මය සාකච්ඡා කළහ.
06. ශිව දෙවිඳු උමාව සමග හිමාලයට ගියේ ය.
07. මුවෝ මුවදෙනුන් සමග වනයෙහි හැසිරෙති.
08. මීමැස්සා මීමැස්සිය සමග මල් පැණි බොයි.
09. රජතුමා ඇමැතිවරුන් දෙදෙනා සමග පිටරට ගියේ ය.
10. ගුරුවරු දෙදෙනා ළමයින් සමග චාරිකාව යත්.

iv. යම් කිසිවක උපකාරයෙන් යමක් කරයි ද එය ද ප්‍රකාශ කරනුයේ ද තෘතීයා විභක්තියෙනි.

- शिक्षकः सुधाखण्डेन लिखति। (ගුරුවරයා හුණුකැල්ලෙන් ලියයි)

අභ්‍යාසය 13.6

- පහත වාක්‍ය සිංහලට නගන්න.

०१. कृषिकः हलेन कर्षति ।

०२. जनाः पुष्पैः बुद्धं पूजयन्ति ।

०३. सा छुरिकया शाकं कर्तयति ।

०४. पुरुषः पादाभ्यां चलति ।

०५. उपासकाः हस्ताभ्यां प्रणमन्ति ।

०६. चटकाः चञ्चुभिः भक्षयन्ति ।

०७. माता घट्याः समयं जानाति ।

०८. नराः विमानेन विदेशं गच्छन्ति ।

०९. छात्रः द्विचक्रेण पाठालयं विशति ।

१०. बालिका लेखन्या सुन्दराक्षराणि लिखति ।

v. विना යෝගයේ ද තෘතීයා විභක්තිය යෙදේ.

विना - හැර / තොර ව

- सूर्येण विना प्रकाशः न भवति । (හිරුගෙන් තොර එළියක් නොවේ)

අභ්‍යාසය 13.7

- පහත වාක්‍ය සිංහලට නගන්න.

०१. घट्या विना समयं ज्ञातुं न शक्नोति ।

०२. गृहं बालकैः विना न शोभते ।

०३. धर्मेण विना मित्रं नास्ति ।

०४. विना पतिभिः न शोभन्ते वनिताः ।

०५. वयं नेत्राभ्यां विना द्रष्टुं न शक्नुमः ।

०६. जलेन विना पुष्पाणि म्लायन्ते ।

०७. बालकः मात्रा विना न गच्छति ।

०८. वयं तैः विना न जीवामः ।

०९. भोजनं लवणेन विना रुचिकरं न भवति ।

१०. सभा पण्डितेन विना न शोभते ।

<u>චතුර්ථී විභක්තිය</u>

परोपकारः पुण्याय पापाय परपीडनम् ।

I. චතුර්ථී විභක්තිය සම්ප්‍රදානාර්ථයෙහි යෙදේ.

උදා :-

मात्रे शाटिकां ददाति । (අම්මාට සාරියක් දෙයි)

स्वस्रे पञ्चालिकां यच्छति । (නංගීට බෝනික්කෙක් දෙයි)

II. ඒ හැරුණු විට සඳහා, පිණිස යනාර්ථයන්හි ද චතුර්ථී විභක්තිය යෙදේ.

උදා :- बालकाः ज्ञानाय विद्यालयं गच्छन्ति । (ළමයි ඥානය පිණිස පාසලට යති)

මෙහි ළමයි පාසලට යනු ලබන්නේ දැනුම ලබාගැනීම සඳහා ය. ඒ නිසා ज्ञानाय යන පදය චතුර්ථී විභක්තියෙන් තබා ඇත.

අභ්‍යාසය 13.8

1. පහත වගුව ඇසුරෙන් වාක්‍ය 10ක් නිර්මාණය කරන්න.

अग्रजः - अनुजः - स्वसा माता - पिता	मोक्षाय	धर्मे सञ्चरति ।
याचकः - व्याघ्रः - भिक्षुः	आहाराय गोचराय पिण्डाय	नगरं वनं } प्रविशति । ग्रामं

2. පහත සඳහන් වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කරන්න.

01. අපි විනෝදය පිණිස සතුන් නොමරමු.
02. සැප පිණිස ධර්මයෙහි හැසිරෙන්න.
03. ගැහැණු ළමයි නෑම සඳහා වැවට යති.
04. රජතුමා යුද පිණිස යුද්ධභූමියට පිවිසෙයි.
05. ඔවුහු රට උදෙසා දිවි පූජා කළහ.
06. ඈ ඉගෙනීම සඳහා මුදල් වියදම් කළා ය.
07. මම මෝක්ෂය පිණිස කුසල් පුරමි.
08. දෙමව්පියෝ දරුවන්ගේ සැප පිණිස දුක් විඳිති.
09. ගුරුවරු සතුට සඳහා උගන්වති.
10. මුනිවරු දුකින් මිදීම සඳහා වෙර දරති.

iii. **नमः - स्वस्ति** නිපාතයන් ද චතුර්ථී විභක්ති පද සමග යෙදේ.
නමස්කාර වේවා / සෙත්වේවා යනු එම නිපාතයන්හි අර්ථ වේ.

बुद्धाय देवाय ब्रह्माय मात्रे पित्रे	नमः

ते मह्यम् एतस्मै एतस्यै सर्वस्मै	स्वस्ति

අභ්‍යාසය 13.9

- ඉහත වගුව ඇසුරෙන් වාක්‍ය 10ක් නිර්මාණය කර ඒවා සිංහලට නගන්න.

පඤ්චමී විභක්තිය

पादपानां भयं वातात् पद्मानां शिशिराद् भयम्।

पर्वतानां भयं वज्रात् साधूनां दुर्जनाद् भयम्।

යමකින් හෝ යම් කෙනෙකුගෙන් යමෙක් හෝ යම් දෙයක් වෙන් වේ නම් ඒ වෙන්වීමට සීමා වූ වස්තුව අපාදාන නම් වේ. ඒ අපාදානාර්ථයෙහි පඤ්චමී විභක්තිය යෙදේ. මේ අපාදානය දෙවැදෑරුම් වේ.

01. චලාපාදානය 02. අචලාපාදානය වශයෙනි.

ස්ථාවර නොවන දෙයකින් වෙන් වේ නම් එය චලාපාදාන නම් වේ. අචලාපාදාන යනු ස්ථාවර දෙයකින් සිදුවන වෙන්වීමයි.

උදා :-
- दुर्जनाद् भयम्।
- आचार्याद् ज्ञानं लभते। යන වාක්‍ය චලාපාදානයට නිදසුන් වේ.

- पद्मानां शिशिराद् भयम्।
- पर्वताद् नदी प्रवहति। යන වාක්‍යය අචලාපාදානයට නිදසුන් වේ.

අභ්‍යාසය 13.10

(අ) වගුව ඇසුරෙන් වාක්‍ය නිර්මාණය කරන්න.
(ආ) එම වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

पितामहः - पितामही खगः - सिंहः - नौका	गृहात् नीडात् - गुहायाः - कूलात्		निष्क्रमति।
गुरवः - छात्राः पितरः - सेवकाः	विद्यालयात् कार्यालयात्		प्रत्यागच्छन्ति।
नद्यः - निर्झराः	पर्वतात् - पर्वतेभ्यः		प्रवहन्ति।
अहं - आवां -वयं त्वं -युवं - यूयं	ग्रामात्	नगरं प्रवासं वनं	प्रति गच्छामि। गच्छावः। गच्छामः। प्रति गच्छसि। गच्छथः। गच्छथ।

ෂෂ්ඨී විභක්තිය

तक्षकस्य विषं दन्ते मक्षिकाश्च मस्तके ।
वृश्चिकस्याविषं पुच्छे सर्वाङ्गे दुर्जनस्य च ॥

ස්වාමී අර්ථයෙහි ෂෂ්ඨී විභක්තිය යෙදේ. එනම් යම් දෙයක අයිතිය අඟවන නාමපදය ෂෂ්ඨී විභක්තියෙන් තැබිය යුතු වේ.

दुहिता भर्तुः गृहं गच्छति । माता दुहितुः शिशुं लालयति । शिशवः मातॄणां गानेन तुष्यन्ति । पत्नी पत्युः आज्ञाम् अनुसरति । पुत्रः पितुः आज्ञया जामातुः गृहात् स्वसारम् आनयति । वयं शकटस्य शब्दम् आकर्णयामः । यूयं धेनोः क्षीरं पिबथ ।

- बालादर्शे नवमः पाठः ।

අභ්‍යාසය 13.11

1. (අ) ඉහත ඡේදයෙහි ෂෂ්ඨී විභක්ති පද උපුටා දක්වන්න.
   (ආ) එහි ඒකවචනයෙන් යෙදී ඇති පදවල බහුවචනය දක්වන්න.
   (ඇ) ඉහත ඡේදයෙහි සරල අදහස ලියන්න.

2. පහත සඳහන් වාක්‍යය සංස්කෘතයට නගන්න.

01. මේ අපේ දේශයයි.
02. ඔහුගේ දේශනයට සවන්දෙන්න.
03. සිසුන්ගේ තරග අද පැවැත්වේ.
04. හිරුගේ රැසින් මල් පිපේ.
05. මුනිවරුන්ගේ අනුශාසනා අනුගමනය කරමු.
06. එහි ගැහැණු ළමයින්ගේ පාසලක් ඇත.
07. අපේ මව්බස සිංහල වේ.
08. ඔබගේ නැගණියගේ නම මොකක් ද?
09. ඔබේ මිතුරාගේ පන්තිය කොහේ ද?
10. කිරි අත්තාගේ කතාව මිහිරි ය.

සප්තමී විභක්තිය

स्वगृहे पूज्यते मूर्खः स्वग्रामे पूज्यते प्रभुः।
स्वदेशे पूज्यते राजा विद्वान् सर्वत्र पूज्यते॥

i. සප්තමී විභක්තිය ආධාරාර්ථයෙහි යෙදේ. කර්තෘ හා කර්මය දරන්නා ආධාර නම් වේ.

काकः शाखायाम् उपविशति। स दिवा आकाशे डयते नक्तं नीडे वसति। भेकाः वापीषु वसन्ति। ते वर्षासु रटन्ति। भेकः भूमौ प्लवते। लतासु कुसुमानि विकसन्ति। वयं तरुषु फलानि पश्यामः। समुद्रे रत्नानि जायन्ते। नराः भूमौ वसन्ति। देवाः स्वर्गे तिष्ठन्ति।

- बालादर्शे दशमः पाठः।

යම් දෙයක හෝ යම් කෙනෙකු දරා සිටින ස්ථානය හැඟවීම

मनुष्यः / देवः / भिक्षुः भूपतिः / गृहपतिः / मुनिः गुरुः / शुकः / मत्स्यः	कुत्र	वसति ?
	लोके - स्वर्गे- विहारे- प्रासादे गृहे - आश्रमे - पाठालये नीडे - जले	वसति

උදා :-

खगः कुत्र वसति ?   खगः नीडे वसति।

අභ්‍යාසය 13.12

(අ) උදාහරණයට අනුව ඉහත වගුව ඇසුරෙන් වාක්‍ය 10ක් නිර්මාණය කරන්න.
(ආ) පහත වගුව ඇසුරෙන් ද වාක්‍යය තනා ඒවා සිංහලට පරිවර්තනය කරන්න.

देवः / भिक्षुः / भूपतिः गृहपतिः / मुनिः गुरुः / शुकः	कुत्र		वसति ?
	एकस्मिन् तस्मिन्	स्वर्गे- विहारे- प्रासादे गृहे - आश्रमे पाठालये - नीडे	वसति।

ii. කාලාර්ථයෙහි ද සප්තමී විභක්තිය යෙදේ.

त्वं कदा तत्र गच्छसि ?	अहं	एकवादने सार्धसप्तवादने सपादाष्टवादने पञ्चोन द्वादशवादने अस्मिन् सप्ताहे अद्य प्रत्यूषे अस्मिन् बुधवारे रविवारे	गच्छामि।

උදා :- त्वं कदा तत्र गच्छसि ? ඔබ එහි යන්නේ කීයට ද?

अहं सार्धसप्तवादने गच्छामि। මම එහි 7.30ට යමි.

අභ්‍යාසය 13.13

- ඉහත වගුව ඇසුරෙන් වාක්‍ය 08ක් නිර්මාණය කරන්න.

උපකාරක පද

गृहगोपिका	- හූනා	चित्रलः	- විචිත්‍ර වර්ණය
सरोवरः	- විල	चमासः	- කැවුම
उपधानम्	- කොට්ටය	विपण	- පොළ
पञ्चालिका	- බෝනික්කා	छुरिका	- පිහිය
मधुप	- මී මැස්සා	मधुपा	- මී මැස්සී
हलम्	- නගුල	घटी	- ඔරලෝසුව
विमान	- ගුවන්යානය	लेखनी	- පෑන
निर्झर	- දිය ඇල්ල	प्रत्यूषे	- අලුයම
क्षालयामि	- සෝදමි	मिलति	- හමුවෙයි
दीव्यति	- ක්‍රීඩාකරයි		

अङ्गीकृतं सुकृतिनः परिपालयन्ति ।

යහපත් අය තමා පිළිගත් දෙය රැකගනිත්.

अचिन्त्यं हि फलं सूते सद्यः सुकृतपादपः ।

යහපත් වෘක්ෂ නොසිතිය හැකි තරම් ඵල ලබාදෙයි.

अतिभुक्तिरतीवोक्तिः सद्यः प्राणापहारिणी ।

අධික කෑමත් අධික කථාවත් ඉක්මනින් මරණය ළඟාකරයි.

१४
चतुर्दशः पाठः।

तत्र कोऽपि सन्देहो नास्ति।

(එහි කිසිදු සැකයක් නැත)

वाक्यनिर्माणपरिचयः। ०२

අභ්‍යාසය 14.1

1. පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

०१. स्वागतम् । इदानीं त्वं तेन सह कुत्र गच्छसि।

०२. क्षम्यताम्। अत्र केवलं मा तिष्ठ।

०३. चिन्ता मास्तु। सा प्रवासं न गमिष्यति।

०४. कृपया प्रतीक्षां कुरु। सहसा प्रातरासं कृत्वा आगमिष्यामि।

०५. भवान् अयं सङ्केतः कुत्रेति जानासि। आम्। एवमेव अग्रे गच्छन्तु। वामतः क्रीडाङ्गणं दृश्यते। तस्य दक्षिणतः तत् तव मित्रस्य गृहमस्ति।

०६. तथा न वदतु। तत्र कोऽपि सन्देहो नास्ति। किमर्थं पूर्वं न उक्तवान्।

०७. सा कुत्र केन सार्धं गतेति निश्चयो नास्ति।

०८. किमर्थं एतावान् विलम्ब इति मा पृच्छ। भवतः वचनं सत्यम्। मम वचनं कः श्रुणोति।

०९. अन्यथा मा चिन्तय। यानं न प्राप्तम्। अत एव विलम्बः।

१०. यावदहं प्रत्यागच्छामि। तावत् प्रतीक्षां करोतु। कतिवारमुक्तवान् एतद् मह्यं न रोचते इति।

2. පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කරන්න.

01. පෙර ලංකාවේ යුද්ධයෙහි දක්ෂ චිරප්‍රසිද්ධ රජකෙනෙක් වාසය කළේ ය.

02. සිංහයා කැලයෙහි සිටින සිව්පාවුන් අතර නායකයා වේ.

03. පොහෝ දින පන්සල් එන - යන උපාසකවරු ධර්මශාලාවෙහි වාඩි වී සිටියහ.

04. ඇය මල්ලී සමග නවකථාවක් ගැනීමට නගරයෙහි බැංකුව අසල පොත්හලට ගියා ය.

05. අද උත්සවයෙහි ගී ගැයූ ශිෂ්‍යාව මගේ එක ම නංගී වේ.

06. තාත්තා උදේ 7.00ට කාර්යාලයට ගොස් දිනපතා හවස 5.30ට ගෙදර එයි.

07. වඳුරෝ අත්තෙන් අත්තට පනිමින්, ඉදුණු පලතුරු කඩාගෙන කෑහ.

08. අපේ ගමේ හැමදා ම හවස පන්සල ළඟ පිට්ටනියේ සෙල්ලම් කරන පිරිමි ළමයි ධර්මශාලාව ප්‍රතිසංස්කරණය කළහ.

09. දේශනය කළ ගුරුවරයාට, පාසලේ සිසුහු තෑග්ගක් පරිත්‍යාග කරති.

10. පාන්දර අවදිවන සීයා, කුස්සිය ළඟ මඩුවේ සිටින එළදෙන ළඟට ගොස් කිරි දොවයි.

1. පහත සඳහන් වාක්‍ය බහුවචනයට හරවන්න.

०१. हस्ती तिष्ठति। शीर्षं चलति।
०२. श्वेतः पक्षी डयते।
०३. मम मित्रं मेधावी अस्ति।
०४. धननी नारी दानं ददाति।
०५. गुरुर्विद्या विद्यार्थिनं प्रश्नं पृच्छति।
०६. भगिनी पुष्पाणि जिघ्रति।
०७. छात्रोः घटिकां विलोकयति।
०८. सौचिकः सूच्या सीव्यति।
०९. पुत्री मात्रा सह उपविशति।
१०. स पञ्जरस्थाभ्यां पक्षिभ्यां पानीयं ददाति।
११. चौरः प्रहरिणो बिभेति।
१२. राजा हस्तिनोऽवरोहति।
१३. अस्य पक्षिणः पक्षौ सुन्दरौ स्तः।
१४. पुत्री मातुराज्ञां पालयति।
१५. शिक्षको विद्यार्थिषु विद्यार्थिनीषु च स्नेहं करोति।
१६. मयि बहिर्गते मम भ्राता मम पुस्तकं पपाठ।
१७. हंसः पुष्करिण्यां क्रीडति।
१८. अन्नं दाता सर्वेषु दातृषु उत्तमो भवति।
१९. हे मित्र ! दरिद्रेभ्यो ! धनं देहि।
२०. हे भ्रातः - त्वमपि सावधानं भूत्वा सत्यमेव कथय।

2. පහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

०१. मयि विद्यालयं गते मम स्वसा मिष्टान्नं चखाद।
०२. भिक्षुरद्य ग्रामे बभ्राम।
०३. पित्राद्य मार्गणाय रूप्यके ददौ।
०४. नार्यो मन्दिरे ननृतुः।
०५. मम भगिनी मम पुस्तिकायां लिलेख।
०६. मम पितामहो नवीनं कार्यं चकार।
०७. चौरा अद्य बहूनि गृहोपकारणानि चोरयामासुः।
०८. पुरा अपि युवका धनमर्जितुं विदेशं जग्मुः।

3. සුදුසු පරිදි යා කර, වාක්‍ය තනා ඒවා සිංහලට පරිවර්තනය කරන්න.

अ	आ
छात्राः विद्यालयं गन्तुम्	पतत् अस्ति।
बालिका वृक्षान् जलम्	तत्पराः भवन्तः सन्ति।
वृक्षात् फलम्	पठन्तौ स्वः।
यूयं किम्	सिञ्चन्ती अस्ति।
आवां पाठम्	कुर्वन्तः स्थ।

අභ්‍යාසය 14.3

1. පහත සඳහන් වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

०१. एकवारं दृष्टं नरं मा विस्मर।
०२. दुर्जनोऽदत्तं परद्रव्यमप्यादत्ते।
०३. अपरिचितो जनः सहसा न विश्वसनीयः।
०४. त्वयानीतं जलं शीतमासीत्।
०५. मम स्वसा वाट्यां मृतं सर्पं ददर्श।
०६. त्वया क्रीतं पुस्तकमेकवारं मां दर्शय।
०७. सम्यक् प्रक्षालितानि फलान्येव खाद।
०८. क्षेत्रं कृष्टवान् कृषिकः तत्र बीजानि वपति।
०९. शास्त्रमधीतवान् जनः तस्य व्याख्यानं करोति।
१०. निरपराधं जनं ताडितवान् पुरुषो निन्दितो भवति।

2. श्रोतुम् - नेतुम् - स्थातुम् - हर्तुम् - प्रेक्षितुम् - गन्तुम् - त्यक्तुम् - द्रष्टुम् - पक्तुम् - कर्तुम् ज्ञातुम् - प्राप्तुम् - वोढुम् - कथयितुम् යන තුමන්ත ක්‍රියාපද යොදමින් පරිපූර්ණ වාක්‍ය බැගින් රචනා කරන්න.

3. √गम् - √भू - √नी - √हृ - √पा - √ग्रह् - √मन् - √वच् - √हा - √हन् යන ධාතුන්ගෙන් සෑදෙන පූර්වක්‍රියා භාවිත කරමින් අර්ථවත් වාක්‍ය 10ක් නිර්මාණය කරන්න.

උපකාරක පද

प्रवासम् - විදේශගතවීම
सहसा - වහා
सङ्केतः - ලිපිනය
उपन्यासम् - නවකථාව
पुस्तकापणम् - පොත්හල
अनुजा - නැගෙණිය
पक्व - ඉදුණු
मिष्टान्नम् - රසකැවිලි
अपरिचित - නුපුරුදු
सोचिकः - රෙදි මසන්නා

प्रतीक्षा - රැඳී සිටීම
प्रातरासम् - උදේ ආහාරය
विलम्बः - ප්‍රමාදය
वित्तकोषः - බැංකුව
नवकथा - නවකථාව
कार्यालयम् / अधिकारियम् - කාර්යාලය
कुटी - මඩුව
वाटी - ගෙවත්ත
मार्गणः - හිඟන්නා
तत्पराः - උනන්දුවෙන්

अवचित्य - කඩා
प्रबुध्यमानः - අවදිවෙනවා
जिघ्रति - ආඝ්‍රාණය කරයි
बिभेति - බයවෙයි
पक्तुम् - පිසින්නට

लम्पन्तः / प्लवन्तः - පනිමින්
घ्नन्ति - නසති
सीव्यति - මසයි
वोढुम् - උසුලන්නට
ननृतुः - නැටුවාහ

प्रत्यासन्नविपत्तिमूढमनसां प्रायो मतिः क्षीयते ।
ළං වූ විපත් ඇති මෝඩයන්ගේ නුවණ පිරිහේ.

प्रवादमोहितः प्रायो न विचारक्षमो जनः ।
කථාවලින් මුළා වූ ජනයා විචාරශීලී නොවේ.

प्राणानुदारा विमृजन्त्यर्थिनो न पराङ्मुखाः ।
උදාර අදහස් ඇත්තෝ ජීවිත පරිත්‍යාග කරත්. බියසුල්ලෝ එසේ නොකරත්.

१५
पञ्चदशः पाठः ।

सस्नेहं निमन्त्रयामि ।

(සාදරයෙන් අමතමි)

रचनापरिचयः । ०१

ක්‍රියාකාරකම 15.1

01. පහත සඳහන් රචනාවෙහි හිස්තැන් සුදුසු පරිදි සම්පූර්ණ කර නැවත ලියන්න.

मम .... नाम । अहं ....अस्मि । मम ग्रामः ....नाम । स ....जनपदो अस्ति । तत्र.................. ....जनाः वसन्ति । केचित् ....च भवन्ति । तेषां प्रामुख्यजीवनोपायं .... भवति । मम पिता .... नाम । स एकस्मिन्......... .... सेवां करोति । मम जननी ....भवति । सा .... एव वसति । किन्तु नित्यमेव अस्माकम् अभिवृद्ध्यै .... । पितामहः ....अभूत्। पितामही .... नाम । सा मुख्या .... उपासिका भवति स्म । मातामहो दिवंगतः । मातामही अस्माकं गृहे ....सह वसति । सा नित्यम् ऐतिहासिककथाः............................... । मे एका स्वसा अपि .... । सा ....विद्यालये .... वर्गे पठति । अनुजः तस्मिन्नेव .... ज्येष्ठवर्गे .... । अग्रजः एकस्मिन् .... सेवां .... । अस्माकं गृहे .... नाम शुनकपोतकः कोऽप्यस्ति । वयं सर्वे तं .... । मम स्वसा .... सह नित्यं .... । अस्माकं .... दूरदर्शनं न .... । ततः वयं सायं पुस्तकानि .... । पिता सर्वदा वार्तापत्रिकां .... । माता उच्चैः गीतानि .... । मातामही उच्चैः श्लोकाः .... । रात्रौ .... सम्भूय अन्नं............................ । अहं .... समीपे शयनं .... ।

පහත වාක්‍ය හදාරන්න.

- गच्छति ।
- स गच्छति ।
- स नगरं गच्छति ।
- अग्रजः नगरं गच्छति ।
- अग्रजः मात्रा सह नगरं गच्छति ।
- अग्रजः प्रातः मात्रा सह नगरं गच्छति ।
- अग्रजः प्रातः मात्रा सह द्विचक्रेण नगरं गच्छति ।
- अग्रजः प्रातः पञ्चवादने मात्रा सह द्विचक्रेण नगरं गच्छति ।
- अग्रजः प्रातः पञ्चवादने क्षीरं पीत्वा मात्रा सह द्विचक्रेण नगरं गच्छति ।
- अग्रजः प्रातः पञ्चवादने क्षीरं पीत्वा मात्रा सह द्विचक्रेण शाकानि क्रीणार्थं नगरं गच्छति ।
- अग्रजः प्रातः पञ्चवादने क्षीरं पीत्वा मात्रा सह द्विचक्रेण शाकानि क्रीणार्थं शनैः शनैः नगरं गच्छति ।

ක්‍රියාකාරකම 15.2

- ඉහත වාක්‍ය රටා අනුව පහත සඳහන් වාක්‍ය සංස්කෘතයට නගන්න.

01. උදේ 6.30ට පෙර, තාත්තා නංගී සමග කාර්යාලයට බසයෙන් යයි.
02. කිරි අත්තා, කිරි අම්මා සමග බයිසිකලයෙන් හැමදා ම හවස හයට පන්සලට ගොස් බණ අසයි.
03. අපි දිනපතා උදේ 7.30ට පෙර ඉගෙනීම සඳහා බසයෙන් පාසලට යමු.
04. මිනිස්සු භාණ්ඩ මිලදී ගැනීමට ඉරිදා උදේ දරුවන් සමග දුම්රියෙන් නගරයට යති.
05. නිමල් මල්ලී සමග අද උදේ 10.00ට පොතක් කියවීමට කාර් එකෙන් පුස්තකාලයට ගියේ ය.

- චිත්‍රය ඇසුරෙන් වාක්‍ය 10ක් සංස්කෘත භාෂාවෙන් ලියන්න.

सूर्यः - कोकिलः - रक्तकेसरः
मधुरपिष्टकानि - स्थालिकाः

....

....

....

....

....

- චිත්‍රය ඇසුරෙන් වාක්‍ය 10ක් සංස්කෘත භාෂාවෙන් ලියන්න.

शकटाः - शाकटिकाः - धान्यानि
- सारमेयाः - कुक्कुटाः - चलन्ति

....

....

....

....

....

- චිත්‍රය ඇසුරෙන් වාක්‍ය 10ක් සංස්කෘත භාෂාවෙන් ලියන්න.

तरी - पुलिनम् - आसन्दी -
वायुच्छत्रम् - प्लवन - वागोलः

....

....

....

....

....

• චිත්‍රය ඇසුරෙන් වාක්‍ය 10ක් සංස්කෘත භාෂාවෙන් ලියන්න.

सर्वयानस्थानम् - उत्तरणसेतुः -
चालकः - सोपानपथः -स्यूतः

....

....

....

....

....

ක්‍රියාකාරකම 15.4

01. පහත වාක්‍ය රටා අධ්‍යයනය කර, තවත් එබඳු වාක්‍ය නිර්මාණය කරන්න.

प्रथमं सोपानम्।

आम्रवृक्षात् पत्राणि पतन्ति। तस्मात् फलानि अपि पतन्ति।

(අඹ ගසෙන් පත්‍රයෝ වැටෙති. එසේ ම ඵලයෝ ද වැටෙති)

पिता पुत्र्यै स्नेहं कुरुते। माता अपि तस्यै स्नेहं कुरुते।

(පියා දියණියට ආදරය දක්වයි. මව ද ඇයට ආදරය කරයි)

द्वितीयं सोपानम्।

सर्वे संभूय तिष्ठन्ति। (සියල්ලෝ රැස් වී සිටිති)

पादयोः निपत्य प्रार्थयते। (දෙපාමුල වැටී ඉල්ලයි)

तां सन्त्यज्याहं गच्छामि। (ඇය හැරදමා මම යමි)

तृतीयं सोपानम्।

अहं बहिर्गन्तुम् इच्छामि।
(මම එළියට යන්නට කැමැත්තෙමි)

मातरं द्रष्टुं गच्छति।
(අම්මා බලන්නට යයි)

चतुर्थं सोपानम्।

अधिकारी लिखन् दूरवाणीं गृह्णाति।
(අධිකාරීවරයා ලියමින් දුරකථනය ගනියි)

छात्रः पाठान् अवगच्छन् उत्तरं लिखति।
(සිසුවා පාඩම තේරුම් ගනිමින් උත්තර ලියයි)

पञ्चमं सोपानम्।

सा पुस्तकं पठती निद्रां करोति।
(ඇය පොත පාඩම් කරමින් නිදයි)

अचला जलं नयती सख्या सह सम्भाषणं करोति।
(අචලා වතුර ගෙනෙමින් යෙහෙළිය සමග කථා කරයි)

01. පහත උදාහරණ ඔස්සේ ආරාධනා පත්‍රයක් සංස්කෘත භාෂාවෙන් නිර්මාණය කරන්න.

निमन्त्रणपत्रम् ।

कार्यक्रमः ।
दिनाङ्कः -
समयः -
स्थानम् -

मान्याः / आर्य / आर्ये

सगौरवभक्तिप्रेम्णा श्रीमन् /श्रीमति आत्मजस्य प्रथमजन्मदिनोत्सवाय निमन्त्रणं कुर्मः । सकुटुम्बं भवतां उपस्थितिः सम्प्राथ्यते ।

दर्शनोत्सुकः - भवदीयः ....
दूरभाषः...............

निमन्त्रणम् ।

प्रियार्य/ प्रियार्ये /श्रीमन् /श्रीमति

सस्नेहं सगौरवम् अस्माकं विद्यालये वार्षिक त्यागप्रदानोत्सवाय तुभ्यं समाराधनं कुर्मः । भवदागमनस्य प्रतीक्षायाम् ।

कार्यक्रमः ।
दिनाङ्कः -
समयः -
स्थानम् -

आमन्त्रकः ....

दूरभाषः ....

ක්‍රියාකාරකම 15.6

01. පහත සඳහන් දෙබස් අධ්‍යයනය කර සිංහලට පරිවර්තනය කරන්න.

02. දෙබස ඇසුරෙන් සරල සංවාදයක් නිර්මාණය කරන්න.

सुनीरः - सुप्रभातम्। स्वागतम्।
मयन्तः - तथैवास्तु भवान्। अपि सर्वं कुशलम्।
सुनीरः - आम्। सर्वमेव कुशलम्।
मयन्तः - अद्य कुत्र गच्छसि।
सुनीरः - अहम् अनुराधपुरं गच्छामि।
मयन्तः - किमर्थम्?
सुनीरः - अस्माकं मातुलस्य गृहम् अनुराधपुरेऽस्ति। मात्रा सह तत्र गच्छामि।
मयन्तः - सर्वयानेन अथवा धूमयानेन?
सुनीरः - धूमयानेन गन्तुम् इच्छामि। मातापि तथैवेच्छति।
मयन्तः - तथा अस्तु। विलम्बः जातः। शीघ्रं गन्तव्यम्। यात्रा ते सुखदा भूयात्।
सुनीरः - बहुशः धन्यवादः। पुनर्मिलामः।

ක්‍රියාකාරකම 15.7

01. පහත සඳහන් මාතෘකා ඔස්සේ සංස්කෘත භාෂාවෙන් කථාවක් ඉදිරිපත් කරන්න.

- महेन्द्रागमनम्।
- पारिसरिकरक्षणोपायः।
- देवानांप्रियतिष्य राजा।
- सिद्धार्थकुमरोत्पत्तिः।
- विद्या ददाति विनयम्।
- वसन्तकालः।
- अस्माकं विद्यालयः।
- परोपकारः।
- वृक्षरोपणम्।
- अस्माकं देशः।

පළමු උදාහරණය

हे प्रियसदस्याः अद्य अहं ....
विषये एकां कथां कथयिष्यामि । सर्वें मे कर्णं देहि ।

දෙවන උදාහරණය

स्वस्ति / मङ्गलं ते / स्वागतम्
अत्राभ्यागतेभ्यः सर्वेंभ्यः मन्दावकाशं देहि मे किञ्चित् संस्कृतभाषया वक्तुम् ।

තෙවන උදාහරණය

समाराधितः प्राधाननिमन्त्रकप्रमुखाः, हे सर्वें प्रियार्यमिश्राः । अहं ....
अस्मि । इदानीं दैवीभाषया किञ्चिद् वक्ष्यामि सावधानं तच्छ्रुणु ।

සිවුවන උදාහරණය

अत्रासनमलङ्कृतवन्तः सर्वें ते सस्नेहं संस्मृत्य यथाशक्तिः संस्कृतभाषया वक्तुं प्रयत्नं करोमि । अद्याहं श्री लङ्कायां पारिवेणिकाध्यापनविषये कतिचित् मम चिन्ताः सूचयामि ।

කථාවසානයට උදාහරණ කිහිපයක්

පළමු උදාහරණය

सावधानेन श्रुतवन्तः सर्वे ते, मम भक्तिप्रणामं नियच्छामि। धन्यवादाः। स्वस्त्यस्तु।

දෙවන උදාහරණය

इदानीं मम कथा समाप्ता। सर्वे नित्यमेव यद् मयाद्य उक्तं तत् कदापि मा विस्मरत। शिवास्ते पन्थानः सन्तु।

තෙවන උදාහරණය

यथाशक्तिः त्वमपि संस्कृतभाषया किञ्चित् किञ्चित् वक्तुं लिखितुं च प्रयत्नं कुरु। सर्वदा इयं भाषा वर्धनाय प्रयत्नं करवाम। बहुशः धन्यवादाः। शिवा च सुन्दरा च भूयात् ते जीवनयात्रा।

සිවුවන උදාහරණය

सर्वे भद्राणि पश्यन्तु। मया यदभिहितं तत् सत्यं किल। सर्वे सदस्याः मम प्रणामं सादरेणैव प्रतिगृह्णन्तु। अद्य प्रभृति संस्कृतभाषाद्यनाय प्रयत्नं कुरुत। मङ्गलं ते। सदा जयलक्ष्मीर्भूयात्।

कामक्रोधौ हि सत्त्वानां मोक्षद्वारार्गलादुभौ।

කාමය හා ක්‍රෝධය සත්ත්වයන්ගේ විමුක්ති දොරටුවට බාධක වෙත්.

कामं न श्रेयसे कस्य संगमः पुण्यकर्मभिः।

පින්කම්වල යෙදීම කවරකුගේ යහපත පිණිස හේතු නොවේ ද?

किं किं न साधयति कल्पलतेव विद्या।

කප්රුකක් වැනි වූ ශාස්ත්‍රය කුමක් ලබා නොදේ ද?

१६
षोडशः पाठः।

अनभ्यासे विषं विद्या।

(පුහුණුවෙන් තොර ඉගෙනුම විෂ වේ)

रचनापरिचयः। ०२

ආදර්ශ රචනා පුහුණුව

विद्यालयः - විදුහල

විද්‍යාවෙහි ආලය විද්‍යාලය වේ. ආලය ශබ්දය ගෙදර යනාර්ථය හඟවයි. පාසල් ගමේ ද නගරයේ ද ඇත. පාසලේ ගුරුවරු ද සිටිති. පාසලේ ගුරුවරියෝ ද සිටිති.

विद्यायाः आलयः विद्यालयः इति कथ्यते। आलय शब्दः गृहं बोधयति। विद्यालयाः ग्रामे अपि भवन्ति। विद्यालयाः नगरे अपि सन्ति। विद्यालये शिक्षिकाश्च भवन्ति। विद्यालये शिक्षकाश्च सन्ति।

माता - අම්මා

අපේ ලෝකයේ සඳු මව්තොමෝ ය. හිරු පියතුමා ය. ඔවුන් දෙදෙනා අපේ දියුණුව සඳහා නිතර කෙළවරක් නැති දුක් උසුලත්. කවියෝ බහුල ව මව්සෙනෙහස වර්ණනා කරති. පිය සෙනෙහස එලෙස වර්ණනා නොකරනු ලැබේ.

अस्मिन् जगति माता तारापतिः पिता दिवाकरः च भवति। तौ अस्मान् अभिवृद्ध्यै नित्यमेव अपारकष्टं वहतः। बहवः कवयः प्रायेण मातृस्नेहं वर्णयन्ति। पितृप्रेमं तथा न वर्ण्यते।

मद्यपानम् - මද්‍යපානය

මද්‍යපානය අද සමාජයෙහි ව්‍යසනයක් බව සියලුදෙනා ම දනිති. එහෙත් බොහෝ මිනිස්සු මත්පැන් බොති. මත්පැනෙහි ඇලුණු තැනැත්තෝ ම මත්පැන් බීමෙහි ආදීනව මැනවින් දනිති. එහෙත් ඔවුහු මත්පැන් බීම අත්හරින්නට උත්සාහ නොකරති. ඒ නිසා ඔවුහු මත්පැන් දැලෙහි වැටී අධික කටුක දුක් විඳිති. බොහෝ අය මත්පැනෙහි ආදීනව දන්නේ නමුත් මත්පැන් බොති. ඊට හේතුව මත්පැනෙහි ඇති ඇදගැනීමේ හැකියාව යැයි සිතමි.

मद्यपानम् अद्य समाजे व्यसनमिति सर्वेऽपि जानन्ति। किन्तु बहवः जनाः मद्यपानं कुर्वन्ति। मद्यपानसक्ताः एव केवलं मद्यपानस्य व्यसनं सम्यग् जानन्ति। तथा अपि ते मद्यपानं त्यक्तुम् उत्साहं न कुर्वन्ति। तस्मात् ते मद्यपानजाले पतित्वा अतीव कष्टम् अनुभवन्ति। बहवः मद्यसक्ताः हानिं जानन्नपि मध्यं पिबन्ति। तत्र हेतुं मद्यस्य आकर्षणशक्तिमिति मन्ये।

अहम् आम्रम्। - මම අඹ ගෙඩියක්මි

अहं तव प्रियम् आम्रफलम् अस्मि। साम्प्रतम् अहं पक्वं मधुरं सरसं च भवामि। किन्तु पूर्वम् अहं बीजरूपेण उद्यानस्य एकस्मिन् कोणे अन्धकारपूर्णे गर्ते अवसम्। कश्चित् जनः मां बीजं जलेन असिञ्चत्। मह्यं खाद्यं च अयच्छत्। भोजनं खादित्वा जलं च पीत्वा अहं पुष्टः अभवम्। शनैः शनैः अङ्कुरः भूत्वा अहं बहिः आगच्छम्। पूर्वम् अहं लघुः पादपः आसम्। क्रमेण अहं दीर्घः घनः वृक्षः अभवम्। अधुना मम पत्राणि हरितानि छाया च शीतला भवति......।

ආදර්ශ රචනා

सुखम्।

सर्वे जनाः संसारे सुखमिच्छन्ति। सुखं च धनेनैव प्राप्तुं शक्यते। अतो धनोपार्जनस्य महती आवश्यकता भवति। अद्यत्वे यत्र कुत्रचिदपि गच्छामः तत्र सर्वत्रैव धनस्य माहात्म्यं पश्यामः। धनेन विना न विद्योपार्जनं कर्तुं शक्यते, न जीविकानिर्वाहश्च भवति। सुखार्थं, परोपकारार्थं, त्यागार्थं, दानार्थं, विवाहार्थं, पुत्रादिसंरक्षणार्थं, गार्हस्थ्यसंचालनार्थं, भोजनार्थं, भवननिर्माणार्थं सर्वत्रैव धनस्यावश्यकता भवति। यस्य समीपं धनं नास्ति तस्य कश्चिदपि अभिलाषो न पूर्तिमेति। यस्य समीपे धनं भवति स एव सुखेन शेते। स एव संसारे कुलीनो विद्वान् गुणज्ञो दानी इति कथ्यते।

विद्या धनम्।

सर्वेषु धनेषु विद्याधनम् एव उत्तमं धनं मन्यते। विद्यया एव जनाः जानन्ति यत् किं कर्तव्यम् अस्ति किं च अकर्तव्यम्। अनया एव ज्ञायते यत् किम् उचितम् अस्ति किं च अनुचितम्। विद्याधनेन एव वयं जानीमः यत् कः सन्मार्गः अस्ति कः च कुमार्गः। विद्यया एव मनुष्यः संसारे सम्मानं प्राप्नोति। विद्याधनाय वारं वारं नमः।

सायाह्नसमयः।

सायङ्काले अस्ताचलं प्रति गच्छन् भगवान् सूर्यः चिन्तितः अभवत्- "मयि गते सम्पूर्णः संसारः अन्धकारे निमग्नः भविष्यति। लोकानां व्यवहारः कथं चलिष्यति ? मां विना सर्वे जीवाः दुःखम् अनुभविष्यन्ति।" तस्य एतं भावं विज्ञाय एकः लघुदीपः सविनयं निवेदितवान् - "भगवन्। अलं चिन्तया। यद्यपि मम प्रकाशः क्षीणः तथापि जनानां सेवायाम् अहं यथाशक्ति स्वजीवनं समर्पयिष्यामि, कार्याणि च साधायिष्यामि।"

क्रोधः।

क्रोधः मनुष्यस्य महान् शत्रुः। क्रुद्धः जनः गुरून् अपि निन्दति, अपभाषणं करोति, ज्येष्ठनानां हितवचनानि अपि न श्रुणोति। तस्माद् वयं क्रोधे सावधानाः भवेम। यदि क्रोधः आगच्छति तदा तस्मिन् एव क्षणे मौनं धारणीयम्। मौनेन मनः शान्त भवति। वाणी अपि नियन्त्रिता भवति। ईदृशो काले किञ्चित् पुस्तकं गृहीत्वा पठेम। कोपात् सर्वदा आत्मानं रक्षेम।

सुखिनो जनः।

सर्वे जनाः सुखिनः भवितुम् इच्छन्ति। सुखस्य किं मूलम् ? उद्यमः, नियमः, संयमः एतानि त्रीणि यस्य मित्राणि स सर्वदा एव सुखी भवति। सः कदापि आलस्यं न करोति, जीवने सदाचारस्य नियमान् पालयति, विविधेषु आकर्षणेषु सक्तः न भवतिघ अतः सर्वदा सन्तुष्टः शान्तिम् अनुभवति, सुखं च लभते। नूनं सुखस्य साधनानि अस्माकं हस्ते एव विराजन्ते।

अहं द्रुमः अस्मि।

अहम् एकः छिन्नः द्रुमः अस्मि। ह्यः वने एकः नरः आगच्छत्। सः काष्ठाय मम शरीरम् अछिन्नत्। छेदनेन मे शरीरे अनेके व्रणाः जाताः। छुरिकायाः प्रहारेण शरीराद् अश्रुरूपाः जलबिन्दवः अपतन्। अकथनीया मम पीडा। हृदयं विदीर्णं जातम्। अश्रुभिः कण्ठः अवरुद्धः। मम अन्तकालः समीपे एव तिष्ठति। काष्ठाणि एकत्रीकृत्य स तु अगच्छत्। परं कोऽस्ति अत्र वृथाकथाश्रवणाय ? वृक्षान् छित्वा नरः प्रकृतिमातुः अङ्गानि नाशयति। इन्धनाय, कर्गदपत्राय, भवननिर्माणाय मम काष्ठस्य प्रयोगः भवति। किन्तु कुतः मे पत्राणि, पुष्पाणि कुतः च रोगनिवारणाय औषधयः ? निराश्रिताः भविष्यन्ति आश्रिताः खगाः कीटपतङ्गाश्च। पन्थानः अपि छायाहीनाः भविष्यन्ति। आतपेन तप्तः श्रान्तः पथिकः अधुना कुत्र गमिष्यति ? मम जीवने पुनः वसन्तर्तुः व आगमिष्यति।

(अभ्यासपुस्तकात्)

प्रातः कालः।

अहो रमणीया प्रातः कालस्य वेला। सूर्यः उदयाचले अरुणाकिरणैः उदेति। उपवने जनाः भ्रमन्ति व्यायामं च कुर्वन्ति। आकाशे खगाः कलरवं कुर्वन्ति। वृद्धाः प्रबुद्धाः सन्ति। युवकाः युवतयः चापि प्रबुद्धाः सन्ति। बालाः विद्यालयं प्रति गच्छन्ति। अध्यापकाः अध्यापिकाश्च विद्यालयं प्रति तीव्रगत्या गच्छन्तः दृश्यन्ते। अद्यापकान् अध्यापिकांश्च बालकान् बालिकाश्च त्यक्तुं विद्यालयेभ्यः बहिः कार्यानानां पङ्क्तिः अस्ति। कृषकाः क्षेत्रं प्रति गच्छन्ति। सर्वे जनाः स्वकार्येषु लग्नाः सन्ति। मन्दः समीरः वहति। सर्वत्र आनन्दमयं वातावरणम् अस्ति। प्रातः कालस्य समयः सर्वेषु जनेषु नव-जीवनं सञ्चारयति। तापसाः आश्रमेषु यजन्ति। भक्ताः देवालयं गच्छन्ति। शिशवः विश्रामस्य पश्चात् प्रसन्नाः भवन्ति। सरणिषु जनाः इतः तत आगच्छन्ति। मन्दिरेषु शंखनादस्य मधुरः ध्वनिः श्रूयते।

(अभ्यासपुस्तकात्)

अंगुलीमालः ।

पूर्वं कोसलदेशे कोसलो नाम नरेन्द्रः आसीत्। स भगवतः शाक्यमुनीन्द्रस्य अनुगामिको भवति स्म। तस्य राजसभायां पुरोहितस्यैकः पुत्रोऽभवत्। तस्य पुत्रोत्पत्तिसमये सर्वाणि शस्त्राणि दीप्तानि। तद् अशुभनिमित्तमिति ज्योतिश्शास्त्रज्ञो निर्दिष्टवान्। स भविष्यति काले चोरो भूत्वा मनुष्यघातको भविष्यतीति ज्योतिश उक्तवान्। पुरोहितः तच्छ्रुत्वा पुत्रं हन्तुं चिन्तयामास। तत् प्रवृत्तं श्रुत्वा राजा तं समाश्वस्य -हे भवान् ।भवतः पुत्रस्य विद्याभ्याससमये अहिंसाविषयैव विशेषशिक्षणं दातुं व्यवस्थां कुर्यादित्यवदत्। पुरोहितोऽपि तथैव कर्तुं निश्चित्य पुत्रस्य अहिंसक इत्येव नामकरणञ्च कृतवान्।

अहिंसकः सर्वाणि शास्त्राणि सम्यग् अधीतवान्। कालेन स गुरोः प्रियतमः शिष्योऽभवत्। अहिंसकस्य सहपाठिन ईर्ष्यया तमपकर्तुं कूटमुपायं रचितवन्तः। तैः प्रेरितो गुरुरहिंसकमुक्तवान्। – हे छात्र। त्वमेवास्मिन् गुरुकुले चतुरतमः शिष्यो भवसि। तस्मात् त्वयैकं गुरोपहारं कर्तव्यम्। सहस्रान् मनुष्यान् हत्वा तं पूजोपहारं करणीयम्।

अंगुलीमालो एतत् कूटोपायं न ज्ञातवान्। गुरुभक्त्या स पूजां कर्तुं मनुष्यान् हन्तुमारभत। कालेन सोऽनेकाः मनुष्याः हत्वा तेषां अंगुलीभिः मालां कृत्वा स्वयं धारयति स्म। स -अंगुलीमालः- इति चिरप्रसिद्धोऽभवत्। । वर्धमानमंगुलीमालस्य क्रूरत्वं श्रुत्वा तं सजीवं ग्रहीतुं कोसलो राजा राजपुरुषान् प्रेषितवान्। किन्त्वहिंसकः तान् सर्वान् संहृतवान्।

अंगुलीमालः जनसंहारं कृत्वा एकोनसहस्रं अंगुलीः सञ्चितवान् शीघ्रमेव। राज्ञा कोसलेन स्वयमेव गत्वा तं हन्तुं सर्वाणि कार्याणि योजितानि। तं प्रवृत्तं श्रुत्वांगुलीमालस्य माता- स्वपुत्ररक्षणाय महाविपिनं गतवती। अंगुलीमालः महाविपिने इतस्ततः सञ्चरन्तीं एकां वृद्धीं दृष्टवान्। किन्तु सा तस्य मातेति ज्ञातुं सोऽसमर्थोऽभूत्। स तां मारयितुमनुगतवान् रहसि।

अस्माकं शाक्यमुनीन्द्रोऽंगुलीमालस्य धर्मज्ञानावबोधशक्तिं दिव्यचक्षुषा दृष्टवान्। चेत् यो मातृघातकः भवेत् तस्य मार्गज्ञानलाभहानिं भवति । तस्माद् भगवान् बुद्धः महविपिनं गतवान्। भगवान् अंगुलीमालस्य पुरतो मार्गे गच्छन् आसीत्। तं दृष्ट्वा अंगुलीमालः - एनं हत्वा अंगुलीं छेत्वा मालायां संकलयामि - इति चिन्तितवान्। एवं निश्चित्य स बुद्धमनुगतवान्। अनुधावितवाञ्च । सम्यक्सम्बुद्धो यथापूर्वं मार्गे गच्छन्नेवासीत्।

अंगुलीमालः सर्वथा बुद्धमाक्रान्तुं प्रायतत- प्रायत्नोत् - किन्त्वसमर्थोऽभवत्। श्रान्तः स बुद्धम् - तिष्ठ तिष्ठ रे अलं गमनेन। अहं त्वं हत्वा तवांगुल्या सहस्रांगुलीमालां कृत्वा धारयामीत्युक्तवान्। तच्छ्रुत्वा - अहं नैव गच्छामि बाल। अत्रैव स्थितोऽस्मि। भवतो मन एव पथिक इव लक्ष्यहीनं सञ्चरति। यदि मम हननेन तव मनः शान्तिः प्राप्स्यति - तर्हि मारयितु तावत् माम्। अहं भवतः कार्यविघ्नं नैव करोमि - इति शान्तस्वरेणावदत्।

तत् शान्तवचनं श्रुत्वा व्याकूलचित्तोऽहिंसकः ज्ञानोदयं प्राप्तवान्। मनुष्यः हिंसामर्गम् अनुसरति चेत् सर्वदा मनोवेदनाम् अशान्तिं चैव प्राप्नोति - इति सोऽचिन्तयत्। पश्चात् अहिंसकः भगवान् गौतम-बुद्धस्य शरणं गतः।

पिता ।

अस्मिन् जगति माता तारापतिः पिता दिवाकरः च भवति तौ अस्मान् अभिवृद्ध्यै नित्यमेव अपारकष्टं वहतः। बहवः कवयः प्रायेण मातृप्रेमं वर्णयन्ति। पितृप्रेमं तथा न वर्ण्यन्ते। किन्तु तयोः स्नेहं सम्यग् वर्णयितुं के शक्नुवन्ति। अशक्नुवन्त्येव इति मन्ये।

पुत्राणां समृद्धिं दृष्ट्वा अस्मिन् लोके यो या हृद्या तुष्यन्ति सः पिता वा सा माता वा भवति। तथैव पुत्राः उपद्रवेषु सम्प्राप्ते यः हृद्या शोचति सः पिता वा सा माता एव भवति। एवं माता पिता च साम्यरूपेण स्वकीयपुत्रदारेषु स्नेहं कुर्वन्ति। तयोः विसदृशं कदापि न दृश्यते।

प्रायेण मातरः दाराणां सुखदुःखेषु सहसा रोदन्ति। किन्तु पितरः तथा सहसा न रोदन्ति। तेषां वक्त्रे अश्रुणि न दृश्यन्ते। किन्तु ते हृद्भिः अतीव शोचन्ति। तस्मादेव अन्तर्बाष्पं इत्यादि मेघदूतकाव्ये कालिदास-महकविना वर्णितम्।

पितरः पुत्रदारपोषणाय दिवारात्रौ महताक्लेशं अनुभवन्ति। अस्माकं शास्तुः पिता शुद्धोदन नामासीत्। सिद्धार्थकुमारस्य माता जन्मात् सप्ताहभ्यन्तरे दिवंगतवती। ततः शुद्धोदन राजा महता स्नेहेन तं पुष्ठवान्। कदापि मातुः स्नेहस्य ऊनत्वं विन्दितुमवकाशं न दत्तवान्। रम्यसुरम्यसुभा इति रमणीयाः शोभनीयाः प्रासादाः निर्मिताः। किन्तु सिद्धार्थः कुमारः नवविंशतिवर्षे अभिनिष्क्रमणं कृतवान्। षट्वर्षाः दुष्करक्रियां कृत्वा वैशाखपूर्णदिवसे सम्यक्सम्बुद्धोऽभूत्।

एकदा शाक्यमुनीन्द्रः कपिलवस्तुपुरं गतवान्। गत्वा शुद्धोदन नरेन्द्रस्य निमन्त्रणेन तस्य प्रासादे दानं भुक्तवान्। ततः पुनः गन्तुमारब्धवान्। तस्मिन् समये यशोधरा देवी तस्याः पुत्रं राहुलम्

आमन्त्र्य बुद्धं दर्शयित्वा हे पुत्र सः तव पिता गत्वा दायादं गृहाण इति प्रेषिता। सः राहुलः अपि बुद्धस्य सन्तिकं आगत्य तेन सार्धं विहारं गतवान्। ततः बुद्धनियमेन शारिपुत्रस्थविरेण राहुलकुमारः प्रव्रजितः।

तं प्रवृत्तिं श्रुत्वा शुद्धोदन राजा अतीव शोचितमग्नः सहसा विहारं गतवान्। बुद्धस्य अभिमुखे रोदमानः नरेन्द्रः एवमवदत्। लोकनाथ त्वयि अभिनिष्कृते तं दुःखं सहिष्णुं अशक्तोऽस्मि। अहं नन्दं वीक्ष्य किञ्चित् शान्तिं अनुभूतवान्। किन्तु त्वया नन्दमपि प्रव्रजितोऽसि। तस्मिन् गते अहं राहुल कुमारं वीक्ष्य शान्तीमलब्ध्वान्। त्वं तमपि आदाय गतोऽसि।इदानीं मे कस्य शरणम्। अहं कथं इदं दुःखं विरहाग्निं धारयामि वहामि च। लोकनाथ पुत्रस्नेहवियोगजं दुःखं अतीव कष्टं कटुकञ्च। तस्मात् मातापित्रोः अनुमतिः नोपलभ्य पुत्राः न प्रव्रजन्तु इति याचितवान्। शाक्यमुनीन्द्रोऽपि पितुः तम् आयाचनं संगृह्य विनयप्रज्ञाप्तिं कृतवान्। एवं शाक्यमुनीन्द्रेण अपि पितुः वचनस्य गौरवं कृतः।

तथा शुद्धोदनराजिनि व्याधिदुःखेन पीडिते सति बुद्धपुत्रः कपिलवस्तुं गत्वा स्वहस्तेन पितुः शीर्षं सादरेण परिमृश्य धर्मं देशितवान्। तं धर्मं श्रुत्वा शुद्धोदन राजा परिनिवृतवान्। एवं बुद्धपुत्रेण स्वपितरमपि अनुग्रहं कृतवान्।

मम मातृभूमिः ।

मम मातृभूमिः भारतीयसमुद्रमध्ये सुप्रतिष्ठति। तस्मात् तत् भारतीयमुक्ताफलम् इति व्यवह्रीयते। जगतः सर्वत्र तत् रमणीयं द्वीपम् इति कीर्तितम्। पुराणे लङ्का। ताम्रपर्णि। सीले इत्यादिना नाम्ना अपि तं विश्रुतमभूत्। लङ्कायां उत्तरदिशायाम् यापन नाम अर्धद्वीपम् अस्ति। तत्र पुरा एलार नाम नरेन्द्रः प्रतिवसति स्म। सः द्वाचत्वारिंशत् वर्षाः तस्मिन् अर्धद्वीपे राज्यमकरोत्। द्रविडः अपि तेन साधारणधर्मेण राज्यं कृतमिति कथ्यते। तस्मिन् काले दक्षिणदिशायां काकवर्णतिष्य नाम सिहलदेशीय राजा राज्यभारान् ऊढवान्। तस्य भार्या विहारमहादेवी आसीत्। तेषाम् तिष्य गामिणी नाम पुत्रौ स्थितवन्तौ। तेषु ज्येष्ठः गामिणि नाम। पश्चात्काले सः एलार नाम द्रविड राज्ञा सार्धं संग्रामं कृत्वा लङ्काद्वीपं एकच्छत्रमकरोत्।

लङ्कायां द्वाविंशति प्रदेशानि सन्ति। मध्यमप्रदेशे सेण्कडगल नाम पुराणनगरं दृश्यते। तस्मिन् नगरे दाठाधातुप्रासादं अस्ति। इदं लङ्कायाम् अवसानराजधानिं भवति। पुरा सेण्कडगलनगरं इति विश्रुतम्। किन्तु वर्तमाने महनुवर इति तं प्रसिद्धम्। तस्य नगरस्य नातिदूरे महावालुका नदी स्यन्दति सागरं प्रति। सा नदी समन्तकूठात् प्रभवति। महावालुका वडवे कल्याणी कलु इति प्रधानाः चतस्रः गंगाः लङ्कायां सन्ति। तासु नदीषु महावालुका प्रमुखा भवति। तस्याः नद्याः नातिदूरे पेरादेनिय नाम उद्भिदोद्यानमपि अस्ति।

लङ्कायां पश्चिमदिशायां कोलम्ब नाम संवर्धितनगरं अस्ति। तत् तस्यां प्रधानवाणिज्यनगरं भवति। लङ्कायां मुख्यानि त्रीणि तीर्थाणि सन्ति। तेषु कोलम्ब तीर्थं प्रामुख्यं भवति। लङ्कायां पूर्वदिशायां त्रिकुणामल नाम तीर्थम् अस्ति। तत् अतीते गोकण्ण नाम्ना विश्रुतमभूत्। समन्तकूठे श्री शाक्यमुनीन्द्रस्य श्री पादलाञ्छनं दृश्यते। बहवः जनाः तं वन्दनाय समन्तकूटं तुष्टमनसा गच्छन्ति। तेषु बहवः बौद्धाः भवन्ति। केचित् अन्यागमिकाः अपि सन्ति। लङ्कायां बहूनि तुङ्गपर्वतानि सन्ति। तेषु पिदुरुतलागल तुङ्गतमं पर्वतं भवति। तेभ्यः पर्वतेभ्यः बहवः नद्याः बहवः अम्बुधाराः अपि स्यन्दन्ति। तासां जलेन मनुष्याः तेषां क्षेत्रकर्माणि सुखेन कुर्वन्ति।

मम मातृभूमौ सर्वाणि भोगानि प्ररुह्यन्ते। तेषु भोगेषु नारिकेल रबर् चाया पत्राणि मुख्यानि भोगानि भवन्ति। तानि भोगानि विदेशान् अपनयन्ति। तस्मात् बहूनि मूल्यानि वयम्   अर्जयामः।

अस्मिन् देशे सिंहल द्रविड मुस्लिं बर्गर् नाम जातयः वसन्ति। ते बौद्ध। हिन्दु । मुस्लिम् आदि विविधागमेषु अनुगामिकाः भवन्ति। तेषु बौद्धाः बहवः भवन्ति। लङ्कायां बहूनि बौद्धसिद्धस्थानि दृश्यन्ते। पौराणनगरेषु विशालाः चैत्याः सन्ति। अनुराधपुरे स्वर्णमाली नाम विशालः चैत्यः अस्ति। तत् दुटुगेमुणु राज्ञा कृतम्। तस्य उत्तरदिशायां श्री महाबोधिशाखा दृश्यते। महामहिन्दक्षीणाश्रवस्य स्वस्रा संघमित्ता भिक्षुण्या आनीतम्। तया सार्धं अष्टदशशिल्पकुलानि च लङ्काद्वीपं आगतवन्तः। जेतवन नाम चैत्यः महासेन् नाम गोठाभयस्य राजपुत्रेण कृतम्। तस्य समीपे अभयगिरि नाम विशालं चैत्यम् अस्ति। तत् वट्टगामिणी नाम राज्ञा कृतम्। सः तिष्य राज्ञः पुत्रः भवति स्म। लङ्कायां कल्याणि नाम पूजाभूमिं किरिवेहेर नाम पूजाभूमिं नागदीप नाम पूजाभूमिं चादि बहूनि पूज्यस्थानि दृश्यन्ते।

ක්‍රියාකාරකම 16.1

01. පහත සඳහන් ආදර්ශ රචනාව සංස්කෘතයට පරිවර්තනය කරන්න.

අපේ ගම

අපේ ගම .... දිස්ත්‍රික්කයේ (පිහිටා) ඇත. ගමේ මිනිස්සු පන්සියයක් ජීවත් වෙති. ඇතැම් අය ගොවියෝ වෙති. රජයේ කාර්යාලවල සේවය කරන අය ද සිටිති. ගම කෙළවර කඳුවැටියක් ඇත. ඒ කන්දෙන් දිය ඇල්ලක් ගලා බසී. අවට ගම්වාසීහු දිනපතා එය නැරඹීමට පැමිණෙති. ගම මැදින් කුඩා ඇළක් ඇදී යයි. ඒ වතුරෙන් ගොවියෝ කුඹුරු වැඩ කරති. තරුණ අය එහි ජල ක්‍රීඩා කරති. විවිධ මත්ස්‍යයන් මෙහි දක්නට ලැබේ. ඇළට දකුණු පසින් පන්සල පිහිටා ඇත. පන්සලේ හාමුදුරුවරු පස්නමක් වැඩ සිටිති. පන්සලට වම් පසින් ගමේ පාසල පිහිටා ඇත. එහි ගැහැණු ළමයි ද පිරිමි ළමයි ද සිටිති. විදුහල්පතිතුමා අපේ ගමේ ම ජීවත් වෙයි. ළමයි හැමදාම පයින් පාසලට යති. ගමට ප්‍රවේශ වන තැන කඩමණ්ඩිය ඇත. ඒ අසල බස් නැවතුම ඇත. මිනිස්සු නගරයට බස් රථයෙන් යති.

बहुविघ्नास्तु सदा कल्याणसिद्धयः।
යහපත සිදු කිරීමේ දී බොහෝ උවදුරු ඇත.

बुद्धिर्नाम च सर्वत्र मुख्यं मित्रं न पौरुषम्।
පෞරුෂයට වඩා බුද්ධිය සියලු තැන ප්‍රධාන මිතුරා ය.

भवितव्यं भवत्येव कर्मणामीदृशी गतिः।
සිදුවිය යුත්ත සිදුවේ. කර්මයන්ගේ ස්වභාවය එබඳු ය.

१७

सप्तदशः पाठः।

कवयः किं न पश्यन्ति।

(කවියෝ කුමක්නම් නො දකිත් ද?)

साहित्यज्ञानम्।

භදන්තාශ්වඝෝෂ හිමි

සුන්දරී හා නන්ද අතර ඇතිවන සොඳුරු ප්‍රේමය ප්‍රධාන වස්තු විෂය කරගත් සෞන්දරනන්ද මහාකාව්‍යය භදන්තාශ්වඝෝෂ හිමියන්ගේ අග්‍රගණ්‍ය කාව්‍යය නිර්මාණයකි. සංස්කෘත මහාකාව්‍ය සම්ප්‍රදායේ පුරෝගාමියා වන උන්වහන්සේ බුද්ධචරිත මහාකාව්‍යය හැරුණුවිට ශාරිපුත්‍රප්‍රකරණ නමින් දෘශ්‍යකාව්‍යයක් ද රචනා කළහ. කාශ්මීරයෙහි කුණ්ඩලවන විහාරයෙහි පැවැත් වූ සිව්වන නොහොත් ප්‍රථම මහායානික සංගායනාවෙහි විභාෂා ග්‍රන්ථ කර්තෘ මණ්ඩලයෙහි ප්‍රධානත්වය දරන ලද්දේ ද අශ්වඝෝෂ මාහිමියෝ ය. **ලලිතවිස්තරය, මහායාන ශ්‍රද්ධොත්පාද, සූත්‍රාලංකාරාදි** මහායානික ධර්මග්‍රන්ථය ද උන්වහන්සේගේ සාහිත්‍යකරණයෙහි ප්‍රකට, විශිෂ්ට සේවාව ය. උපතින් බ්‍රාහ්මණවංශිකයකු වූ උන්වහන්සේගේ ජන්මග්‍රාමය **සාකේත නුවර** විය. මව **සුවර්ණාක්ෂි** නම් වූවා ය. පූර්ණයශස් හා පාර්ශ්ව යනාදි දාර්ශනික විද්වතුන්ගේ සදාශ්‍රයෙන් බුදුදහම වැළඳ ගෙන ඇත. කුමාරජීව විසින් චීන බසට පරිවර්තනය කරන ලද අශ්වඝෝෂ චරිතාපදානයට අනුව අශ්වඝෝෂපාදයෝ මුලින් බෞද්ධ භික්ෂූන් වහන්සේලාට අභියෝග කළ ත්‍රිවේද පාරප්‍රාප්ත බ්‍රාහ්මණයෙක් වූහ. උතුරු ඉන්දියාවෙහි විසූ පාර්ශ්ව මහ ස්ථවිරයන් මොහු හා වාද කිරීමට පැමිණ ඇත. අශ්වඝෝෂයන් බුදුදහම කෙරෙහි නැඹුරුවීමෙන් මහදර්ථයක් සිදුවන බව දැනගෙන පාර්ශ්ව තෙරහු මොහුගේ අභියෝගය භාරගත්හ. දින 07 කින් රජමැති ඇමැති රටවැසියා ඉදිරියෙහි වාදය සංවිධානය කළ අතර පරාජිතයා ජයග්‍රාහකයාගේ අතවැසියකු වීම ප්‍රධාන ගිවිසුම විය. අවසානයේ දී වාදයෙන් පරදින අශ්වඝෝෂයෝ, පාර්ශ්ව මහ ස්ථවිරයන්ගේ අතවැසියෙක් වූහ. බ්‍රාහ්මණයකු වශයෙන් චතුර්වේදාදි මූලාශ්‍රය පිළිබඳ ලද විදග්ධභාවයත්, යථෝක්ත විද්වදාශ්‍රය මගිනුත්, නිසර්ගසිද්ධ ප්‍රතිභාපූර්ණ කවිශක්තියත් සම්මිශ්‍රිත ධර්ම සන්නිවේදනය උන්වහන්සේගේ සාහිත්‍යකරණයෙහි සුවිශේෂී ලක්ෂණයකි. විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ කුශාග්‍ර බුද්ධිමතකු වූ බැවින් ම භදන්ත, ගුරු, ආචාර්යාදි ගෞරවාභිධානයන්ගෙන් විද්වජ්ජන සම්භාවනාවට පාත්‍ර වූ එතුමෝ සංස්කෘත කාව්‍ය ක්ෂේත්‍රයට හා පශ්චාත්තන නිර්මාණකරුවනට අභිනව කාව්‍ය මාර්ගයක්, සම්ප්‍රදායයක් හෙළිපෙහෙළි කළ අග්‍රගණ්‍ය නිර්මාණකරුවකු මෙන් ම ප්‍රාඥයෙක් වූහ.

''ආර්ය සුවර්ණාක්ෂි පුත්‍රස්‍ය සාකේතකස්‍ය භික්ෂෝරාචාර්ය භදන්තාශ්වඝෝෂස්‍ය මහාකවේර්මහාවාදිනඃ කෘතිරියම්''

ඡන්දසට හෙවත් සංස්කෘත භාෂාවට බුද්ධදේශනා පරිවර්තනය කිරීමට බුදුරජාණන් වහන්සේගේ අනුමැතිය නො ලැබුණි. එහෙත් අශ්වඝෝෂ මාහිමියන් ග්‍රන්ථකරණයෙහි ව්‍යාවෘතවනුයේ සංස්කෘත භාෂා මාධ්‍යයෙනි. බුද්ධචරිත මහාකාව්‍යය මෙන් ම සෞන්දරනන්ද

මහාකාව්‍යය ද තදනුබද්ධ ප්‍රවෘත්ති කථනය උදෙසා ම රචනා වූ කාව්‍ය නිර්මාණ නොවේ. තද් ග්‍රන්ථයන්හි වැඩි අවකාශයක් වෙන් වී ඇත්තේ, ධර්ම සන්නිවේදනයටයි. ධර්මය ඍජු ව සම්ප්‍රේෂණය කිරීමට වඩා, සෞන්දර්යාත්මක ලීලාවක් ඒ සඳහා උපයුක්ත කරගැනීම උන්වහන්සේ භාවිත කළ සාර්ථක උපක්‍රමයකි. තික්ත බෙහෙතක් මධුවෙහි ගල්වා ආතුරයකුට පොවන්නා සේ, සම්බුද්ධ භාෂිතයෙහි ගම්භිරතර දාර්ශනික සිද්ධාන්ත නම් ඖෂධය කවිය නම් මිහිරෙහි ඔබා, කෙලෙස් පරිතාපයෙන් ආතුර ජනයා උදෙසා ලබාදීම උන්වහන්සේගේ මුඛ්‍යාධ්‍යාශය වූහ. එය මනා ව සාර්ථක වූ ක්‍රමයක් විය.

සංස්කෘතය තත්කාලීන සමාජයෙහි කුලීනයන් විසින් ව්‍යවහාර කළ ශුද්ධෝත්කෘෂ්ට භාෂාවක් විය. සමකාලීන භාරතයෙහි බ්‍රාහ්මණ වංශික භාෂාව වූයේ මෙය යි. ක්‍ෂත්‍රිය හා වෛශ්‍ය වර්ණික පුරුෂ පාර්ශ්වයට ද සංස්කෘතය ව්‍යවහාර කිරීමේ අවකාශය තිබිණි. ශුද්‍ර කුලයේ සියලු දෙනාට ම ද සාර්වවර්ණික සර්වස්ත්‍රීන්ට ද එය සපුරා තහනම් විය. බුදුරජාණන්වහන්සේ ස්වකීය ධර්මය ඡන්දසට නැගීමට අනුමැතිය නොදුන්නේ යථෝක්ත භාෂා ප්‍රතිපත්තිය නිසා විය හැකි ය.

කෙසේ වෙතත්, සමස්ත අධ්‍යයන, අධ්‍යාපන ක්‍රියාවලියෙහි ම ඒකාධිකාරිත්වය බ්‍රාහ්මණ වංශිකයන් සතු විය. අශ්වඝෝෂ මාහිමියන්ට ඔවුන් වෙත බුද්ධධර්මයෙහි සාරය සන්නිවේදනය කිරීමේ අත්‍යවශ්‍යතාව තිබූ බව පෙනේ. උගත් තරුණ බ්‍රාහ්මණයෝ උන්වහන්සේගේ පාඨක ඉලක්කය වූහ. ප්‍රේමය, ස්නේහය ආත්මගත සොඳුරු පුවතක් සෞන්දරනන්ද මහාකාව්‍යයෙහි ප්‍රධාන වස්තුවිෂය කරගැනීමෙන් ඒ වග වඩාත් විශද වේ. කෘතියෙහි වැඩි අවකාශයක් ගැඹුරු ධර්ම කරුණු සාකච්ඡා කිරීමට වෙන් කිරීමෙන් ද එය තවදුරටත් ප්‍රත්‍යක්ෂ වේ.

භදන්තාශ්වඝෝෂ මාහිමියන් මහාකාව්‍යකරණයෙහි නියුක්ත වූ සමය වන විට කාව්‍ය විචාර සිද්ධාන්ත ග්‍රන්ථ පවා රචනා වී නො තිබිණි. ක්‍රි:ව: 06 වන ශතවර්ෂයෙන් පසුව දණ්ඩින්, භාමාහාදි කාව්‍යවිචාරකයෝ ස්වකීය කාව්‍යවිචාර සෛද්ධාන්තික කෘති බිහි කළහ. ඔවුහු එම කාව්‍යවිචාර සංකල්ප ඉදිරිපත් කරන ලද්දේ භදන්තාශ්වඝෝෂ මාහිමියන්ගේ සාහිත්‍යයික නිර්මාණ හා රාමායණාදි පූර්වතර කාව්‍යනිර්මාණ පිළිබඳ අධ්‍යයනයෙනි. සෞන්දරනන්ද මහාකාව්‍යයෙහි සර්ග සියල්ල 18 කි. මහාවග්ග හා නිදාන කථා යන බෞද්ධ ග්‍රන්ථද්වයෙහි ම හමුවන සුන්දරී - නන්ද වෘත්තාන්තය මෙහි ප්‍රධාන වස්තු විෂය වේ.

1. කපිලවස්තු පුර වැනුම	2. රාජවර්ණනාව
3. නන්ද කුමරුගේ උත්පත්තිය	4. සුන්දරී-නන්ද ප්‍රේමය
5. නන්ද කුමරුගේ ප්‍රව්‍රජ්‍යාව	6. සුන්දරී විලාපය
7. නන්ද කුමරු ප්‍රව්‍රජ්‍යාව ප්‍රතික්ෂේප කිරීම	8. ස්ත්‍රීන්ගේ චපලගති
9. ප්‍රේමය නිසා ඇතිවන දුක්ගැහැට	10. අප්සරාවන් පෙන්වීම
11. අප්සරාවන් ලැබීමේ ප්‍රාර්ථනාව	12-18 නිර්වාණගාමී ප්‍රතිපදාව

යනාදි ලෙස මේ මහාකාව්‍යයෙහි වස්තු විෂය පෙළ ගස්වා ඇත.

බුද්ධචරිත මහාකාව්‍යයෙහි කර්තෘවරයා ද භදන්තාශ්වඝෝෂ මාහිමියන් ය. ඒ බව, ''**ඉති ශ්‍රී මහා මණ්ඩලේශ්වරමන්ත්‍රාශ්වඝෝෂකෘතෞ ශ්‍රී බුද්ධචරිතමහාකාව්‍යෙ**'' යන උද්ධෘතයෙන් සනාථ වේ. ශ්‍රීමත් ගෞතම ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්සේගේ ජීවනචරිතය

බුද්ධචරිතයෙහි වස්තුවිෂය වේ. චීන හා ටිබෙට් පරිවර්තනයන්හි සර්ග 28ක් දක්නට ලැබේ. එහෙත් දැනට සංස්කෘත භාෂාවෙන් හමු වී ඇති සර්ග සංඛ්‍යාව 13කි. සංස්කෘත පිටපතේ සිද්ධාර්ථ කුමාරෝත්පත්තියෙන් ආරම්භ වී, මාරපරාජය පිළිබඳ විස්තරයෙන් සමාප්ත වේ. බුද්ධචරිතය කාව්‍යාත්මක ව වර්ණනා කිරීම සුකර කාර්යයක් නොවේ. පොදුජන විඥානයෙහි භක්තියට, ශ්‍රද්ධාවට හානියක් නොවන පරිදි, කථා වස්තුව සකස් කර ගත යුතු වේ. එසේ ම, ආලංකාරිකයන් විසින් නිර්දේශිත රීතින් ද උල්ලංඝණය නොකළ යුතු වේ. අශ්වඝෝෂපාදයෝ විචාරපූර්වක යථාර්ථවාදී බුද්ධචරිතාපදානයක් පාඨක මනසෙහි නිර්මාණය කළහ. සැබවින් ම උන්වහන්සේගේ අභිප්‍රාය වූයේ උත්තරීතර මනුෂ්‍ය ගුණෝපලක්ෂිත මිනිසකු වශයෙන් බුද්ධචරිතය ස්ථාපිත කිරීම යි. බුද්ධචරිත මහාකාව්‍යයෙහි සර්ගයෙන් සර්ගය මනාව පරීක්ෂා කිරීමේ දී ඒ වග මනාව පසක් වේ. බුද්ධචරිත මහාකාව්‍යයෙහි යමක, උපමා, රූපක, උත්ප්‍රෙක්ෂාදි අලංකාර හෘදයංගම ලෙස භාවිත කර ඇති අතර, ප්‍රධාන රසය ශාන්ත රසය වේ. අශ්වඝෝෂ මාහිමියන් ප්‍රතිභාපූර්ණ කවියෙකි. නිසර්ගසිද්ධ කාව්‍යකෞශල්‍යය උන්වහන්සේගේ තෙළි තුඩින් නිමවුණු සෑම කවි සිතුවමක ම තැවරී ඇත.

මහාකවි කාලිදාස

මහාකවි කාලිදාස ක්‍රි:ව: 04 හා 05 අතර කාලයෙහි භාරතයේ විසූ චිරප්‍රසිද්ධ කවීන්ද්‍රයෙකි. කාලිදාසයන්ගේ ජන්ම භූමිය හිමාලය අසල උජ්ජයිනී හෝ කාලිංග දේශය බවට මත පවතී. කුමාරසම්භව මහාකාව්‍යයෙහි හිමාලය පිළිබඳ වර්ණනා හා මේඝදූතයෙහි උජ්ජයිනි නුවර ප්‍රේමය පිළිබඳ සඳහන් වීම මෙන් ම, කාලිංග දේශයෙහි අධිරාජයා වූ හේමාංගද පිළිබඳ රඝුවංශයෙහි විශේෂයෙන් වර්ණනා කිරීම ද මේ මතවාදයනට බලපා ඇත. ලක්ෂ්මී ධාර්කල්ල පඬිතුමා, ඔහුගේ The birth place of Kālidāsa (1926), ග්‍රන්ථයෙහි, කාලිදාස මහාකවියා කාශ්මීරයෙහි ඉපිද, දකුණු දිශාවට සංක්‍රමණය වූ බව සඳහන් කර ඇත.

ජනප්‍රවාදයන්ට අනුව කාලිදාස ජීවිතයේ මුල් අවධියෙහි දී අඥානයෙක් විය. ඔහු විසින් විවාහාපේක්ෂිත කාන්තාව ''**අස්ති කශ්චිද්වාග්විශේෂඃ**'' යනුවෙන් ඇසූ පැණයට පිළිතුරු දීමට ඔහු අපොහොසත් විය. පසුව දාසයකු ලෙස කාලිදෙවඟනට දෘඪභක්ත්‍යාදරයෙන් පූජාවිධි පවත්වා ඇගේ ප්‍රසාදයෙන් ඥානවන්තයකු වූ බව ද එක්තරා ජනශ්‍රැතියක එයි. අනතුරුව කාලිදාසයෝ සිය බිරිඳගේ පැණයට පිළිතුරු ලබාදීම් වස් අස්ති යන ශබ්දයෙන් ආරම්භ වන කුමාරසම්භව මහාකාව්‍යය ද, **කශ්චිත්** යන පදයෙන් ආරම්භ වන මේඝදූත නම් ඛණ්ඩකාව්‍යය ද, **වාග්** යන වචනයෙන් ආරම්භ වන රඝුවංශ මහාකාව්‍යය ද රචනා කළහ. පසුව, තවත් ජනප්‍රවාදයකට අනුව, මොහු කුමාරදාස රාජෝ්‍යාදයේ දී ලංකාවට පැමිණ ඇති අතර ලංකාවේ දී ජීවිතක්ෂයට පත් වී ඇත.

සරස්වතී දේවිය, මහාබ්‍රහ්මන්ගේ ධර්මපත්නියයි. සාහිත්‍යය, කලාවන්ට අධිපති දිව්‍යාංගනාවයි. වරක් දණ්ඩී හා කාලිදාස දෙදෙනා සරස්වතී දේවිය හමුවීමට ගොස් ඇත. දෙදෙනාගෙන් කවරෙක් ශ්‍රේෂ්ඨ කවියා වන්නේ දැයි සරස්වතී දෙවඟනගෙන් විමසා ඇත. එවිට ඇය, "**කවීර්දණ්ඩිඃ කවීර්දණ්ඩිඃ කවීර්දණ්ඩිඃ න සංශයඃ**" යනුවෙන් පවසා ඇත.

ඉන් කුපිත වූ කාලිදාස, කවියා දණ්ඩි නම් මා කවරෙක් ද? යනුවෙන් විමසා ඇත. එවිට ඇය "ත්වමෙවාහම්" "ඔබ යනු මම ම යි" යනුවෙන් පිළිතුරු දී ඇත. මෙලෙස කාලිදාසයන් පිළිබඳ ජනප්‍රවාද ගණනාවක් ඇත. ඒ හැම ප්‍රබන්ධයකින් ම ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය ම තහවුරු වීම වැදගත් වේ.

මහාකවි කාලිදාසයන් භාරතයේ විසූ කාලය පිළිබඳ විප්‍රතිවාද පවතී. වික්‍රමාදිත්‍ය රාජ්‍ය සභාවෙහි සිටි නවපණ්ඩිතරත්නයන් අතර පඬිරුවනක් ලෙස මොහු සිටි බවට මත පළ වේ. වික්‍රමාදිත්‍ය නමින් සුවිශේෂ රජකෙනෙකු පිළිබඳ භාරතීය ඉතිහාසය සාක්ෂි නො සපයයි. එහෙත් වික්‍රමාදිත්‍ය යන ගෞරවනාමොපලක්ෂිත රජවරුන් ගණනාවක් වාසය කර ඇත. ඒ අතර II චන්ද්‍රගුප්ත රාජ්‍යොදය (380 - 451 ක්‍රි: ව:) වැදගත් වේ. විලියම්ස් ජොන්ස්, ඒ. බී. කීත්, වාසුදේව්, විෂ්ණු මිරාශි, රාම් ගුප්ත යනාදි පඬිවරු කාලිදාසයන් මේ රජ දවස වාසය කළ බව පිළිගනිති. කාලිදාසයන්ගේ කාලය කුමාරගුප්ත (414 - 455) ස්කන්ධ ගුප්ත (455 - 467) රජ දවස දක්වා, පවතින්නට ඇත. මේ අනුව කාලිදාසයන් ක්‍රි: ව: 4 හා 5 යන ශතවර්ෂයන්හි වාසය කර ඇති බව විශද වේ. මහාකවි කාලිදාසයන්ගේ නමට ග්‍රන්ථ ගණනාවක් පවරා ඇත. එහෙත් මධ්‍යස්ථ වියත්හු පහත සඳහන් ග්‍රන්ථ 07 පමණක් ඔහුගේ ම නිර්මාණ ලෙස පිළිගනිති.

මහාකාව්‍යද්වය	**01. කුමාරසම්භව**
	02. රඝුවංශ
ඛණ්ඩකාව්‍යද්වය	**01. ඍතුසංහාර**
	02. මේඝදූත
දෘශ්‍යකාව්‍යත්‍රය	**01. අභිඥානශාකුන්තල**
	02. මාලවිකාග්නිමිත්‍ර
	03. වික්‍රමෝර්වශී

මහාකවි කාලිදාසයන්ගේ හෘදයග්‍රාහී, රසභාවපූර්ණ, ප්‍රශස්තතම දෘශ්‍යකාව්‍ය ග්‍රන්ථය අභිඥානශාකුන්තලය යි.

'කාව්‍යෙෂු නාටකං රම්‍යං නාටකේෂු ශකුන්තලා
තත්‍රාපිච චතුර්ථො'ඞ්කස්තත්‍ර ශ්ලෝකචතුෂ්ටයම්'

අංක 07 කින් සුසැදි මෙය, මහාභාරතයෙහි ශාකුන්තලෝපාඛ්‍යානය ආශ්‍රයෙන් වස්තු තේමාව සකසා ගෙන ඇත. දුෂ්‍යන්ත මහරජු හා ශකුන්තලා මෙහි ප්‍රධාන කථා නායකයා හා නායිකා දෙපළයි. අග්නිමිත්‍ර රජු හා මාලවිකා අතර ඇතිවෙන ප්‍රේමාවෘත්තාන්තය ප්‍රධාන වස්තු විෂය කරගත් මාලවිකාග්නිමිත්‍රය ද හෘදයංගම දෘශ්‍ය කාව්‍යයකි. අංක 05 කින් සමන්විත මෙය, කාලිදාසයන්ගේ පළමු දෘශ්‍යකාව්‍යය ලෙස පිළිගැනේ. පුරූරවස් රජු හා උර්වශී අප්සරාව අතර ප්‍රේමය වස්තු තේමාව කරගත් වික්‍රමෝර්වශී නාට්‍යයෙහි අංක 05කි. මේ දෘශ්‍යකාව්‍යය අද්භූත රසයෙන් පිරී ඇත.

ඍතුසංහාරය ඛණ්ඩ කාව්‍යයකි. එහි ග්‍රීෂ්ම, වර්ෂා, ශරත්, හේමන්ත, ශිශිර හා වසන්ත යන ඍතු හය වර්ණනා කෙරේ. ශෘංගාර රසයෙන් ආලේපිත මෙය කාලිදාසයන්

සිය ජීවිතයේ මුල් අවධියේ හෙවත් යෞවන සමයෙහි දී රචනා කරන ලද කාව්‍යයක් බව විද්වත් සම්මුතියයි. පෙරදිග සාහිත්‍ය වංශයෙහි හෘදයංගම, සාහිත්‍ය ප්‍රේමීන් විසින් දෘඪාසක්ත බවින් ප්‍රතිගෘහීත අමරණීය විරහගීතය වන්නේ මේඝදූතයයි. සංස්කෘත සාහිත්‍ය ක්ෂේත්‍රයට අභිනව කාව්‍ය සම්ප්‍රදායයක් සම්ප්‍රදානය කරලීමේ උත්තුංග කාර්යයක් වන මෙය ද ඛණ්ඩකාව්‍යයකි. පූර්වමේඝ හා උත්තරමේඝ යැයි මෙහි කොටස් දෙකකි. වැහි වළාවක් අත ස්වකීය පෙම්වතියට හසුනක් යැවීම ප්‍රධාන වස්තු විෂය කොටගෙන **"මන්දාක්‍රාන්තා"** නම් විචිත්‍ර වෘත්තයෙන් රචනා කරන ලද්දකි.

සර්ග 19කින් පරිමිත රඝුවංශය මහාකාව්‍යයකි. දිලීප, රඝු, අජ, දශරථ හා රාම යන සූර්යවංශික රජ පෙළපත පිළිබඳ ව මෙහි වර්ණිනා වේ. **''කාර්තිකෝත්පත්ති''** නමින් ද චිරප්‍රසිද්ධ, කුමාරසම්භව මහාකාව්‍යයෙහි සර්ග 17කි. වීර රසය ප්‍රධාන රසය වන කුමාරසම්භවයෙහි ශිව හා පාර්වතී දෙදෙන ප්‍රධාන කථානායක - නායිකා යුවළයි. සූරී, වල්ලභදේව, බාණ භට්ට, ජයදේව, රාජශේඛර යන විද්වත්හු කාලිදාසයන් මහත් සේ අගය කළහ. '**උපමා කාලිදාසස්‍ය**' යනුවෙන් උපමා යෝජනයෙහි අසහාය සූරයා කාලිදාස බව රාජශේඛර පවසා ඇත.

ඉංග්‍රීසි භාෂාවට පළමුවෙන් පරිවර්තනය කරන ලද දෘශ්‍යකාව්‍ය වනුයේ අභිඥානශාකුන්තලයයි. ඉංග්‍රීසි පරිවර්තනය මත ජර්මන් භාෂාවට මේ නාට්‍ය පරිවර්තනය කර ඇත. **මහාකවිකාලිදාස** (1955), **කවිරත්න කාලිදාස** (1983), නමින් චිත්‍රපට දෙකක් නිෂ්පාදනය කර ඇති අතර **ස්ත්‍රී** නමින් චිත්‍රපටියක් 1961 දී ද නිෂ්පාදනය කර ඇත. මෙය ශකුන්තලා නාට්‍යය තේමා කර ගෙන නිෂ්පාදනය වූවකි.

දණ්ඩීන්

ශ්‍රීමත් දණ්ඩීන් ක්‍රි:ව: 7 හෝ 8 යන ශතවර්ෂ අතර භාරතයෙහි විසූ කෘතහස්ත සාහිත්‍යධරයෙකි. මොහු සිංහවිෂ්ණු නම් පල්ලව රජුගේ කාව්‍ය සභාවෙහි සේවය කළ **දාමෝදර** කෙනෙකුගේ මී මුණුබුරෙකි. විදර්භ දේශය මොහුගේ ජන්ම භූමිය බව ඩී.කේ. ගුප්තා පවසයි. **දාමෝදර, කාඤ්චී** සමග විවාහ විය. ඔවුනට දරුවන් තිදෙනෙක් වූ අතර මධ්‍යමයා **මනෝරථ** විය. මනෝරථට පුත්‍රයන් සිව්දෙනෙක් සිටි අතර බාල ම දරුවා **වීරදත්ත** විය. ඔහු **ගෞරී** නම් බැමිණිය සමග විවාහ වූ අතර දියණිවරුන්ට අමතර ව ඔවුනට ලැබුණු පිරිමි දරුවා දණ්ඩින් විය. දණ්ඩින්ට අවුරුදු හතක් වූ කාලයෙහි මව මිය ගිය අතර ඊට ටික කලකට පසු පියා ද මියගොස් ඇත.

රාජශේඛර (920 ක්‍රි:ව:) දණ්ඩීන්ගේ කාව්‍ය කුශලතාව - **දණ්ඩිනඃ පදලාලිත්‍යම්** - ප්‍රශංසාභිමුඛ ව අගය කර ඇත. ඔහු **කාව්‍යාදර්ශ** නම් කාව්‍ය විචාර ග්‍රන්ථය හා **දශකුමාරචරිත** නම් ගද්‍යකාව්‍ය රචනා කර ඇත. කුමාරවරුන් දශ දෙනෙකුගේ වීර ක්‍රියා හා දේශාටන ප්‍රවෘත්ති දශකුමාරචරිතයෙහි වර්ණිතය. ගණිකාවන්, මංපහරන්නන්, සොරුන්, යක්ෂයන්, ප්‍රේතයන්, සූදු කරුවන් ආදී විවිධ චරිත මෙන් ම මිනීමැරුම්, යුධසංග්‍රාම ද මෙහි අන්තර්ගත වේ. **රාජවාහන, සෝමදත්ත, පුෂ්පෝද්භව, අපහාරවර්මන්, උපහාරවර්මන්, අර්ථපාල, ප්‍රමති, මිත්‍රගුප්ත, මන්ත්‍රගුප්ත, විශ්‍රුත** යනු කුමාරවරු දශදෙනා ය. **රාජවාහන** හා **අවන්තිසුන්දරී** ප්‍රධාන කථා නායක-නායිකා දෙපළ යි. මෙහි පරිච්ඡේද **උච්ඡ්වාස** ලෙස නම් කර ඇත. පූර්වපීඨිකා, දශකුමාර චරිත හා උත්තරපීඨිකා වශයෙන් ද කොටස් තුනකි.

ශ්‍රීමත් දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශය සංස්කෘත කාව්‍යවිචාර ක්ෂේත්‍රය නියෝජනය කරන වැදගත් ම විචාර ග්‍රන්ථයක් ලෙස සැලකිය හැක. **කාව්‍යය පිළිබඳ කැඩපත** යනු මෙහි අර්ථයයි. එහි ප්‍රධාන පරිච්ඡේද තුනකි. අර්ථාලංකාර හා ශබ්දාලංකාර පිළිබඳ සෝදාහරණ විවරණයක් මෙහි අන්තර්ගත ය. ශ්ලේශ, ප්‍රසාද, සමතා යනාදි දශගුණ හඳුන්වා දීම ද කතුවරයා විසින් සිදුකර ඇත. ගෞඩී, වෛදර්භී ආදි රීති පිළිබඳ මනා විශ්ලේෂණයක් ද මෙහි ඇතුළත් වේ. දණ්ඩීන් වඩා රුචිකත්වයක් දක්වා ඇත්තේ වෛදර්භී රීතියට ය. **සියබස්ලකර** නම් සිංහල කාව්‍ය විචාර ග්‍රන්ථයට ද **සුබෝධාලංකාර** නම් පාලි කාව්‍යවිචාර ග්‍රන්ථයට ද ගුරු අත්පොත වී ඇත්තේ කාව්‍යාදර්ශය යි. භට්ටි කවියාගේ රාවණවධ මහාකාව්‍යයෙහි කාව්‍යාදශීයෙහි බලපෑම තදින් කැපී පෙනේ.

बहुविघ्नास्तु सदा कल्याणसिद्धयः।

යහපත සිදු කිරීමේ දී බොහෝ උවදුරු ඇත.

बुद्धिर्नाम च सर्वत्र मुख्यं मित्रं न पौरुषम्।

පෞරුෂයට වඩා බුද්ධිය සියලු තැන ප්‍රධාන මිතුරා ය.

भवितव्यं भवत्येव कर्मणामीदृशी गतिः।

සිදුවිය යුත්ත සිදුවේ. කර්මයන්ගේ ස්වභාවය එබඳු ය.

अमृतं संस्कृतं मित्र! सरसं सरलं वचः।
भाषासु महनीयं यद् ज्ञानविज्ञानपोषकम्॥